# චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී රීතීන්

## චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ අධ්‍යයනය: සන්නද්ධ ගැටුම් තුළ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම සහ අවබෝධ කර ගැනීම සඳහා වන දායකත්වයක්

ICRC

ජීන් මාරි හෙන්කර්ට්ස් විසින් 2005 වසරේ මාර්තු මස පළ කරනු ලැබූ අන්තර්ජාතික රතු කුරුස ශාස්ත්‍රීය සඟරාවේ, 87 වන වෙළුමේ, 857 වන කලාපය වෙනුවෙන් රචිත "චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ අධ්‍යයනය : සන්නද්ධ ගැටුම් තුළ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම සහ අවබෝධ කර ගැනීම සඳහා වන දායකත්වයක්" නමැති ශාස්ත්‍රීය ලිපිය සහ අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතින් පරිවර්තනය කරනු ලැබුයේ කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ, පොදු හා අන්තර්ජාතික අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී, නීතිය පිළිබඳ දර්ශන ශූරී, නීතිවේදි (ගෞරව) නීතිඥ වසන්තා සෙනෙවිරත්න විසිනි.

# චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ අධ්‍යයනය : සන්නද්ධ ගැටුම් සමය තුළ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම සහ අවබෝධ කර ගැනීම සඳහා වන දායකත්වයක්

**ජීන් - මාරි හෙන්කර්ට්ස්***

ජීන් - මාරි හෙන්කර්ට්ස් අන්තර්ජාතික රතු කුරුස සංවිධානයේ නීති අංශයේ නීති උපදේශකවරයෙක් වන අතර චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ICRC ව්‍යාපෘතියේ ප්‍රධානියාද වූයේය ඔහු මෑතකදී *ලුවිස් ඩොස්වෝල්ඩ් බෙක්* සමග *කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය* විසින් ප්‍රකාශයට පත්කරන ලද චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ වෙළුම් දෙකකින් සමන්විත කෘතිය සංස්කරණය කළේය

## සාරාංශය

මෙම ලිපිය මගින්, රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි ඉල්ලීම ප්‍රකාරව අන්තර්ජාතික රතු කුරුස සංවිධානය (ICRC) මගින් මෑත කාලයේදී භාර ගන්නා ලද චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ ව වන අධ්‍යයනයෙහි තාර්කික පදනම විග්‍රහ කරනු ලබයි. ඒ මගින්, මෙම අධ්‍යයනය සඳහා භාවිත කරන ලද අධ්‍යයන විධි ක්‍රමය සහ මෙම අධ්‍යයනය සංවිධානය කරන ලද ආකාරය පිළිබඳ ව විස්තර කරන අතර ඇතැම් ප්‍රධාන සොයා ගැනීම් සාරාංශ ගත කර දක්වනු ලබයි. කෙසේ වුවත්, එමගින් ඉහත සඳහන් කරන ලද සොයා ගැනීම් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් හෝ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කර නොමැත.

* *කර්තෘවරයා, මෙම ලිපිය සැකසීමේදී ලබා දුන් සහයෝගය වෙනුවෙන් එරික් මොන්ගිලාර්ඩ් මහතාට මෙන්ම ලුවිස් ඩොස්වෝල්ඩ් සහ නීති අංශයේ මිතුරන්ට ඔවුන්ගේ බුද්ධි ගෝචර සහ ප්‍රයෝජනවත් විවේචනයන් වෙනුවෙන් ස්තුති කරනු ලබයි. මෙම ලිපියේ ඇතුළත් මතයන් කාර්තෘගේ වන අතර ඒවා අවශ්‍යයෙන්ම අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ ඒවා නොවන බව සැලකිය යුතුය.*

## හැඳින්වීම

වර්ෂ 1949 දී ජිනිවා සම්මුතීන් පිළිගැනීමේ සිට හෝ පසුගිය වර්ෂ 50 පුරාවට ලොව සියලු මහද්වීපයන්ට බලපෑම් කරන ලද, බිහිසුණු යුද්ධයන් ගණනාවක් මානව වර්ගයා විසින් අත්දකින ලදී. මෙකී කාලය අතරතුර, ජිනිවා සම්මුතීන් හතර සහ ඒවාට 1977 වර්ෂයේ දී සම්මත කර ගන්නා ලද අතිරේක සන්ධානයන් විසින් යුද ගැටුම්වලට සෘජුව සහභාගි නොවන පුද්ගලයන්ට සහ තවදුරටත් සෘජුව යුද ගැටුම්වලට සහභාගී වීමෙන් වැළකී සිටින පුද්ගලයන්ට (තුවාලකරුවන්, රෝගීන්, මුහුදුබත් වූවන්, යුද්ධය සබැඳි හේතූන් නිසා තම නිදහස අහිමිකර ගත් පුද්ගලයන්ට සහ සිවිල් වැසියන්ට) නෛතික රැකවරණය සපයන ලදී. එසේ වුවද, මෙකී අන්තර්ජාතික මානුෂවාදී නීතියට වඩා හොඳ ගරු කිරීමක් ලබා දුන්නේ නම්, වළක්වා ගත හැකිව තිබූ, නමුත් එසේ නොකරමින් මෙකී සම්මුතීන් අවස්ථා ගණනාවක දී උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලය ලෙස පීඩාවට පත්වීම් සහ පුද්ගල මරණ බහුල ලෙස සිදුවනු දක්නට ලැබිණි.

මෙලෙස අන්තර්ජාතික මානුෂවාදී නීතිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් පවතින පොදු මතය නම්, එම උල්ලංඝනයන් පැන නැගෙන්නේ එම රීතීන්ට ගරු කිරීමට පවත්නා නොකැමැත්ත මතින් වීම, ඒවා බලාත්මක කිරීමට පවත්නා ක්‍රමෝපායන්ගේ අප්‍රමාණවත් බව, එම රීතීන් ඇතැම් අවස්ථාපිත සාධක වෙත අදාළ කර ගැනීමේදී උද්ගත වන අවිනිශ්චිතතාවයන් සහ එම රීතීන් පිළිබඳ ව දේශපාලන නායකයින්ගේ, අණ දෙන නිලධාරීන්ගේ, යුද සෙබළුන්ගේ හා පොදු මහජනතාවගේ දැනුවත් භාවයෙහි පවත්නා ඌණතාවයන් හේතුවෙන් මිස මෙම රීතීන්හි අප්‍රමාණවත් භාවය නිසා නොවන බවයි.

වර්ෂ 1993 අගෝස්තු, සැප්තැම්බර් කාලය තුළ ජිනිවා නුවර දී කැඳවන ලද, යුද්ධය නිසා හානියට පත් වූවන් ආරක්ෂා කර ගැනීම පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී, අන්තර්ජාතික මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් වළක්වා ගැනීමට ගත යුතු විශේෂිත ක්‍රියා මාර්ග පිළිබඳ ව සාකච්ඡා කරන ලද නමුත්, නව සම්මුති ප්‍රතිපාදනයන් සම්මත කර ගැනීම පිළිබඳ ව යෝජනා නොවීය. ඒ වෙනුවට මෙම සමුළුව විසින් පොදු එකඟතාවයෙන් පිළිගත්, එම සමුළුවේ අවසාන ප්‍රකාශනය මගින් "අන්තර්ජාතික මානුෂවාදී නීතිය වඩා ඵලදායි ලෙස බලාත්මක කිරීමේ අවශ්‍යතාවය" යලි තහවුරු කරන ලද අතර අන්තර්ජාතික මානුෂවාදී නීතියට පූර්ණ ගරු කිරීමක් හා අනුගත වීමක් වර්ධනය කිරීම පිණිස වන ප්‍රායෝගික ක්‍රමයන් පිළිබඳ අධ්‍යයනය කිරීම පිණිස අන්තර් ආණ්ඩු විශේෂඥ කණ්ඩායමක් කැඳවීමට ද, එම අධ්‍යයනයන්හි කරුණු ඇතුළත් කර රාජ්‍ය පාර්ශව වෙත භාරදීමට සහ රතු කුරුස සහ රතු අඩසඳ

සංවිධානයේ අන්තර්ජාතික සම්මන්ත්‍රණයන්හි මිළඟට එළඹෙන සැසිවාරයට ඉදිරිපත් කිරීම පිණිස වාර්තාවක් සකස් කිරීමට ද ස්විස් රජයට ආරාධනා කරන ලදී [1].

යුද්ධයෙන් විපතට පත් වූවන් ආරක්‍ෂා කිරීම පිළිබඳ අන්තර් ආණ්ඩු විශේෂඥ කණ්ඩායම 1995 ජනවාරි මස ජිනිවාහි දී රැස් වූ අතර, එහිදී අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීම ඉහළ නැංවීම අරමුණු කරගත්, නිර්දේශ මාලාවක් පිළිගත් අතර, විශේෂයෙන්ම වඩා හොඳ දැනුවත්භාවයක් තහවුරු කරන සහ වඩා ඵලදායි ලෙස නීතිය බලාත්මක කිරීම තහවුරු කරන නිවාරණ ක්‍රම වේදයන් පිළිබඳ නිර්දේශ ඒ අතර විය. අන්තර් ආණ්ඩු විශේෂඥ කණ්ඩායමේ දෙවන නිර්දේශය අනුව, විවිධ භූගෝලීය කලාප සහ විවිධ නීති පද්ධතීන් නියෝජනය කරන අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ විශේෂඥයන්ගේ සහාය ඇතිව සහ ආණ්ඩු හා අන්තර්ජාතික සංවිධානයන් සමග සාකච්ඡා පවත්වමින්, අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතින් පිළිබඳ වාර්තාවක් සකස් කිරීමට සහ එම වාර්තාව රාජ්‍යයන් හා සුදුසු අන්තර්ජාතික සංවිධාන අතර බෙදා දීම සඳහා අන්තර්ජාතික රතු කුරුස සංවිධානය වෙත ආරාධනා කිරීමට යෝජනා කරන ලදී[2].

වර්ෂ 1995 දෙසැම්බර් මස රතු කුරුස හා රතු අඩසඳ සංවිධානයේ 26 වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය මෙම නිර්දේශය අනුමත කළ අතර අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතින් පිළිබඳ වාර්තාවක් සකස් කිරීම නිල වශයෙන් අන්තර්ජාතික රතු කුරුස සංවිධානය වෙත භාර දෙන ලදී[3]. වසර දහයකට පමණ ආසන්න කාලයකට පසු 2005 වසරේ දී, පුළුල් පර්යේෂණයකට සහ විශේෂඥයින් සමග පැවති පුළුල් පරාසයක විහිදී ගිය සාකච්ඡාවන්ගෙන් අනතුරුව, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය පිළිබඳ අධ්‍යයනයක් ලෙස හඳුන්වනු ලබන මෙම වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී[4].

---

[1] *1993 අගෝස්තු 30 සිට සැප්තැම්බර් 01 දක්වා ජිනිවා හී පැවැත්වූ යුද වින්දිතයන් සුරැකීම පිළිබඳ අන්තර්ජාතික සමුළුව. අවසන් ප්‍රකාශනය, අන්තර්ජාතික රතු කුරුස ශාස්ත්‍රිය සඟරාව, නො. 296, 1993, පි. 381*

[2] *යුද වින්දිතයන් සුරැකීම සඳහා වන අන්තර් ආණ්ඩු විශේෂඥ රැස්වීම, 1995 ජනවාරි 23 -27 දක්වා ජිනිවා හිදි, දෙවන නිර්දේශය, අන්තර්ජාතික රතු කුරුස ශාස්ත්‍රිය සඟරාව, නො. 310, 1996, පි. 84*

[3] *අන්තර්ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ 26 වන අන්තර්ජාතික සම්මේලනය, 1995 දෙසැම්බර් 3-7 ජිනිවාහි, පළමු වන යෝජනා සම්මතය, අන්තර්ජාතික මානුෂවාදී නීතිය : නීතියේ සිට ක්‍රියාත්මක වීම දක්වා; යුද වින්දිතයන් සුරැකීම පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ අනුගමනය කිරීම් පිළිබඳ වාර්තාව, අන්තර්ජාතික රතු කුරුස ශාස්ත්‍රිය සඟරාව, නො. 310, 1996, පි. 58*

[4] *ජීන් මාරි හැන්කර්ට්ස් සහ ලුවිස් ඩොස්වල්ඩ්, අන්තර්ජාතික රතු කුරුස ශාස්ත්‍රිය සඟරාව, වෙළුම් 2. 1 වන වෙළුම - රීතින්, 2 වන වෙළුම. පරිචය (කොටස් 2යි), කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 2005*

## අරමුණ

චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ අධ්‍යයනයෙහි අරමුණ වූයේ, අන්තර්ජාතික සම්මුති නීතියන්හි අදාළත්වය හා සම්බන්ධව පැවති ඇතැම් ගැටලුවලට විසඳුමක් සොයා ගැනීමයි. මෙම සම්මුති නීතිය හොඳින් වර්ධනය වූවක් වන අතර ඒ මගින් යුද සමය තුළ පුද්ගල පරාසයන් ගණනාවකට ආරක්ෂාව සපයන අතර ම යුද්ධයේ දී භාවිත කිරීමට අවසර ලැබෙන යුද උපක්‍රම සහ ආකාර සීමා කරමින් යුදවාදයේ බොහෝ පැතිකඩයන් ආවරණය කරනු ලබයි. තවද, ජිනීවා සම්මුතීන් සහ ඒවාට අදාළ අතිරේක සන්ධානයන් මගින් යුද්ධයට සෘජුව හෝ තවදුරටත් සහභාගී නොවන පුද්ගලයන් ආරක්ෂා කිරීමෙහි ලා ඉතා පුළුල් නීති මාලාවක් සපයනු ලබයි. යුද උපායන් හා විධික්‍රමවලට අදාළ සම්මුතිමය නීති රෙගුලාසිවල ඉතිහාසය 1868 ශාන්ත පීටර්ස්බර්ග් ප්‍රකාශනය, 1899 සහ 1907 හේග් රෙගුලාසි සහ 1925 විෂ වායු පිළිබඳ ජිනීවා  සන්ධානය දක්වා දිව යන අතර, මේ සම්බන්ධයෙන් මෑත කාලීනව සාකච්ඡා වු සම්මුතීන් ලෙස 1972 ජීව විද්‍යාත්මක අවි පිළිබඳ සම්මුතිය, 1977 අතිරේක සන්ධානය, 1980 දී ඇති කරගත් ඇතැම් සම්ප්‍රදායික අවි පිළිබඳ සම්මුතිය හා එහි අතිරේක සන්ධාන පහ, 1993 රසායනික අවි පිළිබඳ සම්මුතිය සහ 1997 පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීම පිළිබඳ ඔටාවා සම්මුතිය පෙන්වා දිය හැකිය.  තවද, 1954 හේග් සම්මුතිය හා එයට අදාළ අතිරේක සන්ධාන ද්විත්වය මගින් යුද ගැටුම් අවස්ථාවක සංස්කෘතිකමය දේපළ ආරක්ෂා කර ගැනීමට අදාළ රීතින් සවිස්තරාත්මකව ඇතුළත් කරන ලදී. එසේම, 1998 දී ඇතිකර ගත් අන්තර්ජාතික අපරාධ අධිකරණය පිළිබඳ සම්මුතියේ අනෙකුත් කරුණු අතර, මෙකී අධිකරණයේ අධිකරණ බලය යටතට පැමිණෙන යුද අපරාධ පිළිබඳ ලැයිස්තුවක් ද අන්තර්ගත කර තිබෙනු දක්නට ලැබේ.

කෙසේ වුවද, මෙකී සම්මුතීන් වත්මන් යුද ගැටුම් වාතාවරණයන්ට අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රබල බාධාවන් දෙකක් පවතින අතර එමගින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ අධ්‍යයනයක අවශ්‍යතාවය හා එහි ප්‍රයෝජනවත් භාවය පිළිබඳ පැහැදිලි කරනු ලබයි. පළමුව මෙම සම්මුතීන් අදාළ වන්නේ එම සම්මුති සපථ (Ratify) කරනා ලද රාජ්‍ය පාර්ශවයන් විෂයෙහිලා පමණකි. ඒ අනුව යුද ගැටුම්වලට සම්බන්ධ රාජ්‍යය විසින් සපථ කර තිබෙන්නේ කවර සම්මුතීන් ද යන්න අනුව ඒ ඒ යුද ගැටුම් විෂයෙහි අදාළ වන අන්තර්ජාතික මානුෂවාදී සම්මුති නීතින් විවිධ වන බව දක්නට ලැබේ. 1949 දී ඇති කරගත් ජිනීවා සම්මුතීන් හතර විශ්වීය වශයෙන් අපරානුමත කර තිබුණ ද, අන්තර්ජාතික මානුෂවාදී නීතියේ සෙසු සම්මුතීන්හි

මෙබඳු විශ්වීය වලංගුභාවයක් නොපවතියි. එයට උදාහරණ ලෙස අතිරේක සන්ධාන පෙන්වා දිය හැකිය. එනම්, පළමු අතිරේක සන්ධානය රාජ්‍යයන් 160කට අධික සංඛ්‍යාවක් විසින් සපථ කරනු ලැබුව ද, අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධ රාජ්‍ය ගණනාවක් එහි පාර්ශවයන් නොවීම හේතු කර ගෙන අද වන විට එහි සාර්ථකත්වය සීමා වී ඇති බව දැක්විය හැකිය. එසේම, දෙවන අතිරේක සන්ධානය රාජ්‍යයන් 160කට ආසන්න සංඛ්‍යාවක් විසින් අපරානුමත කර තිබුණ ද, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් හා සම්බන්ධ වී සිටින රාජ්‍ය ගණනාවක් විසින් එය සපථ කර නොතිබීම මත, එහි සාර්ථකත්වය ද සීමා වී ඇත. ඉහත සඳහන් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් අදාළ වන එකම අන්තර්ජාතික මානුෂවාදී සම්මුති නීති ප්‍රතිපාදනය ලෙස බොහෝ විට ශේෂ වන්නේ ජිනීවා සම්මුති හතරටම පොදු 3 වන වගන්තිය පමණි. මෙම අධ්‍යයනයෙහි පළමු අරමුණ වන්නේ කවර අන්තර්ජාතික මානුෂවාදී රීතින් ප්‍රමාණයක් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි කොටසක් වන්නේ ද යන්නත්, එබැවින් එම රීතින් හෝ එයට සමාන රීතින් අඩංගු සම්මුතීන්, සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධ පාර්ශවයන් විසින් සපථ කර තිබීම හෝ නොතිබීම පිළිබඳ ව නොසලකා, එකී පාර්ශවයන් විෂයයෙහි එම චාරිත්‍රානුකූල රීතින් අදාළ වන්නේ ද යන්නත් නිශ්චය කර ගැනීමයි.

දෙවනුව වත්මන් සන්නද්ධ ගැටුම් විශාල ප්‍රමාණයක්, එනම් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් මානුෂවාදී සම්මුති නීතිය මගින් ප්‍රමාණවත් පරිදි පාලනය කරනු නොලබයි. මන්දයත්, අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලට සාපේක්ෂව අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් ඉතා සීමිත සම්මුතිමය රීතීන් කිහිපයක් මගින් පමණක් පාලනය වන බැවිනි. මෙකී අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් අදාළ වන ඉතා සීමිත සම්මුතීන්වලට නිදසුන් ලෙස (සංශෝධිත) ඇතැම් සාම්ප්‍රදායික ආයුධ සම්බන්ධ සම්මුතිය, අන්තර්ජාතික අපරාධ අධිකරණය පිළිබඳ ව්‍යවස්ථාව, පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීම පිළිබඳ ඔටාවා සම්මුතිය, රසායනික අවි පිළිබඳ සම්මුතිය, සංස්කෘතිමය දේපළ සුරක්ෂිත කිරීම පිළිබඳ හේග් සම්මුතිය හා එයට අදාළ දෙවන සන්ධානය සහ ඉහත සඳහන් කරන ලද දෙවන අතිරේක සන්ධානය සහ ජිනීවා සම්මුතීන් හතරටම පොදු වූ 3 වන ව්‍යවස්ථාව පෙන්වා දිය හැකිය. ජිනීවා සම්මුතීන් හතරටම පොදු වූ 3 වන ව්‍යවස්ථාව මේ සම්බන්ධයෙන් මූලික වැදගත්කමක් දැරුවද, එමගින් සපයනු ලබන්නේ අවම ප්‍රමිතීන් පිළිබඳ ප්‍රතිපත්තිමය රාමුවක් පමණි. දෙවන අතිරේක සන්ධානය විසින් පොදු 3 වන වගන්තියට ප්‍රයෝජනවත් ඌණ පූරණයක් සැපයුව ද, එය අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සම්බන්ධ ජිනීවා සම්මුතීන් හතර සහ පළමු අතිරේක සන්ධානය විසින් සපයනු ලබන තරම් සවිස්තර

රීතින් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් තවමත් සපයනු නොලබයි.

පළමු අතිරේක සන්ධානය වගන්ති 80කට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන අතර, දෙවන අතිරේක සන්ධානය තුළ පවතින්නේ හුදෙක් හරයාත්මක වගන්ති 15ක් පමණි. හුදෙක් පවත්නා වගන්ති සංඛ්‍යාව පමණක් විමසා සමස්තය පිළිබඳ ව නිගමනයකට එළඹිය නොහැකි වුවද, සවිස්තරාත්මක රීතින් හා නිර්වචනයන් පිළිබඳ ව විශේෂයෙන් විමසීමේදී අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් පාලනය කරන සම්මුතිමය රීතීන් අතර ඉතා පැහැදිලි විෂමතාවයක් පවතින බව පෙනෙන්නට තිබේ. එමනිසා මෙම අධ්‍යයනයෙහි දෙවන ප්‍රධාන අරමුණ වන්නේ, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය මගින්, සම්මුතිමය නීතින්ට සාපේක්ෂව මෙකී අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධව වැඩි විස්තරාත්මක බවකින් යුතු ප්‍රතිපාදන සම්පාදනය කරනවාද යන්න නිශ්චය කර ගැනීමත්, එසේ වන්නේ නම් එය කොතෙක් දුරකට ද යන්න නිශ්චය කර ගැනීමත් ය.

## පර්යේෂණ ක්‍රමවේදය

අන්තර්ජාතික යුක්ති අධිකරණය පිළිබඳ ව්‍යවස්ථාව මගින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය විග්‍රහ කරනු ලබන්නේ "නීතිය වශයෙන් පිළිගනු ලබන පොදු පරිචයක්" වශයෙනි[5]. මෙකී චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි රීතින්ගේ පැවැත්ම සඳහා ප්‍රධාන මූලිකාංග දෙකක් පැවතීම අවශ්‍ය බවට පුළුල් එකඟතාවයක් පවයි. එනම් රාජ්‍ය පරිචය (usus) සහ නීතිය පිළිබඳ කරුණක් ලෙස, එම රීතියෙහි ස්වභාවය මත පදනම් වූ එම රීතිය තහනම් බවට හෝ අවසර සහිත බවට වන විශ්වාසය හෙවත් මානසික අංගය (opinio juris sive necessitatis) ලෙස එකී මූලිකාංග දෙක පෙන්වා දිය හැකිය.

මහාද්වීපික තටකය (continental shelf) පිළිබඳ නඩුවේ දී අන්තර්ජාතික යුක්ති අධිකරණය ප්‍රකාශ කළේ "සැබැවින්ම, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි පැවැත්ම ප්‍රත්‍යක්ෂකර ගැනීම පිණිස මූලික වශයෙන් සත්‍ය වූ රාජ්‍ය පරිචය සහ රාජ්‍යයන්ගේ මානසික බැඳීම් සහගත භාවය නමැති අංගය පිළිබඳ ව විමසා බැලිම අත්‍යවශ්‍ය සහ අවිවාදිත" බවයි[6]. මෙම මූලිකාංග දෙකෙහි නිශ්චිත අර්ථය හා අන්තර්ගතය සම්බන්ධ කරුණු බොහෝ ශාස්ත්‍රීය ලිපිවල මාතෘකාව බවට පත් වී තිබේ. මේ සම්බන්ධව පොදු චාරිත්‍රානුකූල

---

[5] *අන්තර්ජාතික යුක්ති අධිකරණ ව්‍යවස්ථාව, 38 (1) (ආ) ව්‍යවස්ථාව*

[6] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, Continental Shelf Case (Libyan Arab Jamahiriya v. Malta), නඩු තීරණය, 1985 ජුනි 3, අන්තර් ජාතික යුක්ති අධිකරණ වාර්තාව, 1985, පි. 29-30*

අන්තර්ජාතික නීතියක් පවතිනවාද යන්න නිශ්චය කර ගැනීම සඳහා වූ මෙම අධ්‍යයනයේදී යොදා ගනු ලැබුවේ විශේෂයෙන් උතුරු මුහුදේ මහාද්වීපික තටකය පිළිබඳ තීරණයේදී අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් හඳුන්වා දෙනු ලැබූ ශාස්ත්‍රීය ප්‍රවේශයයි[7].

## රාජ්‍ය පරිචය/ක්‍රියාකලාපය

රාජ්‍ය පරිචය කෝණ දෙකකින් විමසා බැලිය යුතුය. ඉන් පළමුවැන්න නම් අන්තර්ජාතික චාරිත්‍රානුකූල නීතියක් නිර්මාණය වීම සඳහා දායකත්වය සපයනු ලබන්නේ කවරාකාර රාජ්‍ය පරිචයක් ද යන්න සොයා බැලීම (රාජ්‍ය පරිචය තෝරා ගැනීම) සහ දෙවැන්න නම් මෙම රාජ්‍ය පරිචය මගින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි රීතියක් ස්ථාපනය කරනු ලබයි ද යන්න සොයා බැලීමයි.

### *රාජ්‍ය පරිචය තෝරා ගැනීම*

රාජ්‍යයක භෞතික සහ වාචික යන දෙවර්ගයේම ක්‍රියාවන් අන්තර්ජාතික චාරිත්‍රානුකූල නීතියක් නිර්මාණය කිරීම සඳහා දායක වන පරිචය ස්ථාපනය කරයි. භෞතික ක්‍රියාවන්ට උදාහරණ ලෙස, යුද පෙරමුණේ හැසිරීම, ඇතැම් අවි ආයුධ භාවිත කිරීම සහ විවිධ පුද්ගල කණ්ඩායම්වලට සැලකුම් කරන ආකාරය පෙන්වා දිය හැකි අතර, වාචික ක්‍රියාවලට උදාහරණ ලෙස යුද අත්පොත්, ජාතික අණ පනත්, ජාතික වශයෙන් දී ඇති නඩු තීරණ, සන්නද්ධ හා ආරක්ෂක බලකායන්ට ලබා දෙන උපදෙස්, යුද සමය තුළ කරන නිල නිවේදන, රාජ්‍යතාන්ත්‍රික විරෝධතා, නිල නීති උපදේශකයන්ගේ මත, සම්මුති කෙටුම්පත් පිළිබඳ ආණ්ඩුවල විවේචන හෝ අදහස්, විධායක තීරණ හෝ රෙගුලාසි, අන්තර්ජාතික අධිකරණ පර්ෂද ඉදිරියේ වන ඉල්ලීම්, අන්තර්ජාතික තලය තුළ ඉදිරිපත් වන ප්‍රකාශ සහ අන්තර්ජාතික සංවිධාන විසින් සම්මත කරනු ලබන යෝජනා සම්මත සම්බන්ධයෙන් ආණ්ඩුවල ස්ථාවරයන් යනාදිය පෙන්වා දිය හැකිය. චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය බිහි කිරීමෙහිලා රාජ්‍යයන්ගේ විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණයන්හි ක්‍රියාවන් දායක වන බව ඉහත ලැයිස්තුව පෙන්වා දෙයි.

අන්තර්ජාතික සංවිධාන විසින් ඇති කරගත් යෝජනා සම්මතයන් පිළිගැනීම සහ ඒ පිළිබඳ කරනු ලබන සාකච්ඡා, ඒවාට ඡන්දය ප්‍රකාශ කිරීමේදී කරනු ලබන පැහැදිලි කිරීම් ආදිය රාජ්‍යයන් සම්බන්ධ වන ක්‍රියාකාරකම් වේ.

---

[7] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, North Sea Continental Shelf Case, නඩු තීරණය, 1969 පෙබරවාරි 20, අන්තර් ජාතික යුක්ති අධිකරණ වාර්තාව, 1969, පි. 3*

ඇතැම් සීමිත ව්‍යතිරේඛයන්ට යටත්ව, සාමාන්‍යයෙන් යෝජනා සම්මතයන්, එනයින්ම බැඳීම් සහගත නොවන බව හඳුනාගෙන ඇති අතර, එනිසා යම් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියක් නිර්මාණය කිරීමෙහිලා යම් නිශ්චිත යෝජනා සම්මතයක දායකත්වය තක්සේරු කිරීම එහි අන්තර්ගතය, එය පිළිගෙන තිබෙන ප්‍රමාණය සහ අදාළ රාජ්‍ය පරිචය සම්බන්ධයෙන් එහි පවත්නා අනුරූපභාවය මත රඳා පවතින බව පෙන්වා දිය හැකිය[8]. ඒ අනුව රාජ්‍ය පාර්ශවයන්ගෙන් යෝජනා සම්මතයට ලැබෙන සහාය වැඩි වන තරමට චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියක් නිර්මාණය කිරීම සඳහා එමගින් සැපයෙන දායකත්වය ද වැඩි වන බව පෙන්වා දිය හැකිය[9].

අන්තර්ජාතික අධිකරණයන්හි තීරණ අන්තර්ජාතික නීතිය පිළිබඳ ද්විතීය මූලාශ්‍ර වුවද ඒවා රාජ්‍ය පරිචයන් ස්ථාපනය කරනු නොලබයි. එයට හේතුව අන්තර්ජාතික අධිකරණයන්, ජාතික අධිකරණයන් මෙන් රාජ්‍යයන්හි කොටසක් ලෙස නොසැලකීමයි. එසේ වුවද, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියක් පවතින බවට අන්තර්ජාතික අධිකරණයක් විසින් කරන සොයා ගැනීමක්, එසේ වන බවට පොළඹවන සුළු සාක්ෂි ස්ථාපනය කරන බැවින් අන්තර්ජාතික අධිකරණයන්හි තීරණ වැදගත් වේ. මීට අමතරව අන්තර්ජාතික අධිකරණ තීරණයන්හි පවතින අනුගම්‍ය වටිනාකම හේතුවෙන්, රාජ්‍යයන්ගේ හා අන්තර්ජාතික සංවිධානයන්ගේ පසුකාලීන පරිචයන්ට බලපෑම් සිදු කරන ආකාරයේ තීරණ හරහ චාරිත්‍රානුකූල අන්තර්ජාතික රීතියක් බිහි වීමට දායකත්වය ලබාදීමට අන්තර්ජාතික අධිකරණයන්ට හැකියාව ඇත.

එමෙන්ම, අවිගත් විරුද්ධවාදී කණ්ඩායම් විසින් පිළිපදිනු ලබන චර්යා සංග්‍රහයන්, අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ඇතැම් රීතින් පිළිපැදීම සඳහා කරනු ලබන කැපවීම් සහ කරනු ලබන වෙනත් ප්‍රකාශයන් එබඳු රාජ්‍ය පරිචයන් ස්ථාපනය කරනු නොලබයි. එවැනි පරිචයන් හරහා අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී ඇතැම් අන්තර්ජාතික මානුෂවාදී රීතින් පිළිගනු ලබන බවට සාක්ෂි සැපයුවද, ඒවායේ නීතිමය වැදගත්කම නොපැහැදිලිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි පැවැත්ම ඔප්පු කිරීමෙහිලා විශ්වාසනීය ලෙස එම පරිචයන් පදනම් කරගනු නොලබන බව දක්නට ලැබේ. එවැනි පරිචයන්ට නිදර්ශන මෙම අධ්‍යයනයේ දෙවන වෙළුමෙහි "වෙනත් පරිචයන්" නම් ශිර්ෂය යටතේ ලැයිස්තුගත කර ඇත.

---

[8] *මෙම කොන්දේසිවල වැදගත්භාවය අන්තර්ජාතික යුක්ති අධිකරණය මගින් පෙන්වා දෙන ලදී,* *Legality of the Threat or use of Nuclear Weapons, උපදේශාත්මක මතය, 1996 ජූලි 8, අන්තර්ජාතික යුක්ති අධිකරණ වාර්තාව, 1996, පි. 254 -255, $$ 70-73*

[9] *අන්තර්ජාතික යුක්ති අධිකරණ ව්‍යවස්ථාව, 38 (1) (ඈ) ව්‍යවස්ථාව*

*රාජ්‍ය පරිචය තක්සේරු කිරීම*

රාජ්‍ය පරිචය, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි රීතියක් නිර්මාණය කිරීමට ප්‍රමාණවත් තරම් "ධාරිතාවකින්" (dense) යුක්ත ද යන්න තක්සේරු කිරීම සඳහා එහි බලපෑම මැන බැලිය යුතුය[10]. චාරිත්‍රානුකූල අන්තර්ජාතික රීතියක් ස්ථාපනය කිරීම සඳහා රාජ්‍ය පරිචය යන්න සැබෑ ලෙසම ඒකාකාර (ඒකරූපී) ලෙස පෘථුලව ව්‍යාප්ත වූ සහ නියෝජනය කරන සුළු (virtually uniform, extensive and representative) විය යුතුය[11]. මේ මගින් අදහස් වන්නේ කුමක් ද යන්න මෙතැන් පටන් වඩා පුළුල් හා සමීප ලෙස විග්‍රහ කරනු ලබයි.

පළමුව, රාජ්‍ය පරිචය මගින් අන්තර්ජාතික චාරිත්‍රානුකූල නීතියේ යම් රීතියක් ස්ථාපනය කිරීම පිණිස එකී රාජ්‍ය පරිචය ඒකරූපිතාවයෙන් යුක්ත විය යුතුය. විවිධ රාජ්‍යයන් විසින් හරයාත්මක වශයෙන් වෙනස් ස්වරූපයක් දරන හැසිරීම්වල නිරත නොවිය යුතුය. අන්තර්ජාතික යුක්ති අධිකරණයේ තීරණයන්ට අනුව රාජ්‍යයන් විසින් ප්‍රතිවිරුද්ධ පරිචයන් අනුගමනය කිරීම හරහා, මුල්බැල්මට ප්‍රශ්නගත පරිචයේ පවත්නා ඒකරූපීතාවය යටපත් කරනු ලැබුවද, මෙම ප්‍රතිවිරුද්ධ පරිචය සෙසු රජ්‍යයන් විසින් හෙලා දකින්නේ නම් සහ අදාළ රාජ්‍යයේ ආණ්ඩුව විසින්ම ප්‍රතික්ෂේප කරනු ලබයි නම් එකී පරිචය හරහා අන්තර්ජාතික චාරිත්‍රානුකූල නීතියේ රීතියක් ස්ථාපනය කිරීම වළක්වනු නොලබයි. එවැනි හෙළාදැකීමකින් හෝ ප්‍රතික්ෂේප කිරීමක් හරහා අදාළ ප්‍රශ්නගත රීතිය සත්‍ය වශයෙන්ම තවදුරටත් තහවුරු කරනු ලබයි.[12]

මෙය විශේෂයෙන්ම අන්තර්ජාතික මානුෂවාදී නීතියේ පවත්නා රීතින් ගණනාවකට අදාළ වන අතර එකී රීතින්වලට සහාය දක්වන ආකාරයේ රාජ්‍ය පරිචය සම්බන්ධයෙන් මෙන්ම එම රීතීන් නැවත නැවතත් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ද අතිමහත් සාක්ෂි ප්‍රමාණයක් දක්නට ලැබේ. එවැනි උල්ලංඝනයන් සිදු කරනු ලබන රාජ්‍ය පාර්ශවයන් විසින් ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන සමාවට කරුණු දැක්වීම් හෝ සාධාරණීකරණය කිරීම් සහ/හෝ අනෙකුත් රාජ්‍යයන් විසින් කරනු ලබන හෙලා දැකීම් එම අදාළ ප්‍රශ්නගත

---

[10] *මෙම සන්දර්භය තුළ, "dense" නම් වචනය ශ්‍රීමත් හම්ප්‍රි වොල්ඩොක් මහතා වෙතින් පැමිණෙන ලදී. "General Course of Public International Law", Collected Courses of the Hague Academy of International Law, 106 වෙළුම, 1962. පි. 44*

[11] *අන්තර්ජාතික යුක්ති අධිකරණය,* North Sea Continental Shelf Case, *(ඉහත 7 වන සටහන බලන්න) පි. 43* $ 74

[12] *බලන්න : අන්තර්ජාතික යුක්ති අධිකරණය, Case Concerning Military and Para Military Activities in and Against Nicaragua, (Nicaragua v. United States), නඩු තීරණය, 1986 ජුනි 27, අන්තර්ජාතික යුක්ති අධිකරණ වාර්තාව, 1986, පි. 98* $ 186

රීතියෙහි පැවැත්ම අභියෝගයට ලක්කරන ස්වභාවය නොදරයි. චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ පවත්නා යම් රීතියක් වෙනස් කිරීමට බලාපොරොත්තු වන රාජ්‍යයන් විසින් එය සිදු කළ යුතු වන්නේ ඔවුන්ගේ නිල රාජ්‍ය පරිචය හරහා වන අතර තමන් එසේ ක්‍රියා කරන්නේ අයිතියක් වශයෙන් බව ද යාචනය කළ යුතුය.

දෙවනුව, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ පොදු රීතියක් ස්ථාපනය වීම පිණිස වන අදාළ රාජ්‍ය පරිචය පුළුල් සහ නියෝජනාත්මක ස්වභාවයේ පරිචයක් විය යුතුය. කෙසේ වුවද, මෙහිලා මෙකී රීතිය විශ්වීය ස්වභාවයක් දැරීම අපේක්ෂා නොකරන අතර එය පොදු පරිචයක් වශයෙන් පැවතීම පමණක් ප්‍රමාණවත් වේ.[13] මෙහිදී නිශ්චිත රාජ්‍ය සංඛ්‍යාවක් හෝ ප්‍රතිශතයක් එය අනුගමනය කිරීම අවශ්‍ය නොවේ. මෙලෙස මෙම රාජ්‍ය පරිචය අනුගමනය කළ යුතු නිශ්චිත සංඛ්‍යාවක් පැවතීම අවශ්‍යතාවයක් ලෙස දැක්වීමට නොහැකි වන්නේ මේ සම්බන්ධව පවත්නා නිර්ණායකයන් ප්‍රමාණාත්මක (*qualitative*) වනවාට වඩා ගුණාත්මක (*quantitative*) ස්වභාවයක් දරන බැවිනි. මෙහි ගැටලුව වන්නේ හුදු කොතරම් රාජ්‍යයන් සංඛ්‍යාවක් මෙම පරිචය අනුගමනය කරනවා ද යන්න නොව කුමන රාජ්‍යයන් මෙකී පරිචය අනුගමනය කරනවා ද යන්න බැවිනි[14]. අන්තර්ජාතික යුක්ති අධිකරණය මේ සම්බන්ධයෙන් උතුරු මුහුදේ මහාද්වීපික තටකය පිළිබඳ නඩු තීරණයන්හී දී ප්‍රකාශ කරනු ලැබූ පරිදි මෙකී රාජ්‍ය පරිචය තුළට "තම බැඳියාවන් විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්හී පරිචයන් අන්තර්ගතවී" තිබිය යුතු බවයි[15].

මෙම සලකා බැලීම තුළින් අනුමිතීන් දෙකක් ගම්‍ය වේ: එනම්, (1) සියලුම "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්" මේ තුළ නියෝජනය වේ නම්, සෙසු බහුතර රාජ්‍යයන් මෙකී පරිචය කෙරෙහි ක්‍රියාකාරී වශයෙන් සහභාගී වී තිබීම අත්‍යවශ්‍ය නොවන නමුත්, ඔවුන් "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්"හී පරිචයට අවම වශයෙන් එකගවී තිබීය යුතුය යන්න සහ (2) "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්" විසින් අදාළ පරිචය පිළිගනු නොලබයි නම්, ඉහතින් විස්තර කළ පරිදි ඒකමතිකභාවය අත්‍යවශ්‍ය නොවූනද, ඒ හරහා චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ රීතියක් වර්ධනය කළ නොහැකි වේ යන්නයි[16]. "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්" යන්නෙහි

---

13 *අන්තර්ජාතික නීති සංගමය, පොදු චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතීන් නිර්මාණය සඳහා වන කමිටුවේ වාර්තාව, පොදු චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය නිර්මාණය සඳහා අදාළ වන මූලධර්ම පිළිබඳ වන ප්‍රකාශය, හැටනම වන සමුළුවේ වාර්තාව, ලන්ඩනය, 2000. 14 වන මූලධර්මය, 734 වන පිටුව (මින් මතු "ILA වාර්තාව")*

14 *ඉහත. 14 වන මූලධර්මයට වන (ඈ) සහ (ඉ) යන විචාර, පි. 736-737*

15 *අන්තර්ජාතික යුක්ති අධිකරණය,* North Sea Continental Shelf Case, *(ඉහත සටහන 7) පි. 43, $$74*

16 *ILA වාර්තාව, (ඉහත 13 සටහන), (ඉ) විචාරය, පි. 737*

අර්ථය, අන්තර්ජාතික මානුෂවාදී නීතිය තුළ අවස්ථාපිත සාධකයන් මත වෙනස් විය හැකිය. උදාහරණයක් වශයෙන්, අන්ධ බව ඇති කරන ලේසර් අවි භාවිත කිරීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ විමසා බැලීමේදී, එකී අවි භාවිතය හරහා සෙසු රාජ්‍යයන් පීඩාවට පත්වීමට හැකියාව පැවතියද, "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්" යන්නට ඇතුළත් වන්නේ එවැනි අවි වර්ධනය කිරීමේ කාර්යාවලියේ නිරත වී සිටින බවට හඳුනාගෙන ඇති රාජ්‍යයන් ය. තවද, මානුෂවාදි ආධාරයන් අවශ්‍ය ජනගහනයක් සහිත රාජ්‍යයන්ට සමානව ම එවැනි ආධාරයන් නිරතුරුව ප්‍රදානය කරනු ලබන රාජ්‍යයන් ද "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්" ලෙස හඳුනාගත හැකිය. අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි පවත්නා කවර වූ හෝ රීතියක් සම්බන්ධයෙන් යම්කිසි සන්නද්ධ ගැටුමකට අදාළ වන එක්තරා නිශ්චිත රීතියක අදාළත්වය සලකා බැලීමේදී එකී අවි ගැටුමට මැදිහත් වු රාජ්‍යයන්ගේ පරිචය පිළිබඳ ව පරීක්ෂා කරන විටදී එබඳු රටවල් "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්" වශයෙන් හඳුනාගත හැකිය. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ යම් නිශ්චිත ක්ෂේත්‍රයන් තුළ විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන් සිටිය හැකි නමුත් අදාළ ගැටුමට තමන් පාර්ශවයක් නොවූවද සෙසු රාජ්‍යයන් වෙතින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය කෙරෙහි ගරුත්වයක් අපේක්ෂා කිරීමට සෑම රාජ්‍යයකටම නෛතික බැඳියාවක් පවතින බව පිළිගත යුතු සත්‍යයකි.[17] මීට අමතරව, සෙසු රාජ්‍යයන් විසින් යුද්ධයේ දී යොදා ගනු ලබන විධික්‍රමයන් හේතු කරගෙන සියලුම රාජ්‍යයන් පීඩාවට පත් වීමට හැකියාව ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වචනාර්ථයෙන් බලන කළ "විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන්" නොවූවද සෑම රාජ්‍යයකම පරිචය සලකා බැලිය යුතු බව පෙන්වා දිය හැකිය.

මෙම අධ්‍යයනය, අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතින් විෂයෙහි "නිරන්තරව විරුද්ධ වන්නෙක්" (persistent objector) වීම සඳහා නෛතික වශයෙන් අවකාශයක් පවතිනවාද යන්න පිළිබඳ ව අදහසක් ඉදිරිපත් කරනු නොලැබීය. අනුලංඝනීය නියාමයන් (*jus cogens*) පිළිබඳ රීතින් සම්බන්ධයෙන් එවැනි නිරන්තර විරුද්ධ වන්නෙක් වීම පිණිස අවකාශ නොපවතින බවට බොහෝ විචාරකයන් මත පළ කර තිබෙන නමුත් සෙසු පිරිස එකී නිරන්තර විරුද්ධ වන්නා නම් සංකල්පයේ සමස්ත පැවැත්ම පිළිබඳ ව තවදුරටත් සැක පහළ කරති.[18] නමුත් යම් ආකාරයකින් එවැනි නිරන්තර විරුද්ධ වන්නෙක් බවට පත්වීම සඳහා නෛතික වශයෙන් අවකාශ පවතින බව යමෙකු විසින් පිළිගනු ලබයි නම්, අදාළ රාජ්‍යය විසින් ප්‍රශ්නගත නව

---

[17] *බලන්න, Customary International Law, (ඉහත 4 සටහන ) 1 වන වෙළුම, 144 රීතිය පිළිබඳ විචාරය*

[18] *මෙම ගැටලුව පිළිබඳ ගැඹුරු සංවාදයක් සඳහා, බලන්න මොරිස්. එච්. මෙන්ඩල්සන් ගේ, "The Formation of Customary International Law : Collected Courses of the Hague Academy of International Law", 272 වෙළුම, 1998, පි. 227 - 244*

නියාමය පිළිබඳ ව එය නිර්මාණය වන අවස්ථාවේදී පටන් ම ප්‍රතිරෝධය දක්වා තිබිය යුතු අතර ඉන් අනතුරුවත් දිගින් දිගටම ඒ සඳහා විරෝධතාවය දක්වා තිබිය යුතුය. එසේ නොකර පසුකාලීනව අනුශාංගික විරුද්ධ වන්නෙක් (subsequent objector) වීම සඳහා අවකාශ නොපවතියි.

චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි රීතියක් ඇති වීම සම්බන්ධයෙන් නිශ්චිත කාල රාමුවක් නොපවතින අතර සාමාන්‍යයෙන් ඒ සඳහා යම් කාලයක් ගත වන බව දක්නට ලැබේ. සැබවින්ම මෙහි තීරණාත්මක සාධකය වන්නේ ඒකරූපිතාවය, පුළුල් සහ නියෝජනාත්මක ස්වභාවයේ ප්‍රමාණවත් ධාරිතාවයක් සහිත රාජ්‍ය පරිචයක එකතුවක් පැවතීම වේ[19].

## මානසික අංගය (*opinio juris*)

චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි පවත්නා රීතියක පැවැත්ම තහවුරු කිරීම පිණිස අවශ්‍ය වන "මානසික අංගය" යන්නෙන් අදහස් වන්නේ යම් නිශ්චිත පරිචයක් "අයිතියක් ලෙස" නෛතික විශ්වාසයක් සහිතව පවත්වාගන යාමයි. සලකා බලනු ලබන රීතිය හරහා යම් තහනම් කිරීමක්, බැඳීම් සහගත භාවයක් හෝ යම් නිශ්චිත ආකාරයකට හැසිරීම සඳහා වන හුදු අයිතිවාසිකමක් ප්‍රදානය කරන්නේද යන කරුණ මත ඉහත සඳහන් පරිචය සහ ඒ පිළිබඳ ව වන නෛතික විශ්වාසය බෙහෙවින් වෙනස් විය හැකිය.

මෙම අධ්‍යයන කාර්යය තුළදී, පරිචය සහ නෛතික විශ්වාසය යන මූලිකාංග දැඩි වෙන් කිරීමකට ලක් කිරිම ඉතා අසීරු බව ඔප්පුකර ඇති අතර එය ඉතාමත් න්‍යායාත්මක ස්වභාවයක් දරනා බව පෙන්වා දී ඇත. බොහෝ විට එකම ක්‍රියාව හරහා පරිචය සහ නෛතික විශ්වාසය යන්න පිළිඹිබු වන අවස්ථා දක්නට ඇත. සැබැවින්ම, අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් චාරිත්‍රානුකූල නීතියෙහි වෙනස් මූලිකාංග ද්විත්වයක් පවතින බැවින් එක් හැසිරීමක් හරහා එකී මූලිකාංග ද්විත්වයම පිළිබිඹු කළ නොහැකි බව ප්‍රකාශ කර නොමැති බව අන්තර්ජාතික නීති සංගමය පෙන්වා දෙනු දෙයි. සත්‍යවශයෙන්ම මෙකී මූලිකාංග ද්විත්වය වෙන්කිරීම බොහෝ අවස්ථාවලදී ඉතා අසීරු වනවා පමණක් නොව ඇතැම් අවස්ථාවලදී එය කිසිසේත්ම කළ නොහැකි බව ද දක්නට ලැබේ.[20] ඒ මන්ද යත් බොහෝ විට වාචික ප්‍රකාශයන්, යුදමය අත්පොත් වැනි දේ රාජ්‍ය පරිචයන් ලෙස සලකනු ලබන අතර එම අවස්ථාවේදීම අදාළ රාජ්‍යයේ නෛතික විශ්වාසය ද පිළිබිඹු කරයි.

---

[19] *එහිම, 12 වන මූලධර්මයට වන (ආ) විචාරය, පි. 731*

[20] *එහිම, 7,8 පිටුව, $ 10 (ඇ), මෙම ගැටලුව පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් සඳහා බලන්න. Peter Haggenmacher, " La doctrine des deux éléments du droit coutumier dans la partique de la our internationale," Revue générale de droit international Public, 90 වෙළුම, 1986, පි. 5*

රාජ්‍ය පරිචය පිළිබඳව විමසීමේදී, ප්‍රමාණවත් තරම් බහුල රාජ්‍ය සංඛ්‍යාවක් එය අනුගමනය කරනු ලබන්නේ නම්, එකී පරිචය තුළ පොදුවේ මානසික අංගය අන්තර්ගත වන බව පිළිගනු ලබන බැවින් මානසික අංගයේ පැවැත්ම වෙනම ම දැක්වීම සාමාන්‍යයෙන් අවශ්‍ය නොවේ. කෙසේ වුවද, රාජ්‍ය පරිචය ව්‍යාකූල ස්වභාවයක් දරන අවස්ථාවන්වලදී, අදාල චාරිත්‍රය ඇති කිරීම සම්බන්ධයෙන් එකී පරිචය ගණනය කළ හැකිද, නොහැකිද යන්න තීරණය කිරීම සම්බන්ධයෙන් මානසික අංගය නම් සාධකය ප්‍රධාන භූමිකාවක් රඟ දක්වනු ලබයි. මෙම තත්ත්වය බොහෝ විට නොකර හැරීම් (අකරණයන්) සම්බන්ධයෙන්, එනම් රාජ්‍යයන් විසින් ඇතැම් අවස්ථාවන්වලදී යම් ක්‍රියාවන් කිරීමෙන් වැළකී සිටින්නේ සහ යම් යම් ක්‍රියාවන්වලට ප්‍රතික්‍රියා නොදක්වන්නේ මන්දැයි බොහෝ විට පැහැදිලි නොවන අවස්ථාවන්හි දී උද්ගත වන බව දක්නට ලැබේ. එවැනි අවස්ථාවන්වලදී අන්තර්ජාතික යුක්ති අධිකරණය සහ එහි පූර්වගාමියා වන අන්තර්ජාතික යුක්තිය පිළිබඳ ස්ථාවර අධිකරණය විසින් ව්‍යාකූල පරිචය සම්බන්ධයෙන් පවත්නා උදාහරණ, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය ස්ථාපනය කිරීම පිණිස ගණන් ගත හැකිවේද යන්න තීරණය කිරීම පිණිස මානසික අංගයෙහි පැවැත්ම වෙනම ම තහවුරු කර ගැනීම පිණිස අවධානය යොමු කර ඇත[21].

අන්තර්ජාතික මානුෂවාදී නීති ක්ෂේත්‍රය තුළදී බොහෝ රීතින් මගින් යම් නිශ්චිත කාර්යයන් හී නිරත වීමෙන් වැළකී සිටින ලෙස ඉල්ලා සිටින අතර, මෙකී අකරණය හේතුවෙන් මානසික අංගය තක්සේරු කිරීම සම්බන්ධයෙන් සුවිශේෂී ගැටලුවක් මතු කරනු ලබයි. මන්දයත්, එකී වැළකී සිටීම හෝ අකරණය හුදු අහඹුවක් නොව එය නීත්‍යානුකූල අපේක්ෂාවක් පදනම් කරගනිමින් කරන ලද්දක් බව ඔප්පු කළ යුතුය. මෙකී වැළකී සිටීමේ අවශ්‍යතාවය අන්තර්ජාතික ලියවිලි සහ නිල ප්‍රකාශයන් තුළ දක්වා තිබෙන අවස්ථාවන්වලදී, ප්‍රශ්නගත ක්‍රියාවෙන් වැළකී සිටීම පිණිස පවත්නා නෛතික අවශ්‍යතාවයෙහි පැවැත්ම සාමාන්‍යයෙන් ඔප්පු කළ හැකිය. මීට අමතරව, අදාළ වැළකී සිටීම නෛතික වගකීමක හැඟීමෙන් සිදු කළ බව ඔප්පු කිරීම සැම විටම පහසු නොවුවද, එම වැළකි සිටීම් ප්‍රශ්නගත හැසිරීම යම් ආන්දෝලනයක් ඇති කළ පසු සිදුවිය හැකි බැවින් එය, එකී වැළකි සිටීම හුදු අහඹුවක් නොවන බව පෙන්වා දීමට උපකාරයක් වනු ඇත.

---

[21] *බලන්න, උදා. අන්තර්ජාතික යුක්තිය පිළිබඳ ස්ථිර අධිකරණය,* Lotus case (France v. Turkey) *නඩු තීරණය, 1927 සැප්තැම්බර් 7, අන්තර්ජාතික යුක්තිය පිළිබඳ අධිකරණ, නො. 10, පි. 28, (රාජ්‍යයන් විදේශීය නැව්වල වැරදි ක්‍රියා සඳහා නඩු පැවරීමෙන් වැළකී සිටියේ ඔවුන් එලෙස කිරීමෙන් තහනම් කර ඇති බවට වන හැඟීම නිසා නොවන බව අධිකරණය තීරණය කළේය.) ; අන්තර්ජාතික යුක්ති අධිකරණය,* North Sea Continental Shelf Case, *(ඉහත සටහන 7) පි. 43-44,* ILA *වාර්තාව (ඉහත 13 වන සටහන) 17 (iv) මූලධර්මය සහ විචාරය*

## සම්මුතිමය නීතියේ බලපෑම

අන්තර්ජාතික නීතියේ පවත්නා යම් යම් රීතින් රාජ්‍යයන් දකින්නේ කෙසේද යන්න සොයා ගැනීම පිණිස සම්මුති නීතිය උපකාරී වන බැවින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ පැවැත්ම තීරණය කිරීම පිණිස සම්මුතිමය නීතිය ද අදාළ කර ගත හැකිය. එබැවින්, සම්මුතියක් සපථ (අපරානුමත) කිරීම, අර්ථ නිරූපණය සහ ක්‍රියාත්මක කිරීම සහ සම්මුතිය සපථ කිරීමේදී සිදුකරන ලබන වෙන්කර දැක්වීම් මෙන්ම සපථ කිරීමේදී සිදු කරන අර්ථ නිරූපණය සම්බන්ධයෙන් වන ප්‍රකාශ මෙම අධ්‍යයනය තුළට ඇතුළත් කර ඇත. උතුරු මුහුදේ මහාද්වීපික තටකය පිළිබඳ නඩුවලදී අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය තක්සේරු කිරීමේ දී, සම්මුතියක් සපථ කර ඇති ප්‍රමාණය සැලකිල්ලට ගත යුතු බව පැහැදිලිව දක්වන ලදී. එම නඩුවේදී, විශේෂයෙන් සම්මුතියට පරිබාහිර පරිචය පටහැනි ස්වභාවයක් දරන තත්වයක් තුළදී, "මේ වන තුරු තහවුරුව ඇති සපථ කිරීම් සහ ප්‍රවේශවීම් ප්‍රමාණය (39) ගෞරවණීය වුවද ප්‍රමාණවත් නොවන බව"අධිකරණය ප්‍රකාශ කරන ලදී[22].

අනෙක් අතට, නිකරගුවා නඩු තීරණයේ දී අධිකරණය, මැදිහත් නොවීම පිළිබඳ රීතියෙහි චාරිත්‍රානුකූල තත්ත්වය තක්සේරු කිරීමේදී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මුළුමනින්ම පාහේ විශ්වීය වශයෙන් අනුමත කර තිබීම යන කාරණය මත වැඩි බරක් තබන ලදී.[23] යම් සම්මුතිමය ප්‍රතිපාදනයක් මගින් චාරිත්‍රානුකූල නීතිය පිළිබිඹු කරන්නේ නම්, එකී සම්මුතිය තවමත් බලාත්මකභාවයට පැමිණ නොතිබුණත්, විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන් ද ඇතුළත්ව ප්‍රමාණවත් තරම් සමාන පරිචයක් පවතී නම්, එකී ප්‍රශ්නගත රීතියට සැලකිය යුතු මට්ටමේ ප්‍රතිවිරෝධයක් ඇති වීමට ඇති හැකියාව ඉතා අවම වේ[24].

ප්‍රායෝගිකව ගත් කළ, සම්මුතිමය නියාමයන් කෙටුම්පත් කිරීම මගින් ලෝකයේ නෛතික මතය කේන්ද්‍රගත කිරීම සහ රාජ්‍යයන්හි නෛතික අවබෝධය හා ආනුශංගික හැසිරීම මත ප්‍රතික්ෂේප කළ නොහැකි බලපෑමක්

---

[22] *අන්තර්ජාතික යුක්ති අධිකරණය,* North Sea Continental Shelf Case, *(ඉහත 7 සටහන ) පි. 42*

[23] *අන්තර්ජාතික යුක්ති අධිකරණය,* *Case Concerning Military and Para Military Activities in and Against Nicaragua, (Nicaragua v. United States),* *(ඉහත 12 වන සටහන) පි. 99-100. අධිකරණයේ තීරණය වූ තවත් වැදගත් කරුණක් වන්නේ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලයේ අදාළ යෝජනා සම්මතය පුළුල් පිළිගැනීමකට ලක් වී ඇති බවයි. විශේෂයෙන් 2625 යෝජනා සම්මතය ඡන්දයක් නොමැතිව ම අනුමත කරන ලදී.*

[24] *අන්තර්ජාතික යුක්ති අධිකරණය,* Continental Shelf Case, *(ඉහත 6 සටහන ) පි. 33, අනන්‍ය ආර්ථික කලාපය යන සංකල්පය චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කොටසක් බවට පත් වී ඇති බව අධිකරණය සලකා බලන ලදී. නමුත් තවමත් එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මකභාවයට පැමිණ නැත. මන්දයත්, විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන් ද ඇතුලුව අනන්‍ය ආර්ථික කලාපීය පිළිබඳ පැමිණිලි 56 දක්වා වර්ධනය වී ඇති බැවිනි.*

සිදු කරයි. මෙම තත්ත්වය අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් මහාද්වීපික තටකය නඩු තීරණය තුළදී හඳුනාගත් අතර,"චාරිත්‍ර හරහා ජනනය වන රීතින් වාර්තාගත කිරීම හා නිර්වචනය කිරීම සම්බන්ධයෙන් හෝ සත්‍ය වශයෙන්ම එකී රීතින් වර්ධනය කිරීම සම්බන්ධයෙන් සැබැවින්ම බහු පාර්ශවීය සම්මුතීන් වැදගත් භූමිකාවක් රඟ දක්වන" බව ප්‍රකාශ කරන ලදී[25]. මේ අනුව අධිකරණය විසින්, සම්මුතීන් හරහා පූර්වයෙන් පවත්නා චාරිත්‍රානුකූල නීතියෙහි රීතින් සංග්‍රාහගත කිරීම සිදු කරනු ලබන බව මෙන්ම සම්මුතිමය නියාම මත පදනම් වෙමින් නව චාරිත්‍රානුකූල රීතින් වර්ධනය කිරීම පිණිස පදනම සපයන බව ද තහවුරු කරන ලදී. අධිකරණය තවදුරටත් ප්‍රකාශ කර සිටියේ "තම බැඳියාවන් විශේෂයෙන් බලපෑමට ලක්වන රාජ්‍යයන් ද ඇතුලත් වන්නේ නම්, සම්මුතියකට පුළුල් සහ නියෝජනාත්මක ලෙස සහභාගිවීම එනයින්ම ප්‍රමාණවත් වන බවයි."[26]

මෙම අධ්‍යයනය "පුළුල් අනුමැතිය" යනු හුදෙක් මග පෙන්වීමක් පමණක් බවත්, එය විශේෂයෙන්ම ප්‍රශ්නගත සම්මුතියට පාර්ශවයක් නොවන රාජ්‍යයන් ද ඇතුළත්ව පරිචයේ සෙසු මූලිකාංග සමග තක්සේරු කළයුතු බවට වන ප්‍රවේශම්කාරී ප්‍රවේශයක් ගන්නා ලදී. රාජ්‍ය පාර්ශවයක් නොවන රාජ්‍යයන්හි අඛණ්ඩ පරිචය වැදගත් ධනාත්මක සාක්ෂියක් වශයෙන් සලකන ලදි. කෙසේ වුවද, අදාළ සම්මුතියට රාජ්‍ය පාර්ශවයක් නොවන රාජ්‍යයන්හි " ප්‍රතිවිරුද්ධ පරිචය" වැදගත් සෘණාත්මක සාක්ෂියක් වශයෙන් සලකන ලදී. රාජ්‍ය පාර්ශවයන්ගේ මෙන්ම පාර්ශවයන් නොවන රාජ්‍යයන්ගේ ද පරිචය අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වේ.

මෙලෙස, මෙම අධ්‍යයනය අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළ සම්මුතීන්ට පාර්ශවයක් නොවන රාජ්‍යයන්හි පරිචයට පමණක් සීමා නොකරන ලදී. උදාහරණයක් වශයෙන්, අතිරේක සන්ධානය අනුමත කර නැති 30ක් පමණ වන රාජ්‍යයන් පිළිබඳ ව පමණක් අවධානය යොමු කිරීම, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය පුළුල් හා නියෝජනාත්මක පරිචයක් මත පදනම් විය යුතු බවට වන අවශ්‍යතාවය සමග අනුගත නොවන බව දක්නට ඇත. ඒ නිසා චාරිත්‍රානුකූල නීතියේ පැවැත්ම තක්සේරු කිරීම පිණිස, මෙම අධ්‍යයනය ප්‍රකාශයට පත් කරන අවස්ථාව වන විට පළමු අතිරේක සන්ධානය රාජ්‍යයන් 162ක් විසින් ද දෙවන අතිරේක සන්ධානය රාජ්‍යයන් 157ක් විසින් ද අනුමත කර ඇති බව සැලකිල්ලට ගන්නා ලදි.

---

[25] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, Continental Shelf Case, (ඉහත 6 සටහන ) පි. 29-30*

[26] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, North Sea Continental Shelf Case, (ඉහත 7 සටහන ) පි. 42, තවද ILA වාර්තාව (ඉහත 13 සටහන), 20, 21, 24, 26, සහ 27 මූලධර්ම, පි. 754-765*

මෙම අධ්‍යයනය හරහා අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි සෑම සම්මුතිමය රීතියකම පවත්නා චාරිත්‍රානුකූල ස්වභාවය තීරණය කිරීම බලාපොරොත්තු නොවූ බව සඳහන් කළයුතු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එය පවත්නා සම්මුතීන්හි ව්‍යුහය එනයින්ම අනුගමනය නොකරන ලදී. මේ තුළින් රාජ්‍ය පරිචය මත පදනම් වෙමින් අනුගාමී ලෙස චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කවර රීතින් සොයා ගත හැකිද යන්න තහවුරු කිරීම සඳහා මෙකී කරුණු විශ්ලේෂණය කිරීම අපේක්ෂා කරන ලදී. මෙහිදී අනුගමනය කරන ලද ප්‍රවේශය අනුව, සෑම සම්මුතිමය රීතියක්ම චාරිත්‍රානුකූල රීතියක් ස්ථාපනය කරනවාද යන්න විශ්ලේෂණය නොකළ බැවින් යම් විශේෂිත සම්මුතිමය රීතියක් හුදෙක් අධ්‍යයනය තුළ දක්නට නොලැබීම නිසා එය චාරිත්‍රානුකූල නොවන බවට නිගමනය කළ නොහැකි වේ.

## අධ්‍යයනය සංවිධානය කිරීම

අන්තර්ජාතික රතු කුරුස සංවිධානය වෙත පවරා ඇති මෙහෙවර සම්පූර්ණ කිරීම තහවුරු කරනු පිණිස ඇති හොඳම මාර්ගය කවරක් ද යන්න තීරණය කිරීම පිණිස කර්තෘවරුන් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ විශේෂඥභාවයෙන් යුතු අධ්‍යාපනවේදීන් කණ්ඩායමක් වෙතින් උපදෙස් ලබාගත් අතර, මෙම කණ්ඩායම මගින් මෙකී අධ්‍යයනයේ මෙහෙයුම් කමිටුව නිර්මාණය කරන ලදී.[27] මෙම කමිටුව විසින් 1996 ජුනි මාසයේ දී ක්‍රියාකාරී සැලස්මක් සකස් කර පිළිගත් අතර මෙම පර්යේෂණය අනතුරුව එළඹුන ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලදී. මෙම පර්යේෂණය රාජ්‍ය පරිචය පිළිබිඹු කරන ජාතික සහ අන්තර්ජාතික මූලාශ්‍රයන් භාවිත කරමින් පවත්වා ගෙන ගිය අතර, ක්‍රියාකාරී සැලසුම මගින් හඳුනා ගන්නා ලද අධ්‍යයනයේ කොටස් හයක් වෙත අවධානය යොමු කරන ලදී.

- වෙන් කොට දැක්වීම පිළිබඳ සිද්ධාන්තය
- විශේෂයෙන් ආරක්ෂා කරන ලද පුද්ගලයන් සහ ඉලක්ක
- විශේෂිත යුද උපක්‍රම
- ආයුධ
- සිවිල් වැසියන්ට සහ ආයුධ බිම තබා ඇති පුද්ගලයින්ට සැලකීම (hors de combat)
- ක්‍රියාවට නැංවීම

[27] *මෙහෙයුම් කමිටුව, මහාචාර්ය ජෝර්ඩ් අබි - ෂාබ්, සලාහ අල් දීන් අමර්, ඕවි බ්‍රින්ග්, එරික් ඩේවිඩ්, ජෝන් ඩූගාර්ඩ්, ෆලෝරෙන්ටිනෝ පෙලිසියානෝ, හෝර්ස්ට් ෆිෂර්, ෆ්‍රැන්සිස් හැම්පසන්, තියඩෝර් මේරොන්, ඩාවිඩ් මොම්ටාස්, මිලාන් සහොවික් සහ රෝල් එමිලියෝ විනුසා යන අයගෙන් සමන්විත වේ.*

## ජාතික මූලාශ්‍ර පිළිබඳ පර්යේෂණය

ජාතික මූලාශ්‍රයන්ට ප්‍රවේශවීම රටක් තුළ දී වඩාත් පහසු බැවින්, ඒ සඳහා ජාතික පර්යේෂකයන්ගේ සහාය ලබා ගැනීමට තීරණය කරන ලදී. මේ අනුව, රාජ්‍යයන් 50ට ආසන්න සංඛ්‍යාවක (අප්‍රිකාවේ 9, ඇමෙරිකාවේ 11, ආසියාවේ 15, ඕස්ට්‍රේලියාවේ 1 සහ යුරෝපයේ 11 ඇතුළත් ව) සිටින පර්යේෂකයකු හෝ පර්යේෂණ කණ්ඩායමක් හඳුනාගත් අතර, තම රටේ රාජ්‍ය පරිචය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන මෙන් ඔවුන්ගෙන් ඉල්ලා සිටින ලදී.[28] මෙකී රාජ්‍යයන් තෝරා ගැනීමේ නිර්ණායකයන් ලෙස භූගෝලීය නියෝජනය මෙන්ම, විවිධාකාරයේ යුද උපක්‍රමයන් භාවිත කරනු ලැබූ විවිධ සන්නද්ධ ගැටුම් තත්ත්වයන් පිළිබඳ මෑත කාලීන අත්දැකීම් යන කරුණු උපයෝගි කර ගන්නා ලදී.

රාජ්‍ය පරිචය පිළිබඳ වාර්තාවන් හරහා ආවරණය කරනු නොලැබූ හමුදා සංග්‍රහයන් (යුද අත්පොත්) සහ දේශීය ව්‍යවස්ථාවන් ද එක්රැස් කර පර්යේෂණ පවත්වන ලදී. මෙම කාර්යයට ලොව වටා සිටින අන්තර්ජාතික රතු කුරුස සංවිධානයේ නියෝජිත දූත මෙහෙයන් විසින් සහ අන්තර්ජාතික රතු කුරුස සංවිධානයේ, අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ උපදේශන සේවාව මගින් එක්රැස් කරන ලද ඉතා පුළුල් පරාසයක දේශීය ව්‍යවස්ථාවන් මගින් පහසු කරන ලදී.

## අන්තර්ජාතික මූලාශ්‍ර පිළිබඳ පර්යේෂණය

රාජ්‍ය පරිචය දක්වනු ලබන අන්තර්ජාතික මූලාශ්‍ර කණ්ඩායම් හයක් විසින් එක්රැස් කරන ලද අතර, ඒ එක් එක් කණ්ඩායම විසින් අධ්‍යයනයේ එක් එක් කොටස පිළිබඳ ව අවධානය යොමු කරන ලදී.[29] මෙම කණ්ඩායම් එක්සත්

---

28 *අප්‍රිකාව : ඇල්ජීරියාව, ඇන්ගෝලාව, බොස්ට්වානා, ඊජිප්තුව, ඉතියෝපියාව, නයිජීරියාව, රුවන්ඩා, දකුණු අප්‍රිකාව සහ සිම්බාබ්වේ*
*ඇමරිකාව : ආර්ජන්ටිනාව, බ්‍රසීලය, කැනඩාව, චිලී, කොලොම්බියා, කසුබා, එල් සැල්වදෝරය, නිකරගුවා, පේරු, ඇමෙරිකා එක්සත් ජනපදය සහ උරගුවේ*
*ආසියාව : චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, ඉරාකය, ඊශ්‍රාලය, ජපානය, ජෝර්දානය, කොරියානු රනරජය, කුවේටය, ලෙබනන්, මැලේසියාව, පකිස්ථානය, පිලිපිනය සහ සිරියාව*
*ඕස්ට්‍රේසියාව : ඕස්ට්‍රේලියාව*
*යුරෝපය : බෙල්ජියම, බොස්නියාව සහ හර්ස්ගාවීනාව*
*ක්‍රොඑෂියාව, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය. නෙදර්ලන්තය, රුසියාව, ස්පාඤ්ඤය, එක්සත් රාජධානිය, යුගොස්ලොවියාව*

29 *වෙනස්කර හඳුනාගැනීම පිළිබඳ මූලධර්මය : මහාචාර්ය ජෝර්ජ් අල් සාබ් (විශේෂ වාර්තාකරු) සහ ජීන් ප්‍රැන්සිස් ගැවෙන්ජර් (පර්යේෂක) : විශේෂයෙන් ආරක්ෂා කරන ලද පුද්ගලයන් සහ දේපළ : මහාචාර්ය හෝස්ට් පිෂර් (විශේෂ වාර්තාකරු) සහ ජෝර්ඩ් ස්කොටන් සහ හයික් ස්පයිකර් (පර්යේෂක); යුද්ධයේ විශේෂ විධික්‍රම, මහාචාර්ය තියෝඩර් මෙරන් (විශේෂ වාර්තාකරු) සහ රිචඩ් ඩිස්ගේන් (පර්යේෂක) ; ආයුධ : මහාචාර්ය ඕව් බ්‍රින්ග් (විශේෂ වාර්තාකරු) සහ ගස්ටෆ් ලින්ඩ් (පර්යේෂක) ; සිවිල් වැසියන්ට සහ* Horse de combat *පුද්ගලයන්ට සැලකීම : ෆ්‍රැන්සිස් හැම්ප්සන් (විශේෂ වාර්තාකරු) සහ*

ජාතීන්ගේ සහ අප්‍රිකානු සංගමය (පෙරදි අප්‍රිකානු එකමුතුව පිළිබඳ සංවිධානය), යුරෝපා කවුන්සිලය, ගල්ෆ් සහයෝගිතා කවුන්සිලය, යුරෝපා සංගමය, අරාබි ලීගය. ඇමෙරිකානු ජනපද සංවිධානය, ඉස්ලාමීය සමුළුව පිළිබඳ සංවිධානය සහ යුරෝපා සහයෝගිතාව සහ ආරක්ෂාව පිළිබඳ සංවිධානය ද ඇතුළු සෙසු අන්තර්ජාතික සංවිධානයන්හී කාර්ය රාමුව තුළ හිඳිමින් පර්යේෂණය කරන ලදී. තවද, චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ පැවැත්ම පිළිබඳ සාක්ෂි සපයනු ලබන තාක් දුරට අන්තර්ජාතික නඩු තීරණයන් ද එක්රැස් කරන ලදී.

## අන්තර්ජාතික රතු කුරුස සංවිධානයේ ලේඛනාගාරයේ තිබෙන පර්යේෂණ

ජාතික සහ අන්තර්ජාතික මූලාශ්‍ර තුළ සිදුකරනු ලැබූ පර්යේෂණ සම්පූර්ණ කරනු පිණිස අන්තර්ජාතික රතු කුරුස සංවිධානය විසින්, සන්නද්ධ ගැටුම් 40කට පමණ ආසන්න සංඛ්‍යාවකට සම්බන්ධව කටයුතු කළ තම සංවිධානයේ ලේඛනාගාරය පරීක්ෂා කර බලන ලදී. (අප්‍රිකාවේ 21, ඇමෙරිකා 2, ආසියාවේ 8 සහ යුරෝපයේ 8)[30] පොදුවේ ගත් කළ, මෙම ගැටුම් තෝරාගනු ලැබුවේ, එමගින් රාජ්‍ය පරිචය සම්බන්ධ වාර්තාවන් හරහා ආවරණය නොවන රටවල් සහ ගැටුම් ද ආවරණය වන බැවිනි. මෙකී ත්‍රිත්ව ආකාර ප්‍රවේශයේ එනම්, ජාතික මට්ටමේ, අන්තර්ජාතික මට්මමේ සහ අන්තර්ජාතික රතු කුරුස මූලාශ්‍ර ආශ්‍රිත පර්යේෂණවල ප්‍රතිඵලය නම් ලෝකයේ සෑම කොටසකම පරිචය ඒ හරහා ඉදිරිපත් වීමයි. කෙසේ වුවද, පවත්නා දේවල්හි ස්වභාවය අනුව මෙම පර්යේෂණය පරිපූර්ණ සමාප්තියක් කරා ගෙන යාමට නොහැකිය. මෙම අධ්‍යයනය විශේෂයෙන් පසුගිය වසර 30 තුළ වූ පරිචය පිළිබඳ ව අවධානය යොමු කළ අතර, එහි ප්‍රතිඵලය වන්නේ සමකාලීන චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය නැවත ප්‍රකාශයට පත් කිරීම වුවද තවදුරටත් අදාළ අවස්ථාවන්වලදී වඩා පැරණි පරිචයන් පිළිබඳ ව ද කරුණු දක්වා ඇත.

---

*කැමිල් ගිෆ්ර්ඩ් (පර්යේෂක) ; ක්‍රියාත්මක කිරීම : එරකි ඩේවිඩ් (විශේෂ වාර්තාකරු ) සහ රිචඩ් ඩිස්ගේන් (පර්යේෂක)*

[30] *අප්‍රිකාව : ඇන්ගෝලා, බුරුන්ඩි, චැඩ් - ලිබියා, කොන්ගෝ ජනරජය, ජිබුටි, ඒරිට්‍රියා, යේමනය, ඉතියෝපියා (1973-1994) ලයිබීරියා, මොසැම්බික්, නැමීබියා, නයිජීරියා, කැමරූන්, රුවන්ඩා, සෙනෙගල්, සෙනෙගල් - මව්රිටානියා, සියාරා ලියෝන්, සෝමාලියාව, සෝමාලියා - ඉතියෝපියාව, සූඩානය, උගන්ඩාව සහ බටහිර සහාරාව; ඇමෙරිකානු : ගෝතමාලා සහ මෙක්සිකෝව ; ආසියාව : ඇෆ්ගනිස්ථානය, කාම්බෝජියාව, ඉන්දියාව (ජම්මු සහ කාශ්මීරය), පැපුවා නිව්ගිනියාව, ශ්‍රී ලංකාව, පාකිස්ථානය, යේමනය සහ යේමන - එරිටා (අප්‍රිකාව යටතට ද අයත් වේ); ඇරමේනිය - අසර්බර්ජන් (නගර්නෝ - කරබක්), සයිප්‍රස්, පූර්ව යුගොස්ලෝවියාව ( යුගොස්ලොවියානු ගැටුම් (1991 -1992) බොස්නියාව සහ හර්සගෝමිනා ගැටුම් (1992 -1996) ක්‍රොඑෂියා ගැටුම් (ක්‍රජිනාස්) (1992 -1995), ජෝර්ජියා (අබ්කාසියා), රුසියානු සමූහාණ්ඩුව (චෙච්නියා) සහ තුර්කිය.*

## විශේෂඥ උපදේශනය

උපදෙස් ලබා ගැනීමේ පළමු වටය තුළ, අන්තර්ජාතික රතු කුරුස සංවිධානය විසින් අන්තර්ජාතික පර්යේෂණ කණ්ඩායම්වලට ආරාධනා කර සිටියේ තමන් විසින් එක්රැස් කර ගන්නා ලද "පරිචයන්" පදනම් කර ගනිමින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ මූලික මට්ටමේ තක්සේරුවක් අඩංගු ක්‍රියාකාරී සාරාංශයක් ඉදිරිපත් කරන ලෙසයි. මෙම ක්‍රියාකාරී සාරාංශ, 1998 ජිනීවා හී පැවති මග පෙන්වන කමිටු රැස්වීම් ත්‍රිත්වයක දී සාකච්ඡාවට බඳුන් කරන ලදී. මෙකී ක්‍රියාකාරී සාරාංශ තිසි පරිදි පුනරීක්ෂණය කර, උපදෙස් ලබා ගැනීමේ දෙවන වටයේ දී ලෝකයේ සියලු ම කලාප නියෝජනය කළ රජයන්හි විශේෂඥයන් සහ අධ්‍යාපනවේදීන් කණ්ඩායමක් වෙත ඉදිරිපත් කරන ලදී. අන්තර්ජාතික රතු කුරුස සංවිධානය විසින් 1999 ජිනීවා හි පැවති මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකකට තම පුද්ගලික මට්ටමෙන් සහභාගී වන ලෙස මෙකී විශේෂඥයින්ට ආරාධනා කළ අතර, එහිදී ඔවුන් විසින්, එක්රැස් කර තිබූ පරිචයන් විශ්ලේෂණය කිරීමට සහ මඟහැරී තිබු නිශ්චිත පරිචයන් සොයා ගැනීමට කමිටුවට සහාය දක්වන ලදී.[31]

## වාර්තාව ලිවීම

අධ්‍යාපනවේදීන් කණ්ඩායම සහ රජයන් හි විශේෂඥයන් විසින් විමර්ශනය කරන ලද, මෙහෙයුම් කමිටුවේ ඇගයුම්, අවසන් වාර්තාව ලිවීමේ පදනම ලෙස යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ කතෘවරුන් විසින්, පරිචය නැවත විභාග කර චාරිත්‍රයන්හී පැවැත්ම නැවත තක්සේරු කර, රීතින් නිර්මාණය කිරීම සහ ඒවායේ පිළිවෙළ විමර්ශනය කිරීමෙන් අනතුරුව විස්තරාත්මක සටහන් කෙටුම්පත් කරන ලදී.

---

[31] *පහත අධ්‍යාපනඥයින් සහ රාජ්‍ය විශේෂඥයින් තම පෞද්ගලික තත්ත්වයෙන් උපදේශනවලට සහභාගි වූහ. අබ්දුල්ලා අද් ඩුවාරි (ඉරානය), පෝල් බර්මන් (එක්සත් රාජධානිය), සාදි කේසි (තුර්කිය), මයිකල් තවුලින් ( ද. අප්‍රිකාව), එඩ්වඩ් කමින්ග්ස් (ඇමරිකා එක්සත් ජනපදය), ඇන්ටෝනියෝ ඩි කාසා (මෙක්සිකෝව), යෝරාම් ඩින්ස්ටන් (ඊශ්‍රාලය), ජීන් මයිකල් ෆවුරි (ප්‍රංශය), විලියම් පෙන්රික් (කැනඩාව), ඔයිටර් ප්ලෙක් (ජර්මනිය), ජුවන් කාර්ලෝස් ගෝමස් රම්රේස් (කොලොම්බියා),ජම්ෂෙඩ් ඒ හමීඩ් (පාකිස්ථානය), අර්ටුරෝ හර්නාන්ඩේස් ඉසවි (මෙක්සිකෝ), ඊබ්‍රාහිම් ඉච්රිස්(ඉතියෝපියාව), හසන් කාසීම් ජුවිනි (ලෙබනන්), කෙනෙත් කීත් (නවසිලන්තය), ගිතු ටුගායි (කෙන්යාව), රේයින් මූලාර්සන් (එස්ටෝනියා), බාරා නියැන්ග් (සෙනගල්), මොහොමඩ් ඔල්වාන් (ජෝර්දාන්), රෝව්ල් සී පන්ගලන්ගන් (පිලිපිනය), ස්ටෙල්යොස් පර්කින් (ග්‍රීසිය), පෝලෝ සර්පියෝ පින්හෙයිරෝ (බ්‍රසීලය), අර්විඩ් ප්ලැන්ඩර් (හංගේරි), පෙම්මරාජු ශ්‍රී නිවාස් රාඕ (ඉන්දියාව), කමීලෝ රයන් රොඩ්‍රිගන් (කොලොම්බියා), අයි.ර්.සාගේ (නයිජිරියාව), හැරල්ඩ් සන්දවාල් (කොලොම්බියා), සොම්බූන් සන්ගියාන්බට් (තායිලන්තය), මාරත් ඒ. සර්සටිබයෙට් (කසකස්ථානය), මුහමද් අසීස් ෂුක්රි (සිරියා), පර්ලගන් සිහොන්බින්ග් (ඉන්දුනීසියාව), ජෙෆ්ර් ජේම්ස් ස්කිලෙන් (ඕස්ට්‍රේලියාව) ගෝෂන් සන් (චීනය), බත්තියර් තස්මුක්හමදෝ (රුසියාව) සහ කැරල් වොෆ්ක් (පෝලන්තය)*

මෙලෙස කෙටුම්පත් කරන ලද ලේඛනය මෙහෙයුම් කමිටුවට, විශේෂඥ කණ්ඩායමට සහ රජයන් හි විශේෂඥයන්ට සහ අන්තර්ජාතික රතු කුරුස සංවිධානයේ නීති අංශයට ඔවුන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී. එලෙස ලද අදහස් සැලකිල්ලට ගනිමින් එම ලේඛනය තවදුරටත් වැඩි දියුණු කර, නිම කරන ලදී.

## සොයාගැනීම් පිළිබඳ සාරාංශය

පොදු 3 වන වගන්තිය ද ඇතුළත් ව, ජිනීවා සම්මුතීන්හි ප්‍රතිපාදනවලින් විශාල ප්‍රමාණයක් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කොටස් බව සලකන ලදී.[32] තවදුරටත්, අද වන විට රාජ්‍යයන් 192ක් ජිනීවා සම්මුතීන්වලට පාර්ශවකරුවන් වන අතර එකී සම්මුතීන්, සම්මුතිමය නීතිය ලෙස ආසන්න වශයෙන් සියලු ම රාජ්‍යයන් වෙත බැඳීම් සහගත බවක් ඇති කරනු ලබයි. එමනිසා, සම්මුතීන්හි පවතින ප්‍රතිපාදනයන්හි චාරිත්‍රානුකූලමය ස්වභාවය මෙම අධ්‍යයනයට විෂය නොවීය. ඒ වෙනුවට මෙකී අධ්‍යයනය විශේෂයෙන් අතිරේක සන්ධානයන්, සංස්කෘතිමය දේපළ ආරක්ෂා කිරීම පිළිබඳ වන හේග් සම්මුතිය සහ ආයුධ භාවිතය පිළිබඳ නීතින් දක්වන විශේෂිත සම්මුතීන් වැනි විශ්වීය වශයෙන් අනුමත නොකරන ලද සම්මුතීන් පිළිබඳ ව පවත්නා ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.

පහත දැක්වෙන චාරිත්‍රානුකූල අන්තර්ජාතික රීතින් පිළිබඳ විස්තරයන් මගින් මෙම රීතින් චාරිත්‍රානුකූල වශයෙන් හඳුනාගනු ලබන්නේ මන්ද යන්න විස්තර කිරීමට උත්සාහ ගන්නේවත්, මෙම නිගමනයට එළඹීමට පදනම් කරගත් පරිචය කවරක් ද යන්න ඉදිරිපත් කරන්නේවත් නැත. මෙම අධ්‍යයනයේ පළමු වෙළුම තුළ, රීතියක් චාරිත්‍රානුකූල වශයෙන් හඳුනාගනු ලබන්නේ ඇයි ද යන්න විස්තර කරන අතර, මෙම අධ්‍යයනයේ දෙවන වෙළුම තුළ ඊට අදාළ පරිචය පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලැබ ඇත.

## අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්

පූර්වයෙන් පැවති චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිමය රීතින් පළමු වන අතිරේක සන්ධානය තුළ සංග්‍රහ ගත කර ඇති අතර නව චාරිත්‍රානුකූල රීතින් නිර්මාණය කිරීමට අදාළ පදනම ද එහි දක්වා ඇත. අධ්‍යයනයේ කාල රාමුව තුළ දී එකතු කරගන්නා ලද පරිචයන් පිළිබඳ තොරතුරු මගින් පළමු වන

---

[32] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, Legality of the Threat or use of Nuclear Wepons, (ඉහත සටහන 8) පි. 257-258 $$ (ජිනීවා සම්මුතියට අදාළව) සහ Case concerning Military and Para Military Activities in against Nicaragua, (12 වන සටහන) පි. 114, $ 218 (පොදු 3 වන වගන්තියට අදාළව)*

අතිරේක සන්ධානය, අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලදී පමණක් නොව අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී ද රාජ්‍ය පරිචය සම්බන්ධයෙන් මහත් බලපෑමක් සිදුකරන බවට සාක්ෂි ඉදිරිපත් කරනු ලබයි. (පහත බලන්න) විශේෂයෙන් පළමු වන අතිරේක සන්ධානයෙහි පවත්නා මූලික මූලධර්මයන් එහි සපථ කිරීම් පිළිබඳ වාර්තාවන් විසින් පිළිබිඹු කරන ප්‍රමාණයට වඩා පුළුල්ව පිළිගැනීමට ලක් වී ඇති බව අධ්‍යයනය මගින් අනාවරණය කරගෙන ඇත.

මෙම අධ්‍යයනය මගින් ඇතැම් නිශ්චිත සම්මුතිමය ප්‍රතිපාදනයන්හි පවත්නා චාරිත්‍රානුකූල ස්වභාවය තීරණය කිරීමට උත්සාහ නොකළ ද බොහෝ චාරිත්‍රානුකූල රීතින් සම්මුතීන්හි අන්තර්ගත නීති ප්‍රතිපාදනයන්ට බොහෝ සෙයින් සර්ව සම හෝ ඉතාමත් සමීප ලෙස සමාන බවක් දරන බව අවසානයේදී පැහැදිලි වී ඇත. මෙලෙස පළමු වන අතිරේක සන්ධානයේ අන්තර්ගත ප්‍රතිපාදනයන්ට සමානතාවයක් දරන චාරිත්‍රානුකූල රීතින්ට උදාහරණයක් වශයෙන්; සිවිල් වැසියන් හා යුද භටයන් වෙන් කොට හඳුනා ගැනීම සහ සිවිල් ඉලක්ක සහ යුද අරමුණු වෙන් කොට හඳුනා ගැනීම පිළිබඳ මූලධර්මය,[33] ඉවක් බවක් නොමැති ප්‍රහාර පිළිබඳ වන තහනම[34], ප්‍රහාරයන්හි සමානුපාතිකභාවයන් පිළිබඳ මූලධර්මය[35], ප්‍රහාරයට සහ එහි ප්‍රතිඵලයන්ට එරෙහි පූර්වාරක්ෂක ක්‍රම ගැනීමට ඇති වගකීම[36] වෛද්‍ය හා ආගමික කණ්ඩායම්වලට, වෛද්‍ය ඒකකයන්ට හා ප්‍රවාහනයන්ට ගරු කිරීමට හා ඔවුන් ආරක්ෂා කිරීමට ඇති වගකීම,[37] මානුෂවාදී සහන කණ්ඩායම් සහ ද්‍රව්‍ය ආරක්ෂා කිරීමට සහ ඒවාට ගරු කිරීමට ඇති වගකීම[38], සහ සිවිල් මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමට ඇති වගකීම[39], වෛද්‍ය රාජකාරීන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීම[40] අනාරක්ෂිත ප්‍රදේශයන්ට සහ යුද මුක්ත කලාපයන්ට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ තහනම[41] ආයුධ බිම තබා තවදුරටත් යුද නොවදින සතුරන්ට සමාව දීම සහ ඔවුන් ආරක්ෂා කිරීමට ඇති වගකීම[42], කුසගින්නේ තැබීමට එරෙහි තහනම[43], සිවිල් ජනතාවගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ඉලක්කවලට ප්‍රහාර එල්ල කිරීමට

---

[33] *බලන්න, Customary International Humanitarian Law, (ඉහත 4 සටහන ) 1 වන වෙළුම, 1 වන සහ 7 වන රීතිය*

[34] *එහිම 11 -13 රීතිය*

[35] *එහිම 14 වන රීතිය*

[36] *එහිම 15 -24 දක්වා රීතින්*

[37] *එහිම 25 සහ 27-30 දක්වා රීතින්*

[38] *එහිම 31 -32 රීතින්*

[39] *එහිම 34 වන රීතිය*

[40] *එහිම 26 රීතිය*

[41] *එහිම 36 -37 රීතින්*

[42] *එහිම 46 -48 රීතින්*

[43] *එහිම 53 රීතිය*

එරෙහි තහනම[44], ලාංඡනයන් අයුතු ලෙස භාවිතය සහ විශ්වාසය භංග කිරීමට එරෙහි තහනම[45], සිවිල් වැසියන් සහ තවදුරටත් යුද භටයන් නොවන තැනැත්තන් විෂයයෙහි ඇති මූලික සුරක්ෂාවන්වලට ගරු කිරීමට ඇති වගකීම[46], අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ වගකීම[47], කාන්තාවන් සහ ළමයින් විෂයයෙහි විශේෂිත ආරක්ෂාවක් සැපයීමට වන වගකීම[48] දැක්විය හැකිය.

## අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්

පසුගිය දශක කීපය පුරාවට අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් තුළ දී මෙබඳු ගැටුම් පවතින විට අන්තර්ජාතික මානුෂවාදී නීතිය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බල කරනු ලබන සැලකිය යුතු පරිචයක් දක්නට ලැබේ. මෙකී පරිචයන් පිළිබඳ දේහය මගින් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී අදාළ වන චාරිත්‍රානුකූල නීතියක් නිර්මාණය කිරීම පිණිස සැලකිය යුතු බලපෑමක් සිදුකරනු ලැබ ඇත. පළමු වන අතිරේක සන්ධානය මෙන්ම දෙවන අතිරේක සන්ධානය ද මෙම පරිචයට ප්‍රබල බලපෑම් ඇති කළ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අද වන විට එහි ප්‍රතිපාදනයන් බොහොමයක් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි කොටසක් වශයෙන් සලකනු ලබයි. දෙවන අතිරේක සන්ධානයෙහි ඇතුළත් ප්‍රතිපාදනයන්ට සමානතා දක්වන චාරිත්‍රානුකූල රීතින්ට උදාහරණ ලෙස සිවිල් වැසියන්ට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ තහනම[49], වෛද්‍ය හා ආගමික පිරිස්වලට, වෛද්‍ය ඒකකයන්ට සහ ප්‍රවාහනයන්ට ගරු කිරීමට හා ඒවා ආරක්ෂා කිරීමට ඇති වගකීම[50], වෛද්‍ය රාජකාරි ආරක්ෂා කිරීම පිළිබඳ වගකීම[51], කුසගින්නේ තැබීමට එරෙහි තහනම[52], සිවිල් ජනතාවගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වන ඉලක්කවලට ප්‍රහාර එල්ල කිරීමට එරෙහි තහනම[53], සිවිල් වැසියන් සහ තවදුරටත් යුද භටයන් නොවන තැනැත්තන් විෂයයෙහි ඇති මූලික සුරක්ෂාවන්වලට ගරු කිරීම පිළිබඳ වගකීම[54], තුවාලකරුවන්, රෝගී වූවන් සහ මුහුදුබත් වූවන් සෙවීමට, ඔවුන්ට ගරු කිරීමට සහ ඔවුන් ආරක්ෂා කිරීමට ඇති වගකීම[55], මිය

---

[44] *එහිම 54 රීතිය*
[45] *එහිම 57 -65 දක්වා රීතින්*
[46] *එහිම 87 -105 දක්වා රීතින්*
[47] *එහිම 117 රීතිය*
[48] *එහිම 134 -137 දක්වා රීතින්*
[49] *එහිම 1 වන රීතිය*
[50] *එහිම 25 සහ 27 -30 දක්වා රීතින්*
[51] *එහිම 26 වන රීතිය*
[52] *එහිම 53 වන රීතිය*
[53] *එහිම 54 වන රීතිය*
[54] *එහිම 87 -105 දක්වා රීතින්*
[55] *එහිම 109 -111 දක්වා රීතින්*

ගිය පුද්ගලයින් සෙවීමට සහ එම මෘතදේහ ආරක්ෂා කිරීම පිළිබඳ වගකීම[56], නිදහස අහිමි කිරීමට ලක් වූ පුද්ගලයන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීම[57], සිවිල් වැසියන් බලහත්කාරයෙන් එහා මෙහා ගෙනයාම පිළිබඳ තහනම[58], කාන්තාවන් සහ ළමයින් විෂයයෙහි විශේෂ ආරක්ෂාවන් සැපයීම[59] දැක්විය හැකිය.

කෙසේ වුවද අභ්‍යන්තර සන්නද්ධ ගැටුම් විධිමත් කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අතිශයින්ම වැදගත් දායකත්වය දෙවන අතිරේක සන්ධානයේ ප්‍රතිපාදනයන්ගෙන් ඔබ්බට විහිදී යයි. සත්‍ය වශයෙන්ම, දෙවන අතිරේක සන්ධානයේහි ඇති මූලික ප්‍රතිපත්තිමය ප්‍රතිපාදනයන්ට වඩා මෙකී පරිචය මගින් වඩාත් සවිස්තරාත්මක, චාරිත්‍රානුකූල රීතින් සැලකිය යුතු ප්‍රමාණයක් නිර්මාණය කර ඇති අතර ඒ අනුව අභ්‍යන්තර සන්නද්ධ ගැටුම් විධිමත් කිරීමෙහිලා පැවති වැදගත් හිස්තැන් ගණනාවක් සම්පූර්ණ කරන ලදී.

උදාහරණ වශයෙන් දෙවන අතිරේක සන්ධානය තුළ අන්තර්ගත වන්නේ එදිරිවාදිකම් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වන මූලික ප්‍රතිපත්තිමය ප්‍රතිපාදනයන් පමණි. එහි 13 වන වගන්තියෙන් දැක්වෙන්නේ " සිවිල් ජනතාව මෙන්ම තනි සිවිල් වැසියන් ද, . . . ඔවුන් සෘජුව යුද්ධයේ කොටස්කරුවන් නොවන තුරාවට ප්‍රහාරයේ අරමුණු නොවිය යුතුය" යනුවෙනි. පළමුවන අතිරේක සන්ධානය මෙන් නොව, දෙවන අතිරේක සන්ධානය තුළ වෙන් කොට හඳුනාගැනීම සහ සමානුපාතිකභාවය පිළිබඳ මූලධර්මයන් සම්බන්ධයෙන් විශේෂිත රීතින් සහ නිර්වචනයන් අන්තර්ගත නොවේ.

කෙසේ වුවද දෙවන අතිරේක සන්ධානය තුළ එදිරිවාදිකම් පවත්වාගෙන යාම විධිමත් කිරීම සම්බන්ධයෙන් වන හිස්තැන් විශාල වශයෙන් රාජ්‍ය පරිචය හරහා සම්පූර්ණ කර ඇති අතර ඒවා පළමුවන අතිරේක සන්ධානයේ රීතින්ට සමගාමී වේ. එහෙත්, ඒවා අදාළ වන්නේ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී අදාළ වන චාරිත්‍රානුකූල නීතියක් වශයෙනි. මෙමගින් එදිරිවාදිකම් පවත්වා ගෙන යන ආකාරය පිළිබඳ මූලික සිද්ධාන්තයන් ආවරණය කරන අතර විශේෂයෙන් ආරක්ෂා කරන ලද පුද්ගලයින් සහ ඉලක්ක මෙන්ම යුද්ධයේ විශේෂ විධික්‍රම සම්බන්ධ රීතින් ද අන්තර්ගත කර ඇත[60].

---

[56] *එහිම 112 -113 දක්වා රීතින්*

[57] *එහිම 118 -119 සහ 121 සහ 125 රීතින්*

[58] *එහිම 129 වන රීතිය*

[59] *එහිම 134 -137 රීතින්*

[60] *බලන්න, උදාහරණය. එහිම 7 -10 දක්වා රීතින් (සිවිල් ඉලක්ක හා යුද ඉලක්ක අතර වෙනස), 11-13 දක්වා රීතින් (වෙනස් කොට නොසලකන ප්‍රහාර), 14 වන රීතිය (ප්‍රහාරයක සමානුපාතිකභාවය), 15-21 දක්වා රීතින් (ප්‍රහාරයක දී පූර්ව ආරක්ෂණ විධි අනුගමනය කිරීම), 22-24 රීතින් (ප්‍රහාරයේ ප්‍රතිඵලවලට*

ඒ ආකාරයෙන්ම දෙවන අතිරේක සන්ධානය තුළ, අවශ්‍යතා සහිත සිවිල් ජනතාව වෙනුවෙන් මානුෂවාදී සහන සැලසීම සම්බන්ධයෙන් ඉතා ම සාමාන්‍ය ප්‍රතිපාදනයන් පමණක් අන්තර්ගත වේ. 18(2) වගන්තිය දක්වන පරිදි "සිවිල් ජනතාව විසින් ඔවුන්ගේ පැවැත්මට අවශ්‍ය අත්‍යවශ්‍ය සැපයීම්වල හිඟ බව හේතු කොටගෙන අනවශ්‍ය දුෂ්කරතාවලින් පීඩා විඳින්නේ නම් . . . කිසිදු අහිතකර වෙන්කර දැක්වීමකින් තොරව සිදු කරනු ලබන, අතිශයින්ම මානුෂවාදී සහ අපක්ෂපාති ස්වභාවයේ සහන ක්‍රියා සිවිල් වැසියන් වෙනුවෙන් සිදුකළ යුතුය."

18(2) වගන්තිය මගින් එබඳු අවශ්‍ය කිරීම් ව්‍යංග වශයෙන් දක්වන බව තර්ක කර සිටිය හැකි වුවද, පළමු වන අතිරේක සන්ධානය මෙන් නොව දෙවන අතිරේක සන්ධානය තුළ මානුෂවාදී සහන සපයන තැනැත්තන් සහ ඉලක්ක වෙත ආරක්ෂාව සැපයීම සහ ගරු කිරීම සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදනයන් අන්තර්ගත නොවන අතර එමගින් අවශ්‍යතා සහිත සිවිල් වැසියන් වෙනුවෙන් මානුෂවාදී සහන සැපයීම පිණිස ඉක්මන් සහ නිර්බාධිත අවකාශයක් සඳහා අවසර ලබාදීමට සහ ඒ සඳහා පහසුකම් සැපයීමටත්, අවසර ලත් මානුෂවාදී සහන සැපයුම් කණ්ඩායම්වලට නිදහසේ ගමන් කිරීමේ අයිතිය තහවුරු කිරීම පිණිසත් ගැටුමේ පාර්ශවයන් වෙත බැඳීමක් ඇති කරනු නොලබයි. කෙසේ වුවද පුළුල් ව පැතිරී යන නියෝජනාත්මක ස්වභාවයේ සහ ඒකාකාරී රාජ්‍ය පරිචයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉහත දක්වන ලද අවශ්‍යතා චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය තුළට ඇතුළත් වී ඇති අතර එබැවින් එකී අවශ්‍යතා අන්තර්ජාතික හා අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් අදාළ වේ.

මේ සම්බන්ධයෙන් සැලකීමේ දී, අතිරේක සන්ධානයන් දෙක තුළ ම සහන ක්‍රියා සැලසීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ගේ කැමැත්ත අවශ්‍ය බව දක්වා තිබුණ ද, එක්රැස් කරන ලද බොහෝමයක් පරිචයන් තුළ එකී අවශ්‍යතාවය පිළිබඳ සඳහන් වී නොතිබිණි.[61] කෙසේ වුවද, අදාළ පාර්ශවයන්ගේ කැමැත්ත රහිතව මානුෂවාදී සංවිධානයකට ක්‍රියාත්මක විය නොහැකි බව එනයින්ම ප්‍රත්‍යක්ෂ වේ. කෙසේ වුවද, එසේ කැමැත්ත ලබා දීම අත්තනෝමතික කරුණු පදනම් කර ගනිමින් ප්‍රතික්ෂේප කළ නොහැකිය. සිවිල් ජනතාව කුසගින්නේ තැබීම සම්බන්ධ තර්ජනයක මුහුණ පා සිටින බව තහවුරු කර තිබේ නම් සහ අපක්ෂපාතීව සහ වෙනස් කොට සැලකීමේ පදනමක් රහිතව සහන සපයන මානුෂවාදී සංවිධානයට අදාළ තත්ත්වයට

---

*එරෙහි පූර්ව ආරක්ෂණ ක්‍රම), 31- 32 රීතීන් (මානුෂවාදී සහන පිරිස් සහ දේපළ), 34 වන රීතිය (සිවිල් මාධ්‍යවේදීන්), 35- 37 රීතීන් (ආරක්ෂිත කලාප), 46-48 රීතීන් (කාර්තුව වැළැක්වීම), 55-56 රීතීන් (මානුෂවාදී සහනයන්ට ප්‍රවේශවීම), සහ 57 - 65 දක්වා රීතීන් (යටවීම).*

[61] *බලන්න, පළමුවන අතිරේක සන්ධානය 70(1) ව්‍යවස්ථාව සහ දෙවන අතිරේක සන්ධානයේ 18(2) ව්‍යවස්ථාව*

ප්‍රතිකර්ම කිරීමට හැකියාවක් ඇත්නම් අදාළ පාර්ශවයන් විසින් කැමැත්ත ලබා දීමට බැඳී සිටියි[62]. අත්තනෝමතික හේතූන් මත කැමැත්ත ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට පාර්ශවයකට නොහැකි වුවද සහන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අදාළ පාර්ශවයට යම් පාලනයක් තිබිය හැකි බවත්, අදාළ මානුෂවාදී සහන කණ්ඩායම්, දේශ සීමාවන්ට ප්‍රවේශ වීම සම්බන්ධ දේශීය නීතීන්ට සහ බලාත්මකව පවත්නා ආරක්‍ෂක අවශ්‍යතාවන්ට ගරු කළ යුතු බවත් රාජ්‍ය පරිචය මගින් හඳුනා ගනු ලැබ ඇත.

## වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය කරුණු

මෙම අධ්‍යයනය හරහා "පරිචය" පැහැදිලි නැති ක්ෂේත්‍රයන් ගණනාවක් හඳුනාගන්නා ලදී. උදාහරණයක් වශයෙන්, "යුද හටයා" සහ "සිවිල් වැසියා" යන වචන අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් තුළ දී පැහැදිලිව නිර්වචනය කර තිබුණ ද[63], අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී, එදිරිවාදිකම් පවත්වා ගෙන යාමේ අරමුණු වෙනුවෙන් අවිගත් විරුද්ධ පාර්ශවයේ සාමාජිකයකු, " සන්නද්ධ හමුදාවක සාමාජිකයකු" වශයෙන් සලකනවාද නැතිනම්, "සිවිල් වැසියකු" වශයෙන් සලකනවාද යන්න සම්බන්ධ පරිචය පැහැදිලි නැත. විශේෂයෙන්, "අවිගත්" ප්‍රතිවිරුද්ධ කණ්ඩායමේ සාමාජිකයන්, සෘජුව යුද්ධයට සම්බන්ධ වීම හේතුවෙන් ප්‍රහාර නිසා තම ආරක්‍ෂාව අහිමි කරගත් සිවිල් වැසියන් ද, නැතහොත්, එවැනි ප්‍රහාරයකට වගකිව යුතු පුද්ගලයන් ද යන්න පැහැදිලි නැත. මෙම අපහැදිලි බව සම්මුතිමය නීතිය තුළින් ද පිළිබිඹු වේ. උදාහරණ වශයෙන් දෙවන අතිරේක සන්ධානයේ බොහෝ ප්‍රතිපාදනවල " සිවිල් වැසියන්", "සිවිල් ජනතාව" යන වචන භාවිත කළ ද ඒ පිළිබඳ නිර්වචනයන් අදාළ දෙවන අතිරේක සන්ධානය තුළ අන්තර්ගත නොවේ[64]. එමෙන්ම අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ පසුකාලීන සම්මුතීන් තුළ ද, සිවිල් වැසියන් සහ සිවිල් ජනතාව යන වචන නිර්වචනය කිරීමක් රහිතව භාවිත කරනු ලබයි[65].

අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් විධිමත් කිරීම සම්බන්ධයෙන් බලපාන එක් අදාළ අවිනිශ්චිත ක්ෂේත්‍රයක් වන්නේ "

---

[62] *බලන්න, යුවෙස් සැන්ඩෝස්, ක්‍රිස්ටෝප් ස්විනර්ස්කි, බෲනෝ ෂිමර්මන් (සංස්කරණය),* Commentary *on the Additional Protocols, අන්තර්ජාතික රතු කුරුස සංවිධානය, ජිනිවා, 1987.* $ 4885 *බලන්න* $ *2805*

[63] *බලන්න,* Customary International Humanitarian Law, *(සටහන 4), 1 වෙළුම 3 වන රීතිය (යුද හටයන්) 4 වන රීතිය (හට පිරිස්) සහ 5 රීතිය (සිවිල් වැසියන් සහ සිවිල් ප්‍රජාව)*

[64] *II වන අතිරේක සන්ධානය, 13-15 ව්‍යවස්ථා සහ 17 -18*

[65] *බලන්න, උදාහරණ: නිශ්චිත සම්ප්‍රදායික අවි පිළිබඳ සම්මුතියේ සංශෝධිත දෙවන සන්ධානයේ 3(7) - දෙවන ව්‍යවස්ථා, එම සම්මුතියේ තුන්වන සන්ධානයේ 2 ව්‍යවස්ථාව, පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීම පිළිබඳ ඔටාවා සම්මුතියේ පූර්විකාව, අන්තර්ජාතික අපරාධ අධිකරණයේ ව්‍යවස්ථාව, 8 (2) (ඉ) (i), (III) සහ* (VIII) *ව්‍යවස්ථා*

සෘජුව එදිරිවාදිකම්වලට සම්බන්ධවීම" යන වාක්‍යාංශය සම්බන්ධයෙන් නිශ්චිත නිර්වචනයක් නොමැති වීමයි. සිවිල් වැසියන් විසින් සතුරු හමුදාවන්හි සෙබළුන්ට හෝ ඔවුන් සතු දේපළවලට එරෙහිව අවි භාවිත කිරීම හෝ සෙසු ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කිරීමේ දී ප්‍රහාරයන්ට එරෙහි ආරක්ෂාව නැති කරගන්නා බව පැහැදිලි සහ අවිවාදිතය. නමුත්, මෙහිදී සැලකිය යුතු රාජ්‍ය පරිචයක් පවතින අතර එමගින් "සෘජු සහභාගීත්වය" යන්න අර්ථ නිරූපණය කිරීම සම්බන්ධයෙන් කිසිදු මග පෙන්වීමක් ලබා නොදේ. උදාහරණ වශයෙන් එම තක්සේරුව සිදු කළ යුතු වන්නේ එක් එක් සිද්ධිය පදනම් කර ගනිමින් හෝ සිවිල් වැසියන් සෘජුව යුද්ධයට සහභාගිවීම මගින් ප්‍රහාරයන්ට එරෙහි ආරක්ෂාව අහිමි කර ගන්නේය යන පොදු රීතිය සරල ලෙස පුනරුච්චාරණය කිරීමෙනි. මේ සම්බන්ධව පවතින ගැටලුව වන්නේ සැකයක් පවත්නා අවස්ථාවක දී පුද්ගලයකු වෙන් කොට හඳුනා ගන්නේ කෙසේද යන්නයි. අවිනිශ්චිතතා හේතුවෙන්, අන්තර්ජාතික රතු කුරුස සංවිධානය විසින් "සෘජු සහභාගීත්වය" යන්න පැහැදිලි කර ගැනීම සඳහා 2003 වර්ෂයෙන් ආරම්භ කරන ලද විශේෂඥ රැස්වීම් මාලාවක් උපයෝගි කර ගන්නා ලදී [66].

තවදුරටත් ප්‍රශ්නගත කිරීම් සඳහා විවෘතව පවත්නා ගැටලුවක් වන්නේ, ප්‍රහාරයක දී සමානුපාතිකභාවය පිළිබඳ සිද්ධාන්තය අදාළ කර ගන්නා ආකාරය හා එහි පරාසය කොපමණ ද යන්නයි. මෙම අධ්‍යයනය හරහා, මෙකී සිද්ධාන්තය සම්බන්ධයෙන් පුළුල් සහායක් පවත්නා බව හෙළිදරව් කළ ද, ඒ තුළින් ද ආනුශංගිකව සිවිල් වැසියන්ට සිදුවන හානිවලට එරෙහිව යුදමය වාසි තුලනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ ව සම්මුතිමය නීතියෙහි සඳහන් වනවාට වඩා පැහැදිලි කිරීමක් සපයනු නොලබයි.

## එදිරිවාදිකම් පවත්වාගෙන යාම පිළිබඳ තෝරා ගත් කරුණු

පළමු වන සහ දෙවන අතිරේක සන්ධානය මගින්, සිවිල් ජනතාවට ඉතා බරපතළ හානි සිදුවිය හැකි ආකාරයේ හානිකර බලයන් මුදාහල හැකි අන්දමේ ප්‍රතිඵල සහිත ප්‍රහාරයක් වන්නේ නම් එකී ප්‍රහාරයේ අරමුණ යුද අරමුණක් වුවද, හානිකර බලයන් අන්තර්ගත ස්ථාන සහ බලාගාර සහිත අරමුණුවලට ප්‍රහාර එල්ල කිරීම තහනම් කරමින් නව රීතින් හඳුන්වා දී ඇත[67]. මෙම විශේෂිත රීතීන්, චාරිත්‍රානුකූල නීතියේ කොටසක් බවට පත්වී තිබේද යන්න අපහැදිලි වුවද, ඒවා හමුදාමය අරමුණු බවට පත්ව ඇති විටදි හානිදායක බලයන් අන්තර්ගත ස්ථාන හා බලාගාරවලට ප්‍රහාර එල්ල කිරීමේ

---

66 *බලන්න, උදාහරණ : අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ යුද්ධයන්ට සෘජුව සහභාගිවීම, අන්තර්ජාතික රතු කුරුස කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව, ජිනිවා, 2003 සැප්තැම්බර් www.icrc.org හි ඇත.*

67 *පළමු වන අතිරේක සන්ධානය, 56(1) ව්‍යවස්ථාව (2 වන ඡේදයේ සඳහන් ව්‍යතිරේකවලට යටත්වය) සහ II වන අතිරේක සන්ධානයේ 15 වන ව්‍යවස්ථාව (කිසිදු ව්‍යතිරේකයක් නොමැතිව)*

ප්‍රතිඵලයක් ලෙස ආනුශංගිකව ඇතිවිය හැකි බරපතල හානි සම්බන්ධ ඉහළ අවදානම පිළිබඳ ව රාජ්‍යයන් තම අවධානය යොමු කරන බව පරිචය මගින් දක්නට ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඕනෑම සන්නද්ධ ගැටුමක දී හානිකර බලයන් මුදා හැරීම වැළැක්වීමට සහ එමගින් අනතුරුව සිවිල් ජනතාව අතර බරපතල හානි උද්ගත වීම වැළැක්වීම පිණිස විශේෂ අවධානයක් යොමු කළ යුතු බව ඔවුන් හඳුනා ගන්නා අතර, මෙම අවශ්‍යතාවය ඕනෑම සන්නද්ධ ගැටුමකට අදාළ වන චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කොටසක් වශයෙන් හඳුනාගනු ලැබේ.

පළමු වන අතිරේක සන්ධානය මගින් හඳුන්වා දුන් තවත් නව රීතියක් වන්නේ, ස්වාභාවික පරිසරයට පුළුල්, දිගු කාලීන සහ බරපතල හානි සිදුකිරීම පිණිස චේතාන්විතව හෝ එසේ සිදුවිය හැකි බවට අපේක්ෂා කළ හැකි ආකාරයේ යුදමය විධික්‍රම භාවිතය තහනම් කිරීමයි. පළමු වන අතිරේක සන්ධානය පිළිගත් දා පටන් මෙම රීතියට රාජ්‍ය පරිචය හරහා පුළුල් සහයෝගයක් ලැබුණු අතර, එය චාරිත්‍රානුකූල නීතිය තුළට අන්තර්ග්‍රහණය වී ඇත. එසේ වුවද, ඇතැම් රාජ්‍යයන් විසින් දිගින් දිගටම ප්‍රකාශ කර සිටින්නේ මෙම රීතිය න්‍යෂ්ටික අවි සම්බන්ධයෙන් අදාළ නොවන බවත්, එබැවින් න්‍යෂ්ටික අවි සම්බන්ධව ඔවුන් මෙකී රීතියෙන් නොබැඳෙන බවත්ය[68]. මෙකී විශේෂිත රීතියෙන් ඔබ්බට යමින් ස්වාභාවික පරිසරය සිවිල් ඉලක්කයක් වශයෙන් සලකන බව අධ්‍යයනය හඳුනාගනු ලබන අතර, එබැවින් ස්වාභාවික පරිසරය සෙසු සිවිල් ඉලක්ක සම්බන්ධයෙන් යෙදිය යුතු බවට අපේක්ෂා කරන සිද්ධාන්ත සහ රීති එනම් විශේෂයෙන් වෙන් කොට හඳුනා ගැනීම පිළිබඳ සිද්ධාන්තය, සමානුපාතිකභාවය පිළිබඳ සිද්ධාන්තය සහ ප්‍රහාරයක දී පූර්ව ආරක්ෂණ විධි අනුගමනය කිරීම ආරක්ෂා කර ඇත. මේ අනුව, යුදමය අරමුණක් නොවන තුරාවට ස්වාභාවික පරිසරයේ කිසිදු කොටසක් ප්‍රහාරයකට ඉලක්කයක් නොවිය යුතු අතර, පරිසරයට ආනුශංගික වශයෙන් හානි කළ හැකි බවට අපේක්ෂා කළ හැකි, යුදමය අරමුණකට එල්ල කරන ප්‍රහාරයක් මගින් ලැබෙන ඍජු හා ප්‍රබල යුදමය වාසින්ට සාපේක්ෂව පරිසරයට වන හානිය වැඩි නම්, එවැනි ප්‍රහාරයන් තහනම් කර ඇත. උදාහරණයක් වශයෙන් න්‍යෂ්ටික ආයුධ පිළිබඳ නඩුවේ දී තම උපදේශාත්මක මතය ප්‍රකාශ කරමින් අන්තර්ජාතික යුක්ති අධිකරණය ප්‍රකාශ කර සිටියේ, "රාජ්‍යයන් විසින්, නීත්‍යානුකූල යුද ඉලක්ක සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නේ සහ සමානුපාතික වන්නේ කුමන දේවල් ද යන්න තක්සේරු කිරීමේ දී පාරිසරික සාධකය ද සැලකිල්ලට ගත යුතුය" යන්නයි[69]. ඊට අමතරව එදිරිවාදිකම් පවත්වාගෙන යාමේ දී පරිසරයට සිදුවිය හැකි ආනුශංගික හානි වළක්වා

---

[68] *බලන්න, Customary International Humanitarian Law,(ඉහත සටහන 4) 1 වෙළුම, 45 වන රීතිය*

[69] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, Legality of the threat or use of Nuclear Weapons, (ඉහත සටහන 8), $ 30*

ගැනීමට සහ ඒවා ඕනෑම අවස්ථාවකදී අවම කිරීමට ගත හැකි සියලුම ආකාරයේ පූර්ව ආරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම ගැටුමට සම්බන්ධ සියලු පාර්ශවයන් වෙතින් අපේක්ෂා කෙරේ. යම්කිසි සන්නද්ධ මෙහෙයුමක් හරහා පරිසරයට සිදුවන හානි පිළිබඳ ව විද්‍යාත්මක නිශ්චිතතාවයක් නොපැවතීම මත අදාළ ගැටුමට සම්බන්ධව පාර්ශවකරුවන්ව ඉහතින් සඳහන් කළ පූර්ව ආරක්ෂණ විධි අනුගමනය කිරීමෙන් මුක්ත කරනු නොලබයි[70].

අතිරේක සන්ධානයන් මගින් ආමන්ත්‍රණය නොකරන ලද ගැටලු කීපයක් පවතී. උදාහරණ වශයෙන් මෙම අතිරේක සන්ධානයන් තුළ සාම සාධක මෙහෙයුම්වලට සම්බන්ධ පුද්ගලයන් හා දේපළ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කිසිදු විශේෂ ප්‍රතිපාදනයන් අන්තර්ගත නොවේ. කෙසේ වුවද, පරිචයන් තුළ එවැනි පුද්ගලයන්ට හා දේපළවලට, සිවිල් වැසියන්ට හා ඔවුන්ගේ දේපළවලට ලබා දෙන ආකාරයේ ආරක්ෂාවක් ලබා දෙනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාරව සාම සාධක මෙහෙයුම්වල යෙදෙන පුද්ගලයන් සහ දේපළ, ප්‍රහාරයන්ට එරෙහිව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වන රීතිය මගින් ඔවුන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ සිවිල් වැසියන් සහ දේපළවලට ලබා දෙන ආරක්ෂාව ලබා ගැනීමට අයිතිය ලබන ප්‍රමාණයට රාජ්‍ය පරිචය තුළින් සංවර්ධනය කරන ලද අතර, එය අන්තර්ජාතික අපරාධ අධිකරණ ව්‍යවස්ථාව තුළ අන්තර්ගත වී ඇත. එය අද වන විට ඕනෑම වර්ගයක සන්නද්ධ ගැටුම්වලට අදාළ වන ආකාරයේ චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කොටසක් බවට පත්වී ඇත[71].

එදිරිවාදිකම් පවත්වා ගෙන යන ආකාරයට අදාළ ගැටලු ගණනාවක් හේග් රෙගුලාසි මගින් විධිමත් කර ඇත[72]. ඒවායේ රීතින් අද වන විට අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් සම්බන්ධ චාරිත්‍රානුකූල නීති වශයෙන් පිළිගනු ලබයි. කෙසේ වුවද, මෙහි ඇතැම් රීතින් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් ද චාරිත්‍රානුකූල නීති ලෙස යෙදෙන බව අද වන විට පිළිගෙන තිබේ. උදාහරණ වශයෙන්, දිගු කලක් තිස්සේ පවත්නා චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ රීතින් මගින්, (1) අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවය මගින් අවශ්‍ය කරන්නේ නම් මිස, ප්‍රතිවාදියෙකුගේ දේපළක් විනාශ කිරීම හෝ අත්පත් කර ගැනීම (2) කොල්ලකෑම් තහනම් කරනු ලැබ තිබේ. මෙය අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට ද සමානව අදාළ වේ. කොල්ලකෑම යනු සතුරාගේ යටත් වැසියන්ගේ පෞද්ගලික දේපළ, පෞද්ගලික

---

[70] *බලන්න,* Customary International Humanitarian Law, *(ඉහත සටහන 4), 1 වෙළුම 44 වන රීතිය*

[71] *එහිම, 33 රීතිය*

[72] *බලන්න, උදාහරණ : නිව්රන්බර්ග්හි අන්තර්ජාතික යුද අධිකරණය,* Case of the major war criminals *නඩු තීරණය, 1946 ඔක්තෝම්බර් 1 දින, නිල ලේඛනය, 1 වෙළුම, පි. 253-254*

හෝ පුද්ගල භාවිතය සඳහා බලහත්කාරයෙන් ලබා ගැනීමයි[73]. මෙකී තහනම් කිරීම් ද්විත්වය සතුරු පාර්ශවයක් සතු යුදමය ආම්පන්න බලෙන් අත්පත් කර ගැනීම (යුද ලුංචිතයන්) පිළිබඳ චාරිත්‍රානුකූල පරිචයට බලපෑම් කරනු නොලබයි.

චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය යටතේ, ඕනෑම සන්නිවේදන මාධ්‍යයක් හරහා ආඥාපතීන්ට එදිරිවාදී නොවන සබඳතාවලට එළඹීමට හැකි අතර එකී සබඳතා සද්භාවය පදනම් කරගෙන සිදුවිය යුතුය. පරිචය දක්වන පරිදි මෙකී සන්නිවේදනයන් පණිවුඩකාර සාම නියෝජිතයන් (Parlementaires) ලෙස හඳුන්වන මැදහත්කරුවන් හරහා සිදුකළ හැකි අතර, දුරකථන, ගුවන්විදුලිය වැනි වෙනත් මාධ්‍ය හරහා ද සිදුකළ හැකිය. පණිවුඩකාර සාම නියෝජිතයකු යනු, ගැටුමෙහි පාර්ශවයකට අයත් පුද්ගලයෙකු වන අතර මොහුට අනෙක් පාර්ශව සමග සන්නිවේදනයන්ට එළඹීම සඳහා අවස්ථා ලබා දී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ තත්ත්වය අනුලංඝනීය වේ. මෙවැනි පුද්ගලයෙකු සාම නියෝජිතයකු වශයෙන් හඳුනාගැනීම පිණිස පැවති සාම්ප්‍රදායික ක්‍රමය වන්නේ ඔහු සුදු කොඩියක් දරා සිටීම වන අතර එම ක්‍රමය අදටත් වලංගු වේ.

මීට අමතරව පාර්ශවයන්ට තෙවන පාර්ශවයක් වෙතින් සන්නිවේදනය පිණිස පහසුකම් සපයන ලෙස ඉල්ලා සිටිය හැකි අතර එය පිළිගත් පරිචයක් වේ. උදාහරණ වශයෙන් ආරක්ෂාව සපයන බල අධිකාරියක් හෝ එයට ආදේශකයෙක් වශයෙන් ක්‍රියාකරනු ලබන අපක්ෂපාති හෝ මධ්‍යස්ථ මානුෂවාදී සංවිධානයක්, විශේෂයෙන් අන්තර්ජාතික රතු කුරුස සංවිධානය වැනි අන්තර්ජාතික සංවිධානයක් හෝ සාම සාධක බලකායක් පෙන්වා දිය හැකිය. එක්රැස් කරන ලද පරිචයන් පෙන්වා දෙනු ලබන්නේ අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී විවිධ ආයතනයන් සහ සංවිධානයන් සාකච්ඡාවල මැදිහත්කරුවන් වශයෙන් කටයුතු කර ඇති බවත් එය පොදුවේ පිළිගෙන ඇති බවත් ය. පණිවුඩකාර සාම නියෝජිතයන්ගේ තත්ත්වය පාලනය කරනු ලබන රීතීන් හේග් රෙගුලාසි දක්වා දිවයන අතර, බොහෝ කාලයක සිට අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වල දී එය චාරිත්‍රානුකූල ලෙස පිළිගනු ලැබ තිබේ. පසුගිය වසර 50ක පමණ කාලයක සිට පැවති පරිචය අනුව එම රීතීන් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී ද චාරිත්‍රානුකූල බවට පත්වී තිබේ[74].

---

[73] *බලන්න, අන්තර්ජාතික අපරාධ අධිකරණයේ අපරාධයන්හි මූලිකාංග, යුද අපරාධයක් වශයෙන් කොල්ලකෑම. අන්තර්ජාතික යුද අපරාධ අධිකරණ ව්‍යවස්ථාවේ 8(2) (ආ) XVi සහ (ඉ) (V) ව්‍යවස්ථා*

[74] *බලන්න, Customary International Humanitarian Law,(ඉහත සටහන 4) 1 වෙළුම, 67-69 රීතීන්*

සංස්කෘතිමය දේපළ ආරක්ෂා කරන නීතියේ සුරක්ෂාවන් ද්විත්වයක්, පරිචය මගින් හෙළිකරනු ලබයි. මින් පළමුවැන්න හේග් රෙගුලාසි දක්වා අතීතයට විහිදෙන අතර, එමගින් යුද අරමුණු නොවන තුරාවට, කලාත්මක, විද්‍යාත්මක, අධ්‍යාපනික හෝ පුණ්‍යමය පරමාර්ථවලට වෙන් වී ඇති ගොඩනැගිලි, ඓතිහාසික ස්මාරක යනාදියට වන හානිය වැළැක්වීම පිණිස විශේෂ අවධානයක් යොමු කළ යුතු බව දක්වයි. තවදුරටත් එවැනි ගොඩනැගිලි සහ ස්මාරකයන් බලෙන් අත්පත් කර ගැනීම, විනාශ කිරීම හෝ චේතනාන්විතව හානි කිරීම තහනම් කර ඇත. මෙම රීතින් දිගු කාලයක් පුරාවට අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලදී චාරිත්‍රානුකූල වශයෙන් සලකනු ලැබූ අතර අද වන විට අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වල දී ද චාරිත්‍රානුකූල ලෙස සලකනු ලැබේ.

දෙවන සුරක්ෂාව පදනම් වන්නේ සංස්කෘතිමය දේපළ සුරක්ෂිත කිරීම පිළිබඳ 1954 හේග් සම්මුතියේ විශේෂ ප්‍රතිපාදනයන් මතය. එමගින් "සෑම පුද්ගලයෙකුගේම සංස්කෘතිකමය උරුමයන් වන සුවිශේෂී වැදගත්කමක් ඇති දේපළ" ආරක්ෂා කරනු ලබන අතර එවැනි දේපළ හඳුනා ගැනීම සඳහා විශේෂිත ලාංඡනයක් හඳුන්වා දී ඇත. අද වන විට චාරිත්‍රානුකූල නීතිය අනුව, යුදමය අවශ්‍යතාවයක් වෙනුවෙන් අත්‍යවශ්‍ය වන්නේ නම් මිස එවැනි දේපළවලට ප්‍රහාර එල්ල කිරීම හෝ ඒවා විනාශ වන ආකාරයේ හෝ හානි වන ආකාරයේ අරමුණුවලට භාවිත නොකළ යුතු බව දක්වා ඇත. තවදුරටත් එවැනි දේපළ සොරකම් කිරීම, කොල්ලකෑම හෝ අයුතු පරිහරණය කිරීම සහ එවැනි දේපළ ද්වේශ සහගත ලෙස විනාශ කිරීමේ ක්‍රියා සිදු කිරීම තහනම් කර ඇත. මෙම තහනම් කිරීම් හේග් සම්මුතියේ ප්‍රතිපාදනයන්ට සමගාමී වන අතර, එම තත්ත්වය එම සම්මුතිය මගින් වැදගත් සංස්කෘතිමය දේපළ සුරැකීම පිළිබඳ රාජ්‍ය පරිචය වෙත සිදු කරන ලද බලපෑම පිළිබඳ සාක්ෂි සපයනු ලබයි.

## අවි ආයුධ

ඕනෑම සන්නද්ධ ගැටුමක් තුළ දී, සීමාව ඉක්මවා යමින් දැඩි විනාශකාරී තුවාල සිදුකරන හෝ අනවශ්‍ය පීඩාවන් ඇති කරන සහ ඉවක් බවක් නොමැති හානි සිදු කරන ස්වභාවයේ අවි ආයුධ භාවිතය තහනම් කිරීමේ පොදු සිද්ධාන්තයන් චාරිත්‍රානුකූල වේ. මීට අමතරව සහ මෙම සිද්ධාන්තයන් මත බහුලව පදනම් වෙමින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතිය යටතේ විශේෂිත අවි ආයුධ ගණනාවක් භාවිත කිරීම හෝ භාවිත කිරීමේ ඇතැම් විධි රාජ්‍ය පරිචය හරහා තහනම් කර ඇත. එනම් විෂ සහිත හෝ විෂ මිශ්‍ර කරන ලද අවි ආයුධ, ජීව විද්‍යාත්මක ආයුධ, රසායනික අවි, යුද විධි ක්‍රමයක් ලෙස කැරලි මර්දන

කාරක, යුද උපක්‍රමයක් ලෙස පළිබෝධනාශක භාවිතය[75], මනුෂ්‍ය ශරීරය තුළට පහසුවෙන් විහිදී යන හෝ සමතලා කරනු ලබන උණ්ඩ භාවිතය, මිනිස් ශරීරය තුළ දී පුපුරා යන පුද්ගල නාශක උණ්ඩ භාවිතය, එක්ස් කිරණ මගින් හෝ හඳුනාගත නොහැකි වන පරිදි මනුෂ්‍ය ශරීරය තුළ තුවාල ඇති කරන ආයුධ භාවිතය, අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ විශේෂිත ආරක්ෂාවට හිමිකම් කියන පුද්ගලයන් හෝ දේපළවලට සවි කළ මර උගුල් හෝ සිවිල් වැසියන් ආකර්ශනය කරගත හැකි ආකාරයේ දේපළවලට අටවන මර උගුල්, සහ තම එකම යුද අරමුණ ලෙස හෝ එක් යුද අරමුණක් ලෙස පුද්ගලයින් අන්ධභාවයට පැමිණිවීම අරමුණු කරගෙන නිර්මාණය කළ ලේසර් අවි භාවිතය නිදසුන් ලෙස දැක්විය හැකිය.

කෙසේ වුවද, චාරිත්‍රානුකූල නීතිය මගින් තහනම් නොකරන ලද ඇතැම් ආයුධ සීමා කිරීම්වලට යටත් වී තිබේ. උදාහරණ වශයෙන් බිම් බෝම්බ සහ ගිනි අවුලවන සුළු ආයුධ පෙන්වා දිය හැකිය.

බිම් බෝම්බවල ඇති වෙන් කොට හඳුනා ගැනීමට නොහැකි ස්වභාවයේ බලපෑම අවම කිරීම පිණිස විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. උදාහරණ වශයෙන් ගැටුමට සම්බන්ධ පාර්ශවකරුවන් විසින් තමන් විසින් අටවනු ලබන බිම් බෝම්බ ස්ථානගත කිරීම් පිළිබඳ වාර්තාවක් හැකිතාක් දුරට තබා ගැනීම පිළිබඳ සිද්ධාන්තය මේ තුළ අන්තර්ගත වේ. තවද, සක්‍රිය එදිරිවාදිකම් අවසාන වීමෙන් පසුව, බිම් බෝම්බ භාවිත කරන ලද යුද්ධයේ පාර්ශවයන් විසින් එකී බිම් බෝම්බ ඉවත් කිරීම හෝ එමගින් සිවිල් වැසියන්ට හානි නොවන තත්ත්වයට පත් කිරීම හෝ ඒවා ඉවත් කිරීමට පහසුකම් සැලසිය යුතුය.

රාජ්‍යයන් 140ක් ඉක්මවමින් සපථ කළ ඔටාවා සම්මුතිය යටතේ බහුතරයක් රාජ්‍යයන් පුද්ගල නාශක බිම් බෝම්බ භාවිත කිරීම, නිෂ්පාදනය කිරීම, තොග රැස්කර තබා ගැනීම සහ ප්‍රවාහනය කිරීම තවදුරටත් සිදු නොකිරීමට සම්මුතිමය වශයෙන් බැඳීමට ලක් වි ඇත. අද වන විට මෙම තහනම් කිරීම චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කොටසක් නොවන්නේ ඒ සම්බන්ධයෙන් ඇති ප්‍රතිවිරුද්ධ පරිචය හේතුවෙනි. සම්මුතියට පාර්ශවයක් නොවන රාජ්‍යයන් සියල්ලම පාහේ ප්‍රතිවිරුද්ධ පරිචයක් දක්වන අතර වහාම

---

[75] *මෙම රීතිය තුළ චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ ඇති වෙනත් රීතින් ගණනාවකට සබඳතාවයක් ඇතුළත් වී ඇත. නම් වශයෙන් ගත් කළ ජීව විද්‍යාත්මක සහ රසායනික අවි භාවිතය තහනම් කිරීම; හමුදාමය ඉලක්කයක් නොවන පුද්ගල වාසස්ථානයන්ට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම තහනම්; ප්‍රහාරයෙන් ලැබෙන ප්‍රබල සහ සෘජු ප්‍රතිලාභයන්ට සාපේක්ෂව එමගින් සිදු වෙතැයි බලාපොරොත්තු වන අතුරු හානි වශයෙන් සිවිල් ජීවිත අහිමි වීම, සිවිල් වැසියන්ට තුවාල සිදුවීම, සිවිල් දේපළවලට හානි සිදුවීම හෝ ඒ සියල්ලෙහි එකතුවෙහි හානිය ප්‍රබල නම් එම ප්‍රහාර තහනම් වේ; සහ ස්වාභාවික පරිසරයට පුළුල් දිගු කාලීන සහ බරපතළ හානි සිදු කිරීම තහනම් වේ. බලන්න එහිම, 76 වන රීතිය*

ක්‍රියාත්මක වන පරිදි මෙම තහනම පිළිගැනීමට කැමැත්තක් නොදක්වන රාජ්‍යයන් සහ ඔටාවා සම්මුතියට පාර්ශවයක් නොවන රාජ්‍යයන් විසින් පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය ක්‍රමිකව තුරන් කිරීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබේ.

තැනැත්තෙකු අවි බිම තැබූ අයෙකු (*hors de combat*) බවට පත් කිරීම සඳහා හානිදායක බවෙන් අඩු ආයුධයක් භාවිත කිරීම පහසු නොවන අවස්ථාවකදී හැර පුද්ගල නාශක ගිනි අවුලවන සුළු ආයුධ භාවිතය තහනම් වේ. මෙයට අමතරව, එම ආයුධ භාවිත කරන්නේ නම්, සිවිල් වැසියන්ගේ ජීවිතවලට සිදුවන ආනුශංගික හානි, සිවිල් වැසියන්ට සිදුවන තුවාල සහ සිවිල් ඉලක්කවලට සිදුවන හානි වැළැක්වීමට හෝ යම් විටෙකදී අවම කිරීමට විශේෂිත අවධානයක් දැක්විය යුතුය.

අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලට පමණක් ඉහත දී අදාළ වූ සම්මුතිමය ප්‍රතිපාදනයන්ට මෙම රීතීන් බොහොමයක් සමානත්වයක් දක්වයි. මෙම රටාව ක්‍රමිකව ආපසු හැරවී තිබෙන අතර, නිදසුනක් ලෙස අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් කෙරෙහි ද අදාළ වන 1996 ඇතැම් සාම්ප්‍රදායික ආයුධ පිළිබඳ සම්මුතියේ දෙවන  සන්ධානයට මැතක දී I – IV දක්වා අතිරේක සන්ධානවල පරාසය අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් කෙරෙහි යෙදීම දක්වා පුළුල් කරමින් 2001දී ඇතැම් සාම්ප්‍රදායික ආයුධ පිළිබඳ සම්මුතියට ඇති කළ සංශෝධනය පෙන්වා දිය හැකිය. ඉහත සඳහන් කළ චාරිත්‍රානුකූල තහනම් කිරීම් සහ සීමා කිරීම් ඕනෑම වර්ගයක සන්නද්ධ ගැටුමකට අදාළ වේ.

අන්තර්ජාතික රතු කුරුස සංවිධානයට චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ අධ්‍යයනයෙහි වගකීම භාර ගැනීමේ කාර්යය ලැබෙන අවස්ථාව වන විට අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින්, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ඉල්ලා සිටින ලද උපදේශාත්මක මතයක් ඉදිරිපත් කිරීම පිණිස න්‍යෂ්ටික ආයුධ භාවිතය සහ ඉන් උද්ගත වන තර්ජනයේ නෛතිකභාවය පිළිබඳව සලකා බලමින් සිටින ලදී. එබැවින් ඒ පිළිබඳ තම මතය ප්‍රකාශ කර සිටීමෙන් වැළකීමට අන්තර්ජාතික රතු කුරුස සංවිධානය තීරණය කරන ලදී. තම උපදේශාත්මක මතය ප්‍රකාශ කරමින් අන්තර්ජාතික යුක්ති අධිකරණය ඒකමතිකව ප්‍රකාශ කර සිටියේ "න්‍යෂ්ටික අවි භාවිතය හෝ තර්ජනය කිරීම සන්නද්ධ ගැටුම්වලට අදාළ අන්තර්ජාතික නීතියේ, විශේෂයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ, රීතීන් සහ මූලධර්ම සමග අනුකූල විය යුතු බවයි[76]."

---

[76] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, Legality of the Threat or Use of Nuclear Weapons,(බලන්න සටහන 8) පි. 226*

මෙම තොරතුරු ඉතාමත් වැදගත් වේ. එනම් පළමු වන අතිරේක සන්ධානය පිළිබඳ සාකච්ඡාවලට බොහොමයක් රාජ්‍ය එලැඹියේ එම සන්ධානය න්‍යෂ්ටික අවිවලට අදාළ නොවන බවට වන අවබෝධය සහිතවය. කෙසේ වුවද, අධිකරණයේ මතය අනුව එදිරිවාදිකම් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වන රීති සහ අවි භාවිතය සම්බන්ධයෙන් වන පොදු සිද්ධාන්තයන් න්‍යෂ්ටික අවි භාවිතය සම්බන්ධයෙන් ද අදාළ විය යුතු බව අදහස් වෙයි.

මෙම මූලධර්මයන් සහ රීතින් අදාළ කරගනිමින් අධිකරණය ප්‍රකාශ කර සිටියේ, "න්‍යෂ්ටික අවි භාවිතය හෝ තර්ජනය කිරීම අවි ගැටුම් සම්බන්ධයෙන් වන අන්තර්ජාතික නීතියේ රීතින්ට පටහැනි වන බවත්, විශේෂයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීතින්ට පටහැනි වන බවත්ය.[77]"

## මූලික සුරක්ෂාවන් (Fundamental Guarantees)

මූලික සුරක්ෂාවන්, ගැටුමට සම්බන්ධ පාර්ශවයක බලය තුළ සිටින සියලුම සිවිල් වැසියන්ටත්, ගැටුම්වලට සෘජුව සම්බන්ධ නොවූ හෝ තවදුරටත් සම්බන්ධවීම අතහැර තිබෙන සියලුම තැනැත්තන්ටත් (*hors de combat*) අදාළ වේ. මන්දයත්, මූලික සුරක්ෂාවන් සියලුම පුද්ගලයන්ට අදාළ වන පුළුල් රීතින් වන බැවින් ඒවා අධ්‍යයනය තුළ දී නැවත අනු කොටස්වලට බෙදා දක්වමින් එක් එක් වර්ගවල පුද්ගලයන්ට අදාළ වන විශේෂිත රීතින් වශයෙන් අධ්‍යයනය කරනු නොලැබේ.

මෙම මූලික සුරක්ෂාවන් සියල්ලට, අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වන අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ශක්තිමත් බලපෑමක් ඇත. මෙම අධ්‍යයනය තුළ දී, මූලික සුරක්ෂාවන් වලට සම්බන්ධ බොහොමයක් රීතින් සාම්ප්‍රදායික මානුෂවාදී නීතියට විශේෂ වූ භාෂාවකින් පෙළ ගස්වන ලදී. ඒ මන්දයත්, එමගින් ඊට සමගාමී චාරිත්‍රානුකූල රීතිය වඩාත් හොඳින් පිළිබිඹු වන බැවිනි[78].

---

[77] *එහිම, බලන්න, එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය, 51 වන සැසිවාරය, පළමු කමිටුව, අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ ප්‍රකාශය,* UN DOC A/C.1/51/PV.8, *1996 ඔක්තෝබර් 18, 10 වන පිටුව. ප්‍රතිනිෂ්පාදනය අන්තර්ජාතික රතු කුරුස ශාස්ත්‍රීය සඟරාව,* No. 316,1997,118-119 *පිටු (අන්තර්ජාතික නීතියේ රීතින් සමග න්‍යෂ්ටික අවි භාවිතය සමපාත වන්නේ කෙසේද යන්න විදහා දැක්වීම අපහසු වේ.)*

[78] *මෙම රීතින් තුළ මූලික සහතික කිරීම් ඇතුළත් වේ. සිවිල් වැසියන් සහ* hors de combat *නම් භටයන්ට ප්‍රතිවිරුද්ධ වෙනස් කිරීමක් රහිතව මානුෂිය වශයෙන් සැලකීම ; මිනී මැරීම තහනම් කිරීම; වද හිංසාවට ලක් කිරීම තහනම් කිරීම; මානව ගරුත්වයට එරෙහි කෲර හා අමානුෂිය සහ අහිතකර ලෙස සැලකීම තහනම්; විශේෂයෙන් අපහාසාත්මක හා පහත් ලෙස සැලකීම තහනම් කිරීම; ශාරීරික වද හිංසාව තහනම් කිරීම; වෛද්‍ය හෝ විද්‍යාත්මක පර්යේෂණවලට යොදා ගැනීම තහනම්, ස්ත්‍රී දූෂණය හෝ වෙනත් ආකාරවල ලිංගික ප්‍රචණ්ඩත්වය තහනම්, වහල් භාවය සහ සියලුම ආකාරයේ වහල් වෙළඳාම තහනම්, ප්‍රාණ ඇපකරුවන් බවට පත් කිරීම තහනම්, මිනිස් පලිහක් වශයෙන් භාවිතය තහනම්, සාධාරණ නඩු*

කෙසේ වුවද, සමහර රීතින් විශේෂිත විෂයයන්ට සම්බන්ධ සවිස්තරාත්මක ප්‍රතිපාදන රාශියක හරය ග්‍රහණය කර ගැනීම පිණිස කෙටුම්පත් කරන ලදී. එනම්, විශේෂයෙන්ම වන්දි නොගෙවන හෝ අයුතු ලෙස ලබා ගන්නා බලහත්කාර සේවයේ යෙදවීම්, බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම, සහ අත්තනෝමතිකව රඳවා තබා ගැනීම තහනම් කිරීමට අදාළ රීතින් සහ පවුල් ජීවිතයට ගරු කිරීම පිළිබඳ රීතිය[79] යනාදියයි.

අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යයනය තුළට විශේෂයෙන්ම මූලික සුරක්ෂාවන් සම්බන්ධයෙන් වන පරිච්ඡේදයට, අන්තර්ජාතික මානව හිමිකම් නීතිය යටතේ වන පරිචය ඇතුළත් කර තිබේ. මෙය සිදුකරනු ලැබුවේ අන්තර්ජාතික මානව හිමිකම් නීතිය පිළිබඳ සම්මුතීන්හි ප්‍රකාශිතව සඳහන් වන ආකාරයට අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සන්නද්ධ ගැටුම් සමයන්ටද තවදුරටත් අඛණ්ඩව අදාළ වන බැවිනි. එහෙත් පොදු හදිසි අවස්ථා තත්ත්වයන්වලදී ඇතැම් ප්‍රතිපාදනයන් යම් යම් කොන්දේසිවලට යටත්ව සීමා කිරීම්වලට නතු වේ. සන්නද්ධ ගැටුම් අතරතුර මානව හිමිකම් නීතියේ අදාළත්වයේ අඛණ්ඩතාවය අවස්ථාවන් ගණනාවකදී රාජ්‍ය පරිචය විසින් ද මානව හිමිකම් ආරක්ෂා කරන දේහයන් විසින් ද, අන්තර්ජාතික යුක්ති අධිකරණය විසින් ද තහවුරු කර ඇත[80]. ඉතාමත් මෑතකාලීනව අත්පත් කරගත් පලස්තීන දේශ භූමිය හරහා තාප්පයක් බැඳීම පිළිබඳ ව වන උපදේශාත්මක මතයක් ඉදිරිපත් කිරීම සම්බන්ධ නඩුවේ දී අධිකරණය ප්‍රකාශ කර සිටියේ, "සන්නද්ධ ගැටුම් තත්ත්වයකදී මානව හිමිකම් සම්මුතිය මගින් ලබා දෙන ආරක්ෂාව අවසානයට පත් නොවන බව" සහ ඇතැම් අයිතිවාසිකම් අත්‍යන්තයෙන්ම අන්තර්ජාතික මානුෂවාදී නීතියට අදාළ හෝ මානව හිමිකම් නීතියට අදාළ ගැටලු විය හැකි අතර අන්තර්ජාතික නීතියේ ඉහත කී අංශ දෙකටම අදාළ පොදු අයිතීන් පිළිබඳ ගැටලු විය හැකි බවයි.[81] කෙසේ වුවද, මෙම අධ්‍යයනය මගින් චාරිත්‍රානුකූල මානව හිමිකම් නීතිය පිළිබඳ ඇගයුමක් ඉදිරිපත් කරනු නොලබයි. ඒ වෙනුවට අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ පැහැදිලි මූලධර්මයන්ට සහාය දැක්වීම, ශක්තිමත් කිරීම සහ පැහැදිලි කිරීම පිණිස මානව හිමිකම් නීතිය යටතේ වන පරිචයන් ද අන්තර්ගත කර ඇත.

---

*විභාගය තහවුරු කිරීම, සාමූහික දඬුවම් තහනම් කිරීම සහ මතයන්ට සහ ආගමික චාරිත්‍රයන්ට ගරු කිරීම, බලන්න, Customary International Humanitarian Law,(ඉහත සටහන 4) 1 වෙළුම, 87-94, 96-97 සහ 100 -104*

[79] *එහිම, 95-99 සහ 105 රීතින්*

[80] *එහිම, 32 පරිච්ඡේදයෙහි හැඳින්වීම, මූලික සහතික කිරීම*

[81] *අන්තර්ජාතික යුක්ති අධිකරණය, Legal Consequences of the Construction of a Wall in the Occupied palestinian Territory, උපදේශාත්මක මතය, 2004. ජූලි 9 $ 106*

## ක්‍රියාවට නැංවීම

අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාවට නැංවීම පිළිබඳ රීතීන් ගණනාවක් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියේ කොටසක් බවට පත් වී ඇත. විශේෂයෙන්, ගැටුමෙහි සෑම පාර්ශවයක්ම තම සන්නද්ධ හමුදාවන් සහ එහි උපදෙස් මත ක්‍රියාකරන වෙනත් පුද්ගලයන්, කණ්ඩායම් හෝ එහි මග පෙන්වීම් යටතේ සහ පාලනය යටතේ වන පුද්ගලයන් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කරන බව සහතික කළ යුතුය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගැටුමෙහි සෑම පාර්ශවයක්ම සන්නද්ධ ප්‍රතිවාදී කණ්ඩායම් ද ඇතුළත්ව, අන්තර්ජාතික මානුෂවාදී නීතිය සම්බන්ධ උපදෙස් තම හමුදාවන්ට ලබා දිය යුතුය. මෙකී පොදු වගකීම්වලට අමතරව රාජ්‍යයන් බැඳීමට යටත් වන සෙසු විශේෂිත ක්‍රියාවට නැංවීමේ යාන්ත්‍රණයන් මගින් කෙතරම් දුරට ප්‍රතිවාදී සන්නද්ධ කණ්ඩායම් බැඳීමට ලක්වනවා ද යන්න එතරම් පැහැදිලි නැත. උදාහරණයක් වශයෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීම තහවුරු කිරීම පිණිස තම හමුදාවන් වෙත නියෝග නිකුත් කිරීමට සහ උපදෙස් ලබා දීමට ඇති වගකීම, පැහැදිලිවම අන්තර්ජාතික නීතිය යටතේ රාජ්‍යයන් වෙත පවරා තිබුණ ද ප්‍රතිවාදී සන්නද්ධ කණ්ඩායම් වෙත එසේ වගකීමක් පවරා නොමැත. එමෙන්ම, අවශ්‍ය අවස්ථාවන්වලදී අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ කර ගැනීමේ සුදුසු ප්‍රමාණය පිළිබඳ ව හමුදා ආඥාපතිවරුන්ට අවශ්‍ය අවස්ථාවන්වල දී උපදෙස් දීම පිණිස රාජ්‍යයන් වෙත වගකීමක් පවරා තිබුණ ද, ප්‍රතිවාදී සන්නද්ධ කණ්ඩායම් වෙත එවැනි වගකීමක් පවරා නොමැත.

තවදුරටත් රාජ්‍ය වෙත ආරෝපණය කළ හැකි ආකාරයේ අන්තර්ජාතික මානුෂවාදී නීතීන් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් රාජ්‍යයන් වගකීමට යටත් වන අතර එකී උල්ලංඝනය කිරීම් හේතුවෙන් ඇති වන හානීන් හෝ තුවාල සඳහා සම්පූර්ණ හානි පූරණයක් සිදු කිරීම අවශ්‍ය වේ. කෙසේ නමුත් ප්‍රතිවිරුද්ධ සන්නද්ධ කණ්ඩායම් විසින් තම සාමාජිකයින් විසින් සිදු කරනු ලැබූ එවැනි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ඒ හා සමාන වගකීමක් දරනවා ද යන්න එතරම් පැහැදිලි නොමැති අතර, එවැනි වගකීමක ආනුශංග කවරක්ද යන්න ද පැහැදිලි නැත. ඉහත සඳහන් කළ ආකාරයට ප්‍රතිවිරුද්ධ සන්නද්ධ කණ්ඩායම් අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කළ යුතු අතර ඔවුන් " වගකිව යුතු අණදීම්" යටතේ ක්‍රියාකළ යුතුය[82]. එහි ප්‍රතිඵලයක් වශයෙන් එබඳු කණ්ඩායම් සැදුම් ලබන එහි සාමාජිකයෙකුගේ ක්‍රියාවන් සඳහා අදාළ ප්‍රතිවිරුද්ධ සන්නද්ධ කණ්ඩායම් වගකීමට ලක්වන බවට තර්ක කළ හැකිය. කෙසේ වුවද, එවැනි වගකීමක අතුරු ප්‍රතිඵල වන්නේ කවරේද යන්න පැහැදිලි

[82] *දෙවන වන අතිරේක සන්ධානය, 1 (1) ව්‍යවස්ථාව*

නැත. විශේෂයෙන්, බොහෝ රටවල වැරදිකරුට එරෙහිව වින්දිතයාට වන්දි ලබා ගැනීම වෙනුවෙන් සිවිල් නඩුකරයක් ගෙන ආ හැකි වුවද, අදාළ ප්‍රතිවිරුද්ධ සන්නද්ධ කණ්ඩායම් කවර ප්‍රමාණයකට හානි පූරණය කිරීම සඳහා වගකීමකට යටත්වනවා ද යන්න පැහැදිලි නැත.

තනි පුද්ගල වගකීම පිළිබඳව සලකා බැලීමේදී, අන්තර්ජාතික මානුෂවාදී නීතිය යුද අපරාධ සිදු කිරීම සම්බන්ධයෙන්, එම අපරාධය සිදුකළ පුද්ගලයා, ඒ සඳහා අණ දුන් පුද්ගලයා හෝ අණ දෙන්නෙකු ලෙස හෝ ඉහළ නිලධාරියෙකු ලෙස වෙනත් ලෙසකින් වගකීමට යටත් වන්නා වූ පුද්ගලයාට ආදි සියලුම තැනැත්තන්ට අපරාධ වගකීම පවරනු ලබයි. යුද අපරාධ පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම එනම්, යුද අපරාධ පිළිබඳව විමර්ශනය කර සැකකරුවන්ට නඩු පැවරීම සම්බන්ධ නීති පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම රාජ්‍ය වෙත පවරා ඇත. රාජ්‍යයන් මගින් ඒ සඳහා අන්තර්ජාතික හෝ මිශ්‍ර විනිශ්චයක පර්ෂද පිහිටුවා මෙම වගකීම ඉටුකළ හැකිය.

## නිගමනය

මෙම අධ්‍යයනය මගින් අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි එක් එක් සම්මුතිමය රීතියෙහි පවත්නා චාරිත්‍රානුකූල ස්වභාවය තීරණය කිරීමට උත්සාහ නොකළ අතර, එමගින් රාජ්‍ය පරිචය මත පදනම් වෙමින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙන් කවර රීතින් ප්‍රමාණයක් අනුමත කළ හැකි ද යන ගැටලුව විසඳීමට උත්සාහ කරන ලදී. කෙසේ වුවද, මෙකී අධ්‍යයනයේ ඇතැම් කරුණු සම්බන්ධයෙන් කළ දළ විශ්ලේෂණයේදී දක්නට ලැබුනේ, සම්මුති නීතියේ මූලධර්ම හා රීතින් රාජ්‍ය පරිචය හරහා පුළුල් ලෙස පිළිගැනීමට ලක්වී ඇති බවත්, ඒ හරහා චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියක් නිර්මාණය කිරීම පිණිස විශාල බලපෑමක් සිදුකර ඇති බවත්ය. මෙකී මූලධර්මයන් හා රීතින් බොහොමයක් අද වන විට චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි කොටසක් බවට පත්වී ඇත. එමෙන්ම, ඒවා සම්මුතිය අපරානුමත කිරීම යන සාධකය නොසළකා සියලුම රාජ්‍යයන් වෙත බැඳීම් සහගත වන අතර, අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට සම්බන්ධ වෙන සියලුම පාර්ශවයන් වෙත අදාළ වන රීතින් සම්බන්ධව ගත් කළ ප්‍රතිවාදී සන්නද්ධ කණ්ඩායම් කෙරෙහි ද බැඳීම් සහගත වේ.

මෙම අධ්‍යයනය මගින් චාරිත්‍රානුකූල අන්තර්ජාතික නීතියෙහි බොහෝ රීතින් අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වන බව පෙන්වා දෙන අතර, රාජ්‍ය පරිචය පවත්නා සම්මුතිමය නීතින්ගෙන් ඔබ්බට ගොස් ඇති ප්‍රමාණය සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට ද අදාළ වන පරිදි රීතින් පුළුල් කර ඇති ආකාරය ද පෙන්වා දේ. එබැවින්

එදිරිවාදිකම් පවත්වා ගෙන යන ආකාරය සහ අභ්‍යන්තර සන්නද්ධ ගැටුම්වලදී පුද්ගලයන්ට සලකන ආකාරය විධිමත් කිරීම පිළිබඳ කරුණු සම්මුතීන්හි පවතිනවාට වඩා විස්තරාත්මක සහ සම්පූර්ණ වේ. මෙකී වඩා විස්තරාත්මක සහ සම්පූර්ණ රෙගුලාසි ප්‍රමාණවත් ද නැතිනම් තවදුරටත් වර්ධනය වීම අවශ්‍ය ද යන්න මානුෂවාදී සහ හමුදාමය දෘෂ්ඨි කෝණයකින් තවදුරටත් විමර්ශනය කර බැලිය යුතුය.

සම්මුති රීතින් සම්බන්ධිත තත්ත්වය මෙන්ම, චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි රීතින් ද ව්‍යාප්ත කිරීම, පුහුණු කිරීම සහ බලාත්මක කිරීම මගින් ප්‍රතිඵලදායක ලෙස ක්‍රියාවට නැංවිය යුතුය. මෙම රීතින් මෙයට පෙර එසේ ඇතුළත් කර නොමැති නම්, හමුදා සංග්‍රහයන් සහ ජාතික ව්‍යවස්ථාවන් තුළට ඇතුළත් කළ යුතුය.

අධ්‍යයනය මගින් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී දක්නට ලැබෙන "සිවිල් වැසියා" යන්නෙහි නිර්වචනය, එදිරිවාදිකම්වලට ඍජුව සහභාගීවීම පිළිබඳ සංකල්පය සහ සමානුපාතිකභාවය පිළිබඳ සිද්ධාන්තයේ පරාසය සහ අදාළත්වය වැනි තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය ගැටලු පිළිබඳ ව ද අනාවරණය කරයි.

මේ දක්වා ලද ජයග්‍රහණයන් සහ තවදුරටත් කළ යුතුව පවත්නා කාර්යයන් අනුසාරයෙන් විමසීමේ දී මෙම අධ්‍යයනය අවසානයක් ලෙස නොව, අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි රීතින් සහ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමේ සහ එකඟතාවයට පැමිණීම පිළිබඳ නව ක්‍රියාවලියක ආරම්භයක් ලෙස සැලකිය යුතුය. මෙම ක්‍රියාවලිය තුළ මෙම අධ්‍යයනය නීතිය ක්‍රියාවට නැංවීම, පැහැදිලි කිරීම සහ හැකි සංවර්ධනයක් කිරීම පිළිබඳ ඵලදායි සාකච්ඡාවක් සහ සංවාදයක් ඇති කිරීම පිණිස වන පදනමක් නිර්මාණය කිරීමට යොදා ගත හැකිය.

# *ඇමුණුම* : අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතීන් අඩංගු ලැයිස්තුව*

චාරිත්‍රානුකූල අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ අධ්‍යයනයේ පළමු වෙළුමෙහි අන්තර්ගත නිගමනයන් මත මෙම ලැයිස්තුව පදනම් වී තිබේ. අන්තර්ජාතික මානුෂවාදී නීතියේ එක් එක් සම්මුතිමය රීතියේ චාරිත්‍රානුකූල ස්වභාවය නිශ්චය කිරීම අධ්‍යයනයෙහි අරමුණ නොවූ හෙයින් පවතින සම්මුතීන්හි ආකෘතිය මෙමගින් අනුගමනය කර නොමැත. රීතීන් යෙදෙන විෂය ක්ෂේත්‍රය වරහන් මගින් දක්වා තිබේ. "අජායුගැ" යන කෙටි යෙදුම අන්තර්ජාතික සන්නද්ධ ගැටුම්වලට අදාළ වන චාරිත්‍රානුකූල රීතීන් දක්වන අතර "අජානොයුගැ" යන කෙටි යෙදුම අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වන චාරිත්‍රානුකූල රීතීන් දක්වයි. ඇතැම් රීතීන් සමග පසුව දක්නට ලැබෙන "තර්ක කළ හැකි ආකාරයට" යන යෙදුම මගින් අදහස් වන්නේ අදාළ පරිචය පොදුවේ එම දිශාවට යොමු වුවද එතරම් පුළුල්ව දක්නට නොලැබෙන බවයි.

## <u>අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි චාරිත්‍රානුකූල රීතීන්</u>

### වෙන්කොට හඳුනාගැනීම පිළිබඳ සිද්ධාන්තය

#### සිවිල් වැසියන් සහ සටන් කරුවන් අතර වෙනස

1 **වන රීතිය.** (සන්නද්ධ) ගැටුමට පාර්ශවකරුවන් සියලු ම අවස්ථාවන් වලදී සිවිල් වැසියන් සහ යුද සෙබළුන් වෙන්කොට හඳුනා ගත යුතුය. යුද සෙබළුන්ට එරෙහිව පමණක් ප්‍රහාර එල්ල කළ හැකිය. සිවිල් වැසියන්ට එරෙහිව ප්‍රහාර එල්ල නොකළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)
2 **වන රීතිය.** සිවිල් ජනතාව අතර භීතිය පැතිරවීම මූලික අරමුණ කරගත් ප්‍රචණ්ඩ ක්‍රියා කිරීම හෝ තර්ජනයන් කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)
3 **වන රීතිය.** වෛද්‍ය හා ආගමික කාර්ය මණ්ඩල හැර, ගැටුම්වලට පාර්ශවයක් වී සිටින සන්නද්ධ හමුදාවන්හි සියලු ම සාමාජිකයන් යුද සෙබළුන් වේ. (අජායුගැ)
4. **වන රීතිය.** සන්නද්ධ ගැටුමට පාර්ශවයන් වන සන්නද්ධ හමුදා, සියලු ම සංවිධානාත්මක සන්නද්ධ හමුදා, කණ්ඩායම් සහ ඒකකවලින් සමන්විත වන

---

* අන්තර්ජාතික මානුෂවාදී නීතියේ චාරිත්‍රානුකූල රීතීන් පිළිබඳ ලැයිස්තුවේ පරිවර්තනය ආචාර්ය නොයෙල් ඩයස් පියතුමන් විසින් පරීක්ෂා කරන ලදී.

අතර එම හමුදා තම යටත් භටයන්ගේ හැසිරීම් සම්බන්ධයෙන් එම පාර්ශවයට වගවීමේ ආඥාවකට යටත් වෙති. (අජායුගැ)

**5 වන රීතිය.** සිවිල් වැසියන් යනු සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන් නොවන පුද්ගලයන් ය. සිවිල් ජනතාව සිවිල් වැසියන් වන සියලු ම තැනැත්තන්ගෙන් සමන්විත වේ. (අජායුගැ/අජානොයුගැ)

**6 වන රීතිය.** සෘජුව එදිරිවාදිකම්වලට සහභාගී නොවන්නේ නම් සහ එසේ නොවන තාක් කල් සිවිල් වැසියන් ප්‍රහාරවලට එරෙහිව ආරක්ෂා කරනු ලැබේ.(අජායුගැ/අජානොයුගැ)

## සිවිල් ඉලක්ක සහ යුදමය අරමුණු අතර වෙනස

**7 වන රීතිය.** ගැටුමට පාර්ශවකරුවන් සියලු ම අවස්ථාවන්වලදී සිවිල් ඉලක්ක සහ යුදමය අරමුණු අතර වෙනස වෙන්කොට හඳුනාගත යුතුය. යුදමය අරමුණුවලට එරෙහිව පමණක් ප්‍රහාර එල්ල කළ හැකිය. සිවිල් ඉලක්කවලට එරෙහිව ප්‍රහාර එල්ල නොකළ යුතුය.(අයුගැ/අජානොයුගැ)

**8 වන රීතිය.** ඉලක්ක පිළිබඳ ව සලකා බලන විට, යුදමය අරමුණු ඒවායේ ස්වභාවය, පිහිටීම, අරමුණ හෝ ප්‍රයෝජනය අනුව යුදමය ක්‍රියාන්විතයට සහ ඒවායේ සමස්ත හෝ අර්ධ විනාශය, ඒවා අත්පත් කර ගැනීම හෝ නිශ්ප්‍රභ කිරීම කෙරෙහි බලාත්මක දායකත්වයක් සලසන තාක් දුරට සහ අදාළ අවස්ථාව පාලනය කරන සාධක අනුව, ස්ථිර යුදමය ජයග්‍රහණයක් දානය කරන ඉලක්කවලට සීමා වේ.(අජායුගැ/අජානොයුගැ)

**9 වන රීතිය.** යුදමය අරමුණු නොවන සියලු ම ඉලක්ක සිවිල් ඉලක්ක වේ.(අජායුගැ/අජානොයුගැ)

**10 වන රීතිය.** සිවිල් ඉලක්ක, යුදමය අරමුණු නොවනතාක් දුරට සහ එසේ නොවන කාලය තුළදී, ප්‍රහාරවලට එරෙහිව ආරක්ෂා කරනු ලැබේ.(අජායුගැ/අජානොයුගැ)

## අවිචාරවත් ප්‍රහාර (ඉවක් බවක් නොමැති ප්‍රහාර)

**11 වන රීතිය.** අවිචාරවත් ප්‍රහාර තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**12 වන රීතිය.** අවිචාරවත් ප්‍රහාර වන්නේ :

(අ) විශේෂිත යුදමය අරමුණු වෙත එල්ල නොකරන ලද ප්‍රහාර ;

(ආ) විශේෂිත යුදමය ඉලක්කයක් වෙත එල්ල කළ නොහැකි ආකාරයේ උපක්‍රම හෝ ක්‍රියාමාර්ග යොදාගෙන එල්ල කරන ප්‍රහාර ; හෝ

(ඇ) ප්‍රහාරයේ ප්‍රතිඵලය අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් අපේක්ෂිත අයුරින් සීමා කළ නොහැකි ආකාරයේ යුද උපක්‍රමයක් හෝ ක්‍රියා මාර්ග යොදා ගෙන එල්ල කරන ප්‍රහාර;

සහ ආනුශංගිකව එබඳු එක් එක් අවස්ථාවන්හි දී එම ප්‍රහාර යුදමය අරමුණු සහ සිවිල් වැසියන්ව හෝ
සිවිල් ඉලක්ක වෙන් කර හඳුනා නොගෙන පහර එල්ල වන ස්වභාවය දරන ප්‍රහාර වේ. (අජායුගැ/අජානොයුගැ)

13 **වන රීතිය.** නගරයක, ගමක හෝ ඒ හා සමාන සිවිල් වැසියන් හෝ සිවිල් ඉලක්ක සංකේන්ද්‍රගත වී ඇති වෙනත් ස්ථානයක පිහිටා තිබෙන පැහැදිලි, වෙන් වෙන් වූ සහ විශේෂිත යුදමය අරමුණු ගණනාවක් එක් යුද අරමුණක් ලෙස සලකමින් බෝම්බ හෙලීම, වෙනත් උපක්‍රම හෝ ක්‍රියාමාර්ග යොදා ගනිමින් සිදුකරන ප්‍රහාර තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

## ප්‍රහාරයේ සමානුපාතිකභාවය

14 **වන රීතිය.** අපේක්ෂිත ස්ථිර සහ ඍජු යුදමය වාසියේ ප්‍රමාණය ඉක්මවන්නා වූ, සිවිල් වැසියන්ගේ ජීවිතවලට ආනුෂංගික හානි සලසන, සිවිල් වැසියන්ට හානි පමුණුවන, සිවිල් ඉලක්කවලට හානි පමුණුවන හෝ ඉහත කරුණු සමස්තය අපේක්ෂා කරමින් දියත් කරන ප්‍රහාරයක් තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

## ප්‍රහාර එල්ල කිරීමේ දී ගත යුතු පූර්වාරක්ෂක පිළිවෙත්

15 **වන රීතිය.** යුදමය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ දී සිවිල් ජනතාව, සිවිල් වැසියන් සහ සිවිල් ඉලක්ක ආරක්ෂා කිරීම සඳහා නිරන්තරව සැලකිලිමත් විය යුතුය. එහිදී ආනුෂංගික සිවිල් ජීවිත අහිමිවීම්, සිවිල් වැසියන්ට තුවාලවීම සහ සිවිල් ඉලක්ක වෙත හානි පැමිණවීම් වැළැක්වීමට සහ හැකි සෑම විටම එවැනි දෑ අවම කර ගැනීම පිණිස ගතහැකි සියලු ම පූර්වාරක්ෂක පියවර ගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)

16 **වන රීතිය.** ඉලක්කයන් යුදමය අරමුණු බව තහවුරු කර ගැනීම පිණිස ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් කළ හැකි සෑම දෙයක්ම කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

17 **වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයන් විසින්, භාවිත කරන යුදමය විධික්‍රම හා මාර්ග තෝරා ගැනීමේ දී ආනුෂංගික සිවිල් ජීවිත අහිමිවීම්, සිවිල් වැසියන්ට තුවාල වීම් සහ සිවිල් ඉලක්කයන්ට වන හානීන් වළක්වා ගැනීමට සහ අවම කර ගැනීමට ගත හැකි සියලු ම පූර්වාක්ෂක පිළිවෙත් අනුගමනය කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

18 **වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් ම, ප්‍රහාරය මගින් ආනුෂංගික සිවිල් ජීවිත අහිමිවීම්, සිවිල් වැසියන්ට තුවාල වීම් හෝ සිවිල් ඉලක්ක වෙත හානි පැමිණවීම් හෝ ඉහත කරුණුවල සමස්තය ආරක්ෂිත ද යන්න සහ එමගින් අපේක්ෂිත ස්ථිර හා ඍජු යුද වාසි ඉක්මවා යනවාදැයි

තක්සේරු කිරීම පිණිස ගත හැකි සියලු ම ක්‍රියාමාර්ග ගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)
**19 වන රීතිය.** ඉලක්කය යුදමය අරමුණක් නොවන බව හෝ ඉන් ළඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රබල සහ ඍජු යුද වාසියට අමතරව ආනුෂංගිකව සිවිල් ජීවිත අහිමි කිරීම, සිවිල් වැසියන්ට තුවාල සිදු කිරීම සහ සිවිල් ඉලක්කයන්ට හානි පැමිණිවීම හෝ ඉහත කරුණුවල සමස්තය සිදුවිය හැකි බව පැහැදිලිව පෙනෙන්නට තිබේ නම්, අදාළ ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් ප්‍රහාරයක් අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට ගත හැකි සියලු ම දේ සිදුකළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)
**20 වන රීතිය.** පවතින තත්ත්වයන් යටතේ අවසර නොලැබෙන්නේ නම් මිස, සිවිල් ජනතාවට බලපෑම් ඇති විය හැකි ප්‍රහාර සම්බන්ධයෙන් ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් ප්‍රහාරයන් පිළිබඳ ව ඵලදායි පූර්ව අනතුරු ඇඟවීම් ලබාදිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)
**21 වන රීතිය.** සමාන යුදමය වාසියක් ලැබෙන යුදමය ඉලක්ක කීපයක් අතරින් තෝරා ගැනීමක් කිරීමට හැකියාව පවතින අවස්ථාවක දී, තෝරාගත යුතු ඉලක්කය වන්නේ, සිවිල් ජීවිතවලට සහ සිවිල් ඉලක්ක වෙත අවම හානියක් සිදුවේ යැයි අපේක්ෂා කරනු ලබන ඉලක්කයි. (අජායුගැ/තාර්කානුකූලව අජානොයුගැ)

## ප්‍රහාරයේ ප්‍රතිඵල වලට එරෙහි පූර්වාරක්ෂාවන්

**22 වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ පාර්ශවයන් විසින් තම පාලනය යටතේ සිටින සිවිල් ජනතාව සහ තමා යටතේ තිබෙන සිවිල් ඉලක්කයන් ප්‍රහාරවල ප්‍රතිඵලවලට එරෙහිව ආරක්ෂා කිරීමට ගත හැකි සෑම පූර්වාරක්ෂාවක්ම ගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)
**23 වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් හැකිතාක් දුරට අධික ජන ඝණත්වයක් සහිත ප්‍රදේශ තුළ හෝ එම ප්‍රදේශවලට ආසන්නයේ යුදමය අරමුණු ස්ථානගත කිරීමෙන් වැළකිය යුතුය. (අජායුගැ/තර්කානුකූලව අජානොයුගැ)
**24 වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් හැකිතාක් දුරට තම පාලනය යටතේ සිටින සිවිල් වැසියන් සහ පවතින සිවිල් ඉලක්ක යුද අරමුණුවලට ආසන්න ප්‍රදේශයෙන් ඉවත් කළ යුතුය. (අජායුගැ/තර්කානුකූලව අජානොයුගැ)

## විශේෂයෙන් ආරක්ෂා කළ යුතු පුද්ගලයන් සහ වස්තූන්

### වෛද්‍ය හා ආගමික කාර්ය මණ්ඩල සහ වස්තූන්

**25 වන රීතිය.** වෛද්‍ය රාජකාරි සඳහාම පමණක් අනුයුක්ත කර තිබෙන වෛද්‍ය කාර්ය මණ්ඩල සියලු ම අවස්ථානුගත තත්ත්වයන් යටතේදී ආරක්ෂා කළ යුතු අතර ඔවුන්ට ගෞරව කිරීම කළ යුතුය. ඔවුන් විසින් තම මානුෂවාදී ක්‍රියාවලින් බැහැරව සතුරන්ට හානිකර ක්‍රියාවන්වල නිරත වේ නම් මෙම ආරක්ෂාව අහිමි කරගනු ලබති. (අජායුගැ/අජානොයුගැ)
**26 වන රීතිය.** වෛද්‍ය ආචාර ධර්මවලට අනුකූලව තම රාජකාරි ඉටුකරන පුද්ගලයෙකුට දඬුවම් කිරීම හෝ වෛද්‍ය කටයුතුවල යෙදී සිටිනා පුද්ගලයෙකුට වෛද්‍ය ආචාර ධර්මවලට පටහැනි ක්‍රියා කිරීමට බල කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)
**27 වන රීතිය.** ආගමික කටයුතු සඳහාම පමණක් අනුයුක්ත කර තිබෙන පූජක කාර්ය මණ්ඩල සියලු ම අවස්ථානුගත තත්ත්වයන් යටතේ දී ආරක්ෂා කළ යුතු අතර ඔවුනට ගෞරව කිරීම කළ යුතුය. ඔවුන් විසින් තම මානුෂවාදී ක්‍රියාවලීන් බැහැර ව සතුරන්ට හානිකර ක්‍රියාවල නිරත වේ නම් ඔවුන් වෙත ලැබෙන මෙම ආරක්ෂාව අහිමි කරගනු ලබති. (අජායුගැ/අජානොයුගැ)
**28 වන රීතිය.** වෛද්‍ය අරමුණු උදෙසා පමණක් අනුයුක්ත කර ඇති වෛද්‍ය ඒකක සියලු ම අවස්ථානුගත තත්ත්වයන් යටතේ දී ආරක්ෂා කළ යුතු අතර ඔවුනට ගරු කිරීම කළ යුතුය. ඔවුන් මානුෂවාදී ක්‍රියාවලීන් බැහැරව කටයුතු කිරීම සඳහා යොදා ගන්නේ නම් හෝ ඔවුන් සතුරාට හානිකර ක්‍රියාවල නිරත වන්නේ නම්, තමන්ට ලැබෙන මෙම ආරක්ෂාව ඔවුහු අහිමි කරගනු ලබති. (අජායුගැ/අජානොයුගැ)
**29 වන රීතිය.** වෛද්‍යමය ප්‍රවාහන කටයුතු සඳහාම පමණක් අනුයුක්ත කර ඇති වෛද්‍ය ප්‍රවාහන මාධ්‍යයන් සියලු ම අවස්ථානුගත තත්ත්වයන් යටතේ දී ආරක්ෂා කළ යුතු අතර, ඒවාට ගරු කිරීම කළ යුතුය. එම ප්‍රවාහන මාධ්‍යයන් මානුෂවාදී ක්‍රියාවලින් බැහැරව සතුරාට හානිකර ක්‍රියා කිරීම සඳහා යොදා ගනියි නම් තමන්ට ලැබෙන ආරක්ෂාව අහිමි කර ගනියි. (අජායුගැ/අජානොයුගැ)
**30 වන රීතිය.** අන්තර්ජාතික නීතියට අනුකූලව ජිනිවා සම්මුතීන්හි අන්තර්ගත විශේෂිත ලාංඡන ප්‍රදර්ශනය කරන වෛද්‍ය හෝ ආගමික කාර්ය මණ්ඩල සහ ඉලක්කවලට එරෙහි ප්‍රහාර තහනම් වේ.(අජායුගැ/අනොයුගැ)

### මානුෂවාදී සහන සේවා සලසන පුද්ගලයන් සහ වස්තූන්

**31 වන රීතිය.**මානුෂවාදී සහන සේවා සලසන පුද්ගලයන්ට ගරු කළ යුතු අතර ඔවුන්ව ආරක්ෂා කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**32 වන රීතිය.** මානුෂවාදී සහන සැලසීමේ මෙහෙයුම් සඳහා භාවිත වන ඉලක්ක වෙත ගරු කළ යුතු අතර ඒවා ආරක්ෂා කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**සාම සාධක මෙහෙයන්හි නිරත පුද්ගලයන් සහ වස්තූන්**

**33 වන රීතිය.** අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ සිවිල් වැසියන්ට සහ සිවිල් ඉලක්කවලට ආරක්ෂාව සපයනු ලබන තාක් දුරට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ප්‍රකාරව සාම සාධක මෙහෙයන්හි නිරත පුද්ගලයන් සහ ඉලක්කවලට එරෙහිව ප්‍රහාරයක් එල්ල කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**මාධ්‍යවේදීන්**

**34 වන රීතිය.** ඍජු ලෙස එදිරිවාදිකම්වලට සහභාගී නොවන තාක් දුරට සන්නද්ධ ගැටුම් පවත්නා ප්‍රදේශවල වෘත්තීය මෙහෙවරයන්හි නිරත වී සිටින සිවිල් මාධ්‍යවේදීන්ට ගරු කළයුතු අතර ඔවුන්ව ආරක්ෂා කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

## ආරක්ෂිත කලාප

**35 වන රීතිය.**තුවාලකරුවන්, රෝගීන් සහ සිවිල් වැසියන්ව සන්නද්ධ ගැටුම්වල ප්‍රතිඵල වලින් ආරක්ෂා කර ගැනීම පිණිස පිහිටුවා ඇති කලාපයන්ට ප්‍රහාර එල්ල කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**36 වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ පාර්ශවයන් යුද මුක්ත කලාපයක් ලෙස එකඟතාවයට පැමිණි කලාප වෙත ප්‍රහාරයක් එල්ල කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**37 වන රීතිය.** ආරක්ෂාව සපයා නොමැති ප්‍රදේශයකට ප්‍රහාරයක් එල්ල කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

## සංස්කෘතිමය දේපළ

**38 වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ සෑම පාර්ශවයක් විසින් ම සංස්කෘතිකමය දේපළවලට ගරු කළ යුතුය.

(අ.) හමුදා මෙහෙයුම්වලදී, යුදමය ඉලක්ක නොවන තාක් දුරට ආගමික, කලා, විද්‍යා, අධ්‍යාපනික හෝ පුණ්‍යමය කටයුතු සඳහා වෙන්කොට තිබෙන ගොඩනැගිලි සහ ඓතිහාසික ස්මාරක වලට සිදුවන හානි

වැළැක්වීම සඳහා ගැටුම්වලට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

(ආ) යුදමය අවශ්‍යතා සඳහා අත්‍යවශ්‍ය නොවන්නේ නම් මිස, සියලු ම පුද්ගලයන්ගේ සංස්කෘතිකමය උරුමයක් වශයෙන් සුවිශේෂිත වැදගත්කමකින් යුතු දේපළ ප්‍රහාරයන්ට ඉලක්ක නොවිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**39 වන රීතිය.**යුදමය අවශ්‍යතා අනුව අත්‍යවශ්‍ය නොවන්නේ නම් මිස, සියලු ම පුද්ගලයන්ගේ සංස්කෘතිමය උරුමයක් වශයෙන් සුවිශේෂිත වැදගත්කමකින් යුතු දේපළ විනාශයට හේතු වන හෝ හානියට පමුණු වන ආකාරයේ අරමුණු සඳහා භාවිතයට ගැනීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**40 වන රීතිය.** ගැටුම්වලට සම්බන්ධ වන සෑම පාර්ශවයක් විසින් ම සංස්කෘතිකමය දේපළ ආරක්‍ෂා කළ යුතුය :

(අ.) ආගමික, පුණ්‍යමය, අධ්‍යාපනික, කලා සහ විද්‍යාවන්ට වෙන් කර ඇති ආයතනයන්, ඓතිහාසික ස්මාරකයන් සහ කලා කෘතීන් හා විද්‍යාත්මක කෘතීන් සම්බන්ධ සියලු ම ආකාරයේ බලෙන් අත්පත් කර ගැනීම්, විනාශ කිරීම් හා චේතනාන්විත හානි කිරීම් තහනම් වේ.

(ආ.) සියලු ම පුද්ගලයන්ගේ සංස්කෘතිකමය උරුමයක් වශයෙන් සුවිශේෂිත වැදගත්කමකින් යුතු දේපළවලට එරෙහිව සිදු කරන ඕනෑම ආකාරයක සොරකම් කිරීමක්, කොල්ලකෑමක් හෝ අයුතු අත්පත් කර ගැනීමක් සහ ඕනෑම ආකාරයක ද්වේශ සහගත විනාශ කිරීම් තහනම් වේ.(අජායුගැ/අජානොයුගැ)

**41 වන රීතිය.** අත්පත් කරගත් දේශ භූමියෙහි පිහිටි සංස්කෘතිකමය දේපළ නීති විරෝධී ලෙස ඉන් බැහැරට ගෙන යාම බලය අත්පත් කරගෙන සිටින පාර්ශවය විසින් වැළැක්විය යුතු අතර එලෙස නීති විරෝධී ලෙස බැහැරට ගෙන යන ලද දේපළ අදාළ අත්පත් කරගත් දේශ භූමියෙහි නිසි බලධාරීන් වෙත නැවත භාරදිය යුතුය. (අජායුගැ)

## අන්තරායදායක බලයන් අන්තර්ගත නිමැවුම් සහ ඉදිකිරීම්

**42 වන රීතිය.** වේලි, කොටු වේලි සහ න්‍යෂ්ටික විද්‍යුත් උත්පාදන බලාගාර සහ අනෙකුත් ඉදිකිරීම් වැනි අන්තරාදායක බලයන් අන්තර්ගත නිමැවුම් සහ ඉදි කිරීම් පිහිටා තිබෙන ස්ථානවල හෝ ඒ හා ආසන්නයේ දී සිදු කරන ප්‍රහාරවලදී අන්තරාදායක බලයන් මුදා හැරීම වැළැක්වීම සහ සිවිල් ජනයා අතර ඇතිවිය හැකි ආනුශංගික බරපතළ හානි වැළැක්වීම සඳහා විශේෂිත අවධානයක් දැරිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

## ස්වාභාවික පරිසරය

**43 වන රීතිය.** එදිරිවාදිකම් පවත්වා ගෙන යාමේදී යෙදෙන ස්වාභාවික පරිසරය පිළිබඳ පොදු මූලධර්ම :

(අ.) යුද ඉලක්කයක් වන්නේ නම් මිස ස්වාභාවික පරිසරයේ කිසිදු කොටසකට ප්‍රහාර එල්ල කළ නොහැකිය.

(ආ) නොවැළැක්විය හැකි යුද අවශ්‍යතා වෙනුවෙන් මිස, ස්වාභාවික පරිසරයේ කිසිදු කොටසක් විනාශ කිරීම තහනම් වේ.

(ඇ) අපේක්ෂිත ස්ථිර සහ ඍජු යුදමය වාසිය ඉක්මවා යන්නා වූ ස්වාභාවික පරිසරයට ආනුශංගික හානි පැමිණිවීම අපේක්ෂා කරමින් යුදමය අරමුණකට එරෙහිව ප්‍රහාරයක් දියත් කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**44 වන රීතිය.** ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් නිසි අවධානයෙන් යුතුව යුද උපක්‍රම සහ ආකාර භාවිත කළ යුතුය. හමුදා මෙහෙයුම් සිදු කිරීමේ දී පරිසරයට සිදුවන ආනුශංගික හානි වැළැක්වීමට සහ ඇතැම් අවස්ථාවන්හිදී අවම කිරීමට ගත හැකි සියලු ම පූර්වාරක්ෂාවන් අනුගමනය කළ යුතුය. නිශ්චිත හමුදා මෙහෙයුමකින් පරිසරය මත උද්ගත වන ප්‍රතිවිපාක පිළිබඳ විද්‍යාත්මක නියතතාවයක් නොමැති වීම ගැටුමට සම්බන්ධ පාර්ශවයන් එබඳු පූර්වාරක්ෂාවන් ගැනීමෙන් මුක්ත නොකරයි. (අජායුගැ/තර්කානුකූලව අජානොයුගැ)

**45 වන රීතිය.** ස්වාභාවික පරිසරයට පැතිරී යන ස්වභාවයේ, දීර්ඝ කාලීන සහ බරපතළ හානි උද්ගත කිරීම අදහස් කරමින් හෝ සිදුවෙතැයි අපේක්ෂා කරමින් යුද උපක්‍රම සහ ආකාර භාවිත කිරීම තහනම් වේ. ස්වාභාවික පරිසරය විනාශ කිරීම ආයුධයක් ලෙස භාවිත නොකළ හැකිවේ.
(අජායුගැ/තර්කානුකූලව අජානොයුගැ)

## විශේෂිත යුද උපක්‍රම

### සමාව දීම ප්‍රතික්ෂෙප කිරීම

**46 වන රීතිය.** කිසිදු සමාවක් නොදිය යුතු බවට නියෝග කිරීම, ඒ බවට විරුද්ධවාදීයෙකුට තර්ජනය කිරීම හෝ මෙම පදනම මත පිහිටා එදිරිවාදිකම්හි නිරත වීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**47 වන රීතිය.** ආයුධ බිම තබා ඇති අයවලුන් සේ හඳුනාගත් තැනැත්තන්ට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම තහනම් වේ.
ආයුධ බිම තබා ඇති අයෙකු නම් :

(අ) සතුරු පාර්ශවයක බලය යටතේ සිටින ඕනෑම තැනැත්තෙකු ;

(ආ) සිහි විසංඥවීම, මුහුදුබත් වීම, තුවාල ලැබීම හෝ රෝගාතුරවීම

හේතුවෙන් අනාරක්ෂිතව සිටින ඕනෑම තැනැත්තෙකු ; හෝ

(ඇ) යටත්වීමේ චේතනාවක් පැහැදිලි ලෙසම ප්‍රකාශ කරන ඕනෑම තැනැත්තෙකු ;පලා යෑමට උත්සාහ නොකරන්නේ නම් සහ කිසිදු එදිරිවාදි ක්‍රියාවකින් වැළකී සිටින්නේ නම් මේ යටතට ගැනේ. (අජායුගැ/අජානොයුගැ)

**48 වන රීතිය.** ආපදාවකදී පැරෂුටයක් මගින් ගුවන්යානාවකින් බිමට බසින තැනැත්තන්ව ඔවුන්ගේ අවරෝහණයේදී ප්‍රහාරයක ඉලක්කය බවට පත් කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

## දේපළ විනාශ කිරීම සහ පරිග්‍රහණය (අත්පත්කර ගැනීම)

**49 වන රීතිය.** ගැටුමට පාර්ශවයන් සතුරු පාර්ශවයට අයත් යුද උපකරණ, යුද ලුංටිනයන් (යුද්ධයෙන් පැහැරගත් දේවල්) ලෙස අත්පත් කරගත හැකිවේ. (අජායුගැ)

**50 වන රීතිය.** අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවය මත උවමනා නොකරන්නේ නම් මිස සතුරෙකු සතු දේපළ විනාශ කිරීම හෝ අත්පත් කර ගැනීම තහනම් වේ.(අජායුගැ/අජානොයුගැ)

**51 වන රීතිය.** අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවය හේතුවෙන් එබඳු දේපළ විනාශ කිරීම හෝ අත්පත් කර ගැනීම අවශ්‍ය කරන විටදී හැර අත්පත් කරගත් දේශ භූමියක් තුළ :

(අ) හමුදා මෙහෙයුම් සඳහා යොදාගත හැකි පොදු චංචල දේපළ රාජසන්තක කළ හැකිය,

(ආ) භුක්තියේ රීතියට යටත්ව පොදු නිශ්චල දේපළ පරිපාලනය කළ යුතුය,

(ඇ) පෞද්ගලික දේපළවලට ගරු කළයුතු අතර රාජසන්තක කළ නොහැකිය. (අජායුගැ)

**52 වන රීතිය.** කොල්ලකෑම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

## නිරාහාරව තැබීම සහ මානුෂවාදී සහන කෙරෙහි ප්‍රවේශය

**53 වන රීතිය.** සිවිල් ජනතාව නිරාහාරව තැබීම යුද උපක්‍රමයක් ලෙස භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**54 වන රීතිය.** සිවිල් ජනතාවගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය දේවල් වලට (ඉලක්ක වලට) ප්‍රහාර එල්ල කිරීම, විනාශ කිරීම, ඉවත් කිරීම හෝ නිෂ්ප්‍රයෝජන බවට පත් කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**55 වන රීතිය.** සන්නද්ධ ගැටුමට පාර්ශවයන් විසින් අපක්ෂපාති ස්වභාවයෙන් යුතු සහ කිසිදු සතුරු ස්වභාවයකින් සිදු නොකරන සිවිල් වැසියන්ට අවශ්‍ය

මානුෂවාදී සහන සැපයුම් මාර්ග සඳහා තම පාලනය පිළිබඳ අයිතියට යටත්ව අවසරදීම සහ පහසුකම් සැලසීම සිදුකළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**56 වන රීතිය.** ගැටුමට සම්බන්ධ පාර්ශවයන් විසින් අවසරලත් මානුෂවාදී සහන සපයන පුද්ගලයන්ට තම කටයුතු සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන යාමේ සහ ඊමේ නිදහස තහවුරු කළ යුතුය. අත්‍යවශ්‍ය යුදමය අවශ්‍යතාවයන්හි දී ඔවුන්ගේ යාම් ඊම් තාවකාලිකව අත්හිටුවිය හැකිය. (අජායුගැ/අජානොයුගැ)

## මුළා කිරීම

**57 වන රීතිය.** අන්තර්ජාතික මානුෂවාදී නීතියේ රීතියක් උල්ලංඝනය නොකරනතාක් දුරට යුද ප්‍රයෝග තහනම් නොවේ. (අජායුගැ/අජානොයුගැ)

**58 වන රීතිය.** යුද විරාමය පිළිබඳ ශ්වේත ධජය අයුතු ලෙස භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**59 වන රීතිය.** ජිනිවා සම්මුතීන්හි අන්තර්ගත විශේෂිත ලාංඡන අයුතු ලෙස භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**60 වන රීතිය.** සංවිධානය විසින් අවසර දී ඇති පරිදි හැර එක්සත් ජාතීන්ගේ ලාංඡනය සහ නිල ඇඳුම් භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**61 වන රීතිය.** අන්තර්ජාතික වශයෙන් පිළිගත් වෙනත් ලාංඡන අයුතු ලෙස භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**62 වන රීතිය.** විරුද්ධවාදියාගේ ධජ හෝ යුද ලාංඡන, අධිකාර චිහ්න හෝ නිල ඇඳුම් අයුතු ලෙස භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ//තර්කානුකූලව අජානොයුගැ)

**63 වන රීතිය.** අපක්ෂපාති හෝ ගැටුමට පාර්ශවයක් නොවන වෙනත් රාජ්‍යයන්ගේ ධජ හෝ යුද ලාංඡන, අධිකාරි චිහ්න හෝ නිල ඇඳුම් භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ/තර්කානුකූලව අජානොයුගැ)

**64 වන රීතිය.** එබඳු එකඟතාවයක් මත විශ්වාසය තබන සතුරා විස්මයට පත්වන ආකාරයට පහරදීම අරමුණු කොට ගෙන යුද ගැටුම අත්හිටුවීම සඳහා එකඟත්වයකට එළඹීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**65 වන රීතිය.** විශ්වාස භංග වන ක්‍රියාවලට යොමුවීම මගින් සතුරකු ඝාතනය කිරීම, තුවාල සිදු කිරීම හෝ අල්ලා ගැනීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

## සතුරා සමග සන්නිවේදනය

**66 වන රීතිය.** ආඥාපතීන්ට (අණදෙන නිලධාරීන්ට) කුමන හෝ සන්නිවේදන මාර්ගයක් මගින් සතුරු නොවන සම්බන්ධතාවලට එළඹිය හැකිය. එබඳු සම්බන්ධතා හොඳ හිත මත පදනම් විය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**67 වන රීතිය.** පණිවුඩකාර සාම නියෝජිතයන් (parlementaires) අලංඝනීය වේ. (අජායුගැ/අජානොයුගැ)
**68 වන රීතිය.** අගතිගාමී වීම වැළැක්වීම සඳහා ආඥාපතීන්ට පණිවුඩකාර සාම නියෝජිතයකුගේ පැමිණීම වැළැක්වීම සඳහා අවශ්‍ය කරන පූර්වාරක්ෂාවන් ගත හැකිය. (අජායුගැ/අජානොයුගැ)
**69 වන රීතිය.** තම වරප්‍රසාද සහිත තත්ත්වයේ වාසිය ලබා ගනිමින් අන්තර්ජාතික නීතියට පටහැනි ක්‍රියාවන් සිදුකරන සහ සතුරාට අනර්ථදායක වන පණිවුඩකාර සාම නියෝජිතයෝ තම අලංඝනීයත්වය අහිමි කර ගනිති. (අජායුගැ/අජානොයුගැ)

## ආයුධ

### ආයුධ භාවිතය පිළිබඳ පොදු සිද්ධාන්තය

**70 වන රීතිය.** වැඩිමනත් හානි හෝ අනවශ්‍ය වද වේදනා පමුණුවන ආකාරයේ යුද උපක්‍රම හෝ ආකාර භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)
**71 වන රීතිය.** වග විභාගයක් නැති ස්වභාවයේ ආයුධ භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

### විෂ

**72 වන රීතිය.** විෂ හෝ විෂ සහිත ආයුධ භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

### ජීව විද්‍යාත්මක ආයුධ

**73 වන රීතිය.** ජීව විද්‍යාත්මක ආයුධ භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

### රසායනික ආයුධ

**74 වන රීතිය.** රසායනික ආයුධ භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**75 වන රීතිය.** කැරැලි මර්දන කාරකයන් යුද උපක්‍රමයක් ලෙස භාවිත කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**76 වන රීතිය.** පහත ස්වරූප ගන්නා අවස්ථාවන්හිදී යුද උපක්‍රමයක් ලෙස පළිබෝධනාශක භාවිතය තහනම් වේ.

(අ ) තහනම් රසායනික ආයුධ බවට පත්වීමේ ස්වභාවයෙන් යුක්ත නම්,

(ආ) තහනම් ජීව විද්‍යාත්මක ආයුධ බවට පත්වීමේ ස්වභාවයෙන් යුක්ත නම්,

(ඇ) යුද අරමුණක් නොවන ශාඛ ප්‍රජාව අරමුණු කොට ගනී නම්,

(ඈ) අපේක්ෂිත ස්ථිර සහ ඍජු යුදමය වාසියට අමතරව සිවිල් වැසියන්ගේ ජීවිතවලට ආනුශංගික හානි සලසන, සිවිල් වැසියන්ට හානි පමුණුවන, සිවිල් ඉලක්කවලට හානි පමුණුවන හෝ ඉහත කරුණුවල සමස්තය අපේක්ෂා කරයි නම්,

(ඉ) ස්වාභාවික පරිසරයට පැතිරි යන, දිගු කාලීන සහ බරපතළ හානි උද්ගත කරයි නම්; (අජායුගැ/අජානොයුගැ)

**ප්‍රසාරණය වන මූනිස්සම්**

**77 වන රීතිය.** මනුෂ්‍ය ශරීරය තුළ පහසුවෙන් ප්‍රසාරණය වන හෝ පැතලි කරවන මූණිස්සම් භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**පුපුරා යන මූණිස්සම්**

**78 වන රීතිය.** මනුෂ්‍ය ශරීරය තුළ පුපුරා යන මූනිස්සම් පුද්ගල නාශක භාවිතයට යොදා ගැනීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**අනාවරණය කරගත නොහැකි කොටස් මගින් මූලික වශයෙන් තුවාල සිදු කරන ආයුධ**

**79 වන රීතිය.** එක්ස් කිරණ මගින් අනාවරණය කරගත නොහැකි කැබලි මගින් මනුෂ්‍ය ශරීරයට තුවාල සිදු කිරීම මූලික ප්‍රතිඵලය වන ආයුධ භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**මර උගුල්**

**80 වන රීතිය.** අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ විශේෂිත රැකවරණය ලැබීමට හිමිකම් ලබන පුද්ගලයන් හෝ ඉලක්ක ආශ්‍රිත හෝ සිවිල් වැසියන් ආකර්ශනය කර ගැනීමට සමත් ආකාරයේ ඉලක්ක ආශ්‍රිත හෝ වෙන කිසියම් හෝ ආකාරයකට ඒවා සමග සම්බන්ධිත මර උගුල් භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**බිම් බෝම්බ**

**81 වන රීතිය.** බිම් බෝම්බ භාවිත කරන විට ඒවායේ ඉවක් බවක් නොමැති ප්‍රතිවිපාක අවම කිරීම සඳහා විශේෂිත අවධානය දැක්විය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**82 වන රීතිය.** හැකිතාක් දුරට ගැටුමට පාර්ශවයන් විසින් බිම් බෝම්බ භාවිත කරන විට ඒවා ස්ථාපිත ස්ථාන වාර්තා ගත කළ යුතුය. (අජායුගැ/තර්කානුකූලව අජානොයුගැ)

**83 වන රීතිය.** සක්‍රිය එදිරිවාදිකම් අවසානයේදී, බිම් බෝම්බ භාවිත කළ ගැටුමට සම්බන්ධ පාර්ශවයන් විසින් ඒවා ඉවත් කිරීම හෝ වෙනත් ආකාරයකින් ඒවා සිවිල් වැසියන්ට හානි රහිත බවට පත් කිරීම හෝ ඒවා ඉවත් කිරීමට පහසුකම් සැලසීම හෝ සිදුකළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**ගිනි අවුලන සුළු ආයුධ**

**84 වන රීතිය.**
යම් හෙයකින් ගිනි අවුලවන සුළු ආයුධ භාවිත කරන්නේ නම්, සිවිල් වැසියන්ගේ ජීවිතවලට සිදුවන ආනුශංගික හානි, සිවිල් වැසියන්ට සිදුවන තුවාල සහ සිවිල් ඉලක්කවලට සිදුවන අලාභ හානි වැළැක්වීමට හෝ යම්කිසි අවස්ථාවකදී අවම කිරීමට විශේෂ අවධානයක් දැක්විය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**85 වන රීතිය.** යම් තැනැත්තෙකු ආයුධ බිම තැබුවෙකු බවට පත් කිරීම සඳහා එයට වඩා හානිදායක බවෙන් අඩු ආයුධයක් භාවිත කිරීම ට අපහසු වන්නේ නම් මිස ගිනි අවුලවන සුළු ආයුධ, පුද්ගල නාශක භාවිතය සඳහා යොදා ගැනීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**අන්ධ කරවන ලේසර් ආයුධ**

**86 වන රීතිය.** (ඇස්) පෙනීම අහිමි කරමින් ස්ථිර වශයෙන්ම අන්ධභාවය ඇති කිරීම එකම යුද කාර්යය වන ලෙස හෝ යුද කාර්යයන්ගෙන් එකක් වන ලෙස විශේෂිතව නිර්මාණය කර තිබෙන ලේසර් ආයුධ භාවිතය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

## සිවිල් වැසියන්ට සහ ආයුධ බිම තබා ඇති තැනැත්තන්ට සැලකීම

### මූලික සුරක්ෂාවන්

**87 වන රීතිය.** සිවිල් වැසියන්ට සහ ආයුධ බිම තබා ඇති තැනැත්තන්ට මානුෂිකව සැලකිය යුතුවේ.
(අජායුගැ/අජානොයුගැ)

**88 වන රීතිය.** වර්ගය, වර්ණය, ලිංග භේදය, භාෂාව, ආගම හෝ විශ්වාස, දේශපාලන හෝ වෙනත් මතය, ජාතික හෝ සාමාජීය සම්භවය, ධනය, උපත හෝ වෙනත් තත්ත්වයන් හෝ ඒ හා සමාන වෙනත් නිර්ණායකයන් පදනම් කොට ගෙන අන්තර්ජාතික මානුෂවාදී නීතිය යෙදීමේදී පීඩාකාරී ලෙස වෙනස් කොට දැක්වීම් කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**89 වන රීතිය.** මිනී මැරුම් තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**90 වන රීතිය.** වද හිංසනය, කුරිරු හෝ අමානුෂික සැලකීම සහ පුද්ගලික ගරුත්වයට සාහසික ලෙස නිගරු පමුණුවන, විශේෂයෙන්ම අමානුෂික සහ අවමන් සහගත සැලකීම් තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**91 වන රීතිය.** ශාරීරික දණ්ඩනය තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**92 වන රීතිය.** අංග ඡේදනය, වෛද්‍ය හෝ විද්‍යාත්මක අත්හදා බැලීම් හෝ පොදුවේ පිළිගත් වෛද්‍ය ප්‍රමිතීන් හා අනුකූල නොවන මෙන්ම පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය මගින් අවශ්‍ය නොකරන අනෙකුත් වෛද්‍ය කාර්ය පටිපාටීන් තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**93 වන රීතිය.** ස්ත්‍රී දූෂණය සහ අනෙකුත් ආකාරවල ලිංගික හිංසනයන් තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**94 වන රීතිය.** සියලුම ආකාරයේ වහල් භාවයන් සහ වහල් වෙළඳාම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**95 වන රීතිය.** වන්දි නොගෙවන ලද හෝ අපයෝජනාත්මක බලහත්කාරී සේවය ගැනීම් තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**96 වන රීතිය.** ප්‍රාණ ඇපකරුවන් ලෙස ගැනීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**97 වන රීතිය.** මිනිස් පලිහක් ලෙස යොදා ගැනීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**98 වන රීතිය.** බලහත්කාර අතුරුදහන් කිරීම් තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**99 වන රීතිය.** නිදහස අත්තනෝමතික ලෙස අහිමි කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**100 වන රීතිය.** සියලු ම අත්‍යවශ්‍ය අධිකරණමය සුරක්ෂාවන් සලසමින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයකින් අනතුරුව මිස කිසිදු අයෙකුව වරදකරු කිරීම හෝ දඬුවම් පැණවීම කළ නොහැකිය. (අජායුගැ/අජානොයුගැ)

**101 වන රීතිය.** යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදු කරන අවස්ථාවේදී දේශීය නීතිය යටතේ හෝ අන්තර්ජාතික නීතිය යටතේ එය අපරාධ වරදක් සංස්ථාපනය නොකරන්නේ නම් කිසිදු අයෙකුට යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් පදනම් කොට ගනිමින් අපරාධ වරදක් සම්බන්ධයෙන් චෝදනා නැගීම හෝ වරදකරු කිරීම නොකළ හැකිය. අපරාධ වරද සිදුකළ අවස්ථාවේ දී අදාළ වූ දඬුවමට වඩා බරපතළ දඬුවමක් පැනවීම නොකළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**102 වන රීතිය.** තනි පුද්ගල අපරාධනීය වගකීම පිළිබඳ පදනම මත මිස කිසිදු තැනැත්තෙකුව වරදක් සම්බන්ධයෙන් වරදකරු කළ නොහැකිය. (අජායුගැ/අජානොයුගැ)

**103 වන රීතිය.** සාමූහික දඬුවම් පැමිණවීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**104 වන රීතිය.** සිවිල් වැසියන්ගේ සහ ආයුධ බිම තබා ඇති තැනැත්තන්ගේ විශ්වාසයන්ට සහ ආගමික පරිචයන්ට ගරු කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**105 වන රීතිය.** පවුල් ජීවිතයට හැකිතාක් දුරට ගරු කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

## සටන් කරුවන් සහ යුද සිරකාර තත්ත්වය

**106 වන රීතිය.** ප්‍රහාරයකට සූදානම් වෙමින් සිදු කරන හමුදා මෙහෙයුමකදී හෝ ප්‍රහාරයක නිරත වී සිටින අවස්ථාවකදී යුද භටයන් තමන්ව සිවිල් ජනතාවගෙන් වෙන් කොට දක්විය යුතුය. එසේ කිරීමට අසමත් වන්නේ නම් ඔවුහු යුද සිරකාර තත්ත්වයට අයිතිවාසිකම් නොලබති. (අජායුගැ)

**107 වන රීතිය.** චර පුරුෂ සේවයේ යෙදී සිටින අවස්ථාවේදී අල්ලා ගනු ලැබූ යුද භටයෝ යුද සිරකාර තත්ත්වයට අයිතිවාසිකම් නොලබති. පූර්ව නඩු විභාගයකින් තොරව ඔවුන්ව වැරදිකරුවන් කිරීම හෝ දඬුවම් කිරීම නොකළ හැකිය. (අජායුගැ)

**108 වන රීතිය.** කුලී හේවායෝ පළමු සන්ධානයේ අර්ථ නිරූපනය කර ඇති පරිදි යුද සිරකාර තත්ත්වයට හෝ යුද භටයා යන තත්ත්වයට අයිතිවාසිකම් නොලබති. පූර්ව නඩු විභාගයකින් තොරව ඔවුන්ව වැරදිකරුවන් කිරීම හෝ දඬුවම් කිරීම නොකළ හැකිය. (අජායුගැ)

### තුවාල ලත්, රෝගාතුර වූ සහ මුහුදුබත් වූවන්

**109 වන රීතිය.** අවස්ථානුගත සාධක ඉඩ සලසන ඕනෑම විටෙකදී, විශේෂයෙන්ම යුද ක්‍රියාන්විතයකින් අනතුරුව ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවය ප්‍රමාදයකින් තොරව තුවාල ලත්, රෝගාතුර වූ සහ මුහුදු බත් වූවන් සොයා ගැනීමට, එකතු කර ගැනීමට සහ ඉවත් කිරීමට කිසිදු අනිසි වෙන්

කොට දැක්වීමකින් තොරව ගත හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**110 වන රීතිය.** ඔවුන්ගේ තත්ත්වයට අනුව අවශ්‍ය කරන වෛද්‍ය රැකවරණය සහ අවධානය හැකි අවම බාධාවන් සහිතව සම්පූර්ණයෙන්ම ප්‍රායෝගික ප්‍රමාණයට තුවාල ලත්, රෝගාතුර වූ සහ මුහුදු බත් වූවන් වෙත ලැබිය යුතුය. වෛද්‍යමය කරුණු හැර වෙනත් කිසිදු පදනමක් මත ඔවුන් අතර කිසිදු වෙනස්කමක් සිදු නොකළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**111 වන රීතිය.** ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවකරුවන් විසින් තුවාල ලත්, රෝගාතුර වූ සහ මුහුදුබත් වූ තැනැත්තන්ව, ඔවුන්ට පීඩා කිරීමට සහ ඔවුන්ගේ පුද්ගලික දේපළ කොල්ලකෑමට එරෙහිව ආරක්ෂා කිරීමට හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**මිය ගිය අය**

**112 වන රීතිය.** අවස්ථානුගත තත්ත්වයන් ඉඩ සලසන ඕනෑම විටෙකදී, විශේෂයෙන්ම යුද ක්‍රියාන්විතයකින් පසුව, ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් ප්‍රමාදයකින් තොරව මිය ගිය තැනැත්තන් සෙවීමට, එකතු කිරීමට සහ ඉවත් කිරීමට කිසිදු අනිසි වෙන්කොට දැක්වීමකින් තොරව ගත හැකි සියලු ම ක්‍රියාමාර්ග ගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**113 වන රීතිය.** ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවයන් විසින් මිය ගිය තැනැත්තන් පැහැර ගැනීම වැළැක්වීම සඳහා ගත හැකි සියලු ම ක්‍රියාමාර්ගයන් ගත යුතුය. මෘත ශරීරවල අංග ඡේදනය කිරීම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**114 වන රීතිය.** ගැටුමට පාර්ශවයන් මිය ගිය තැනැත්තන්ගේ අවශේෂ ආපසු භාරදීම සඳහා ඔවුන් අයත් පාර්ශවයේ හෝ ඔවුන්ගේ ආසන්නතම ඥාතියාගේ ඉල්ලීම මත පහසුකම් සැපයීමට පියවර ගත යුතුය. ඔවුන් මියගිය තැනැත්තන්ගේ පුද්ගලික දේපළ ද ආපසු භාරදිය යුතුය. (අජායුගැ)

**115 වන රීතිය.** මිය ගිය තැනැත්තන්ව ගෞරව සම්ප්‍රයුක්තව බැහැර කළ යුතු අතර ඔවුන්ගේ සොහොන්වලට ගරු කිරීම සහ නිසි අයුරින් නඩත්තු කිරීම කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**116 වන රීතිය.** මිය ගිය තැනැත්තාව හඳුනාගැනීමේ අපේක්ෂාවෙන් යුතුව ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවයක් විසින් ඔවුන්ව බැහැර කිරීමට පෙරාතුව පවතින සියලු ම තොරතුරු වාර්තාගත කළයුතු අතර ඔවුන්ගේ සොහොන් පිහිටි ස්ථානය සළකුණු කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**අතුරුදහන්වූ තැනැත්තන්**

**117 වන රීතිය.** ගැටුමට සම්බන්ධ එක් එක් පාර්ශවයන් විසින් නැති වූ තැනැත්තන් ලෙස වාර්තා වූ අය පිළිබඳ ව සොයා බැලීමට ගත හැකි සියලු ම ක්‍රියාමාර්ග ගත යුතු අතර ඔවුන්ගේ ඉරණම පිළිබඳ ව ඔවුන් සතු යම් තොරතුරක් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට සැපයිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**නිදහස අහිමි කරන ලද තැනැත්තන්**

**118 වන රීතිය.** තම නිදහස අහිමි කරන ලද තැනැත්තන්ට ප්‍රමාණවත් පරිදි ආහාර, ජලය, ඇඳුම් පැළඳුම්, වාසස්ථාන සහ වෛද්‍ය අවධානය සැපයිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**119 වන රීතිය.** පවුල් ඒකක ලෙස පවුල්වලට නවාතැන් සපයා ඇති අවස්ථාවලදී හැර නිදහස අහිමි කරන ලද කාන්තාවන්ව එබඳුම තත්ත්වයේ සිටින පුරුෂයන් ගෙන් වෙන්වූ වාසස්ථානවල නවතා තැබිය යුතු අතර ඔවුන්ව කාන්තාවන්ගේ සමීප අධීක්ෂණය යටතේ තැබිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**120 වන රීතිය.** පවුල් ඒකක ලෙස පවුල්වලට නවාතැන් සපයා ඇති අවස්ථාවලදී හැර නිදහස අහිමි කරන ලද ළමුන්ව එබඳුම වැඩිහිටියන් ගෙන් වෙන්වූ වාසස්ථානවල නවතා තැබිය යුතුය.(අජායුගැ/අජානොයුගැ)

**121 වන රීතිය.**නිදහස අහිමි කරන ලද තැනැත්තන්ව සන්නද්ධ ගැටුම් කලාපවලින් දුරස්ථව පිහිටි පරිශ්‍රවල ඔවුන්ගේ සෞඛ්‍යය සහ ස්වස්ථතාවය ආරක්ෂා වන පරිදි රඳවා තැබිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**122 වන රීතිය.** නිදහස අහිමි කරන ලද තැනැත්තන්ට අයත් පෞද්ගලික දේවල් කොල්ලකෑම තහනම් වේ. (අජායුගැ/අජානොයුගැ)

**123 වන රීතිය.** නිදහස අහිමි කරන ලද තැනැත්තන්ගේ පෞද්ගලික විස්තර වාර්තාගත කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**124 වන රීතිය.**

(අ) අන්තර්ජාතික සන්නද්ධ ගැටුමකදී නිදහස අහිමි කරන ලද තැනැත්තන්ගේ රඳවා තැබීම් හි සත්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සහ එම තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සම්බන්ධතා නැවත ගොඩනැගීම සඳහා අන්තර්ජාතික රතු කුරුස සංවිධානයට නිදහස අහිමි කරන ලැබූ සියලු ම තැනැත්තන් වෙත නිරන්තරව ප්‍රවේශ වීමට ඉඩ සැලසිය යුතුය. (අජායුගැ)

(ආ) අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වලදී, අන්තර්ජාතික රතු කුරුස සංවිධානය විසින් ගැටුමට සම්බන්ධ හේතූන් මත නිදහස අහිමි කරනු ලැබූ තැනැත්තන්ව හමුවීමේ අරමුණින් ඔවුන්ගේ රඳවා තැබීම් හි තත්ත්වය පරීක්ෂා කිරීම සහ එම තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ

පවුල්වල සම්බන්ධතා නැවත ගොඩනැගීම සඳහා තම සේවාවන් ගැටුමට පාර්ශවකරුවන් වෙත පිරිනැමිය හැකිය. (අජානොයුගැ)

**125 වන රීතිය.** පැහැර ගන්නා ලද සහ බලධාරීන් විසින් වාරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සාධාරණ කොන්දේසීන්වලට යටත්ව නිදහස අහිමි කරනු ලැබූ තැනැත්තන් හට ඔවුන්ගේ පවුල් සමග ගත කිරීමට අවසර ලබාදිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**126 වන රීතිය.** අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක් සම්බන්ධයෙන් රඳවා ගනු ලැබූ සිවිල් වැසියන්ට සහ නිදහස අහිමි කරනු ලැබූ තැනැත්තන්ට විශේෂයෙන්ම ආසන්න ඥාතීන් ඇතුලු අමුත්තන් පිළිගැනීමට හැකි ප්‍රායෝගික ප්‍රමාණයට අවසර දිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**127 වන රීතිය.** නිදහස අහිමි කරනු ලැබූ තැනැත්තන්ගේ පුද්ගලික විශ්වාසයන්ට සහ ආගමික පරිචයන්ට ගරු කළ යුතුය.(අජායුගැ/අජානොයුගැ)

**128 වන රීතිය.**

(අ) සක්‍රිය එදිරිවාදිකම් අවසාන වීමෙන් අනතුරුව ප්‍රමාදයකින් තොරව යුද සිරකරුවන්ව නිදහස් කොට නැවත සිය රටට පැමිණ විය යුතුය. (අජායුගැ)

(ආ) සක්‍රිය එදිරිවාදිකම් නැවතීමෙන් පසුව සමාරෝධිත (රඳවා ගත්) සිවිල් වැසියන්ව ඔවුන් එසේ සමාරෝධනය කිරීමට (යුද කාලයේ රඳවා ගැනීමට) හේතු වූ කරුණු තවදුරටත් නොපවතී නම් හැකි පළමු අවස්ථාවේදීම නිදහස් කළ යුතුය. (අජායුගැ)

(ඇ) අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක් හේතුවෙන් නිදහස අහිමි කරනු ලැබූ තැනැත්තන්ව එසේ ඔවුන්ගේ නිදහස අහිමි කිරීමට හේතු වූ කරුණු අවසාන වීමත් සමග හැකි විගසින් නිදහස් කළ යුතුය. (අජානොයුගැ)

ඉහත සඳහන් පුද්ගලයන්ට එරෙහිව තවදුරටත් දණ්ඩන/ අධිකරණමය කටයුතු පැවතීමට නියමිත විට හෝ නීත්‍යානුකූලව ඔවුන් වෙත පමුණුවන ලද දඬුවමක් භුක්ති විඳිමින් සිටින්නේ නම් හෝ ඔවුන්ගේ නිදහස තවදුරටත් අහිමි කිරීම සිදුවිය හැකිය.

## අවතැන්වීම සහ අවතැන් වූ පුද්ගලයන්

**129 වන රීතිය.**

(අ) සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සම්බන්ධ වන විට හෝ අත්‍යවශ්‍ය යුදමය හේතුන් එලෙස අපේක්ෂා නොකරන්නේ නම් අන්තර්ජාතික සන්නද්ධ ගැටුමකට පාර්ශවකරුවන් විසින් අත්පත් කරගත් දේශ භූමියක සිටින සිවිල් ජනතාව මුළුමනින්ම හෝ කොටස් වශයෙන් පිටුවහල් කිරීම හෝ බලහත්කාරයෙන් මාරු කර යැවීම නොකළ හැකිය. (අජායුගැ)

(ආ) සිවිල් වැසියන් ගේ ආරක්ෂාව සම්බන්ධ වන විට හෝ අත්‍යවශ්‍ය යුදමය හේතුන් එලෙස අපේක්ෂා නොකරන්නේ නම් අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක පාර්ශවකරුවන් විසින් සිවිල් ජනතාව මුළුමනින්ම හෝ කොටස් වශයෙන් ගැටුමට සම්බන්ධ හේතුන් මත අවතැන් කිරීම සඳහා නියෝග නොකළ හැකිය. (අජානොයුගැ)

**130 වන රීතිය.** රාජ්‍යයන් විසින් තමන්ගේ අත්පත් කරගත් දේශ භූමියක් වෙත තමන්ගේම සිවිල් ජනතාවගෙන් කොටස් පිටුවහල් කිරීම හෝ මාරුකර යැවීම නොකළ හැකිය. (අජායුගැ)

**131 වන රීතිය.** අවතැන්වීම සිදුවී තිබෙන විටදී අදාළ සිවිල් වැසියන්ට සතුටුදායක තත්ත්වයන් යටතේ වාසස්ථාන, ස්වස්ථතාවය, සෞඛ්‍යය, ආරක්ෂාව සහ පෝෂණය ලබාදීමට සහ එකම පවුලේ සාමාජිකයන් වෙන් නොකිරීමට හැකි සියලු ම පියවරයන් ගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**132 වන රීතිය.** සිය අවතැන්වීම පැවතීම අවසාන වනවාත් සමග ම අවතැන් වූ තැනැත්තන් හට සිය නිවාස හෝ පුරුදු වාසස්ථාන පිහිටි ස්ථානවලට ආරක්ෂිතව ස්වේච්ඡාවෙන් ආපසු යාම සඳහා අයිතියක් පවතී. (අජායුගැ/අජානොයුගැ)

**133 වන රීතිය.** අවතැන් වූවන්ගේ දේපළ අයිතීන් වලට ගරු කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

## විශේෂිත ආරක්ෂාව සලසන ලද අනෙකුත් තැනැත්තන්

**134 වන රීතිය.** සන්නද්ධ ගැටුම්වලින් පීඩාවට පත් කාන්තාවන් ගේ විශේෂිත ආරක්ෂාව, සෞඛ්‍යය සහ සහනාධාර අවශ්‍යතාවලට ගරු කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**135 වන රීතිය.** සන්නද්ධ ගැටුම්වලින් පීඩාවට පත් ළමුන් විශේෂිත ආදර ගෞරවයට සහ ආරක්ෂාවට හිමිකම් ලබති. (අජායුගැ/අජානොයුගැ)

**136 වන රීතිය.** ළමුන්ව සන්නද්ධ හමුදාවන්ට හෝ සන්නද්ධ කණ්ඩායම්වලට බඳවා නොගත යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**137 වන රීතිය.** එදිරිවාදිකම්වලට සහභාගී වීමට ළමුන්ට අවසර නොදිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**138 වන රීතිය.** සන්නද්ධ ගැටුම්වලින් පීඩාවට පත් වැඩිහිටියන්, ආබාධිත තැනැත්තන් සහ බෙලහීන වූවන් විශේෂිත ආදර ගෞරවයට සහ ආරක්ෂාවට හිමිකම් ලබති. (අජායුගැ/අජානොයුගැ)

## ක්‍රියාත්මක කිරීම

### අන්තර්ජාතික මානුෂවාදී නීතියට අවනත වීම

**139 වන රීතිය.** ගැටුමේ එක් එක් පාර්ශවය තම සන්නද්ධ හමුදා සහ එහි උපදෙස් අනුව හෝ එහි මගපෙන්වීම හෝ පාලනය යටතේ ක්‍රියා කරන අනෙකුත් තැනැත්තන් සහ කණ්ඩායම් අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීම සහ එසේ ගරු කරන බව තහවුරු කළ යුතුය. (අජායුගැ/අජානොයුගැ)
**140 වන රීතිය.** අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීම සහ ගරු කරන බව තහවුරු කිරීමේ බැඳීම් සහගත භාවය උභයභාවත්වය (අන්‍යෝන්‍යතාව) මත රඳා නොපවතියි. (අජායුගැ/අජානොයුගැ)
**141 වන රීතිය.** එක් එක් රාජ්‍යයන් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීතියේ යෙදුම පිළිබඳ ව යෝග්‍ය මට්ටම්වල සිටින හමුදා ආඥාපතීන්ට අවශ්‍ය විටදී උපදෙස් ලබාදීම සඳහා නීති උපදේශකයන් සේවයේ යෙදවිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)
**142 වන රීතිය.** රාජ්‍යයන් සහ ගැටුමට පාර්ශවකරුවන් තම සන්නද්ධ හමුදාවන්ට අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ උපදෙස් සැපයිය යුතු වේ. (අජායුගැ/අජානොයුගැ)
**143 වන රීතිය.** සිවිල් ජනතාවට අන්තර්ජාතික මානුෂවාදී නීතිය ඉගැන්වීම සඳහා රාජ්‍යයන් විසින් අනුබල දිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

### අන්තර්ජාතික මානුෂවාදී නීතිය බලාත්මක කිරීම

**144 වන රීතිය.** රාජ්‍යයන්, සන්නද්ධ ගැටුමක පාර්ශවයන් විසින් අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනය සිදු කිරීමට අනුබල නොදිය හැකිය. ඔවුහු තම බලපෑම හැකිතාක් දුරට අන්තර්ජාතික මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම නැවැත්වීම සඳහා යෙදිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)
**145 වන රීතිය.** අන්තර්ජාතික නීතිය විසින් තහනම් කර නොමැති විට සංග්‍රාමික පළිගැනීම් (ප්‍රතිප්‍රහාර) තහනම් වේ. (අජායුගැ)
**146 වන රීතිය.** ජිනිවා සම්මුතීන් මගින් ආරක්ෂා කරන තැනැත්තන්ට එරෙහිව සංග්‍රාමික පළිගැනීම් තහනම් වේ. (අජායුගැ)
**147 වන රීතිය.** ජිනිවා සම්මුතීන් සහ සංස්කෘතික සම්මුතීන් මගින් ආරක්ෂා කරන ඉලක්ක/අරමුණුවලට එරෙහි පළිගැනීම් තහනම් වේ. (අජායුගැ)
**148 වන රීතිය.** අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක පාර්ශවයන් හට සංග්‍රාමික පළිගැනීම් වලට යොමුවීම සඳහා අයිතියක් නොපවතියි. එදිරිවාදිකම්වලට සෘජුව සම්බන්ධ නොවන හෝ සම්බන්ධවීම අවසන් කොට ඇති තැනැත්තන්ට එරෙහිව අනෙකුත් ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ග ගැනීම තහනම් වේ. (අජානොයුගැ)

**වගකීම සහ හානි පූරණය**

**149 වන රීතිය.** පහත සඳහන් දේ ඇතුළුව තමන් වෙත ආරෝපණය කළ හැකි අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් සම්බන්ධයෙන් රාජ්‍යයක් වගකීමට බැඳෙයි :

(අ) තම සන්නද්ධ හමුදාවන් ඇතුලුව තමන්ගේ අංශයන් විසින් සිදුකරන ලද උල්ලංඝනයන් ;

(ආ) ආණ්ඩුවේ බලාධිකාරියේ මූලාංග ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍යය විසින් බලය පවරන ලද තැනැත්තන් හෝ ඒකකයන් විසින් සිදු කරන ලද උල්ලංඝනයන් ;

(ඇ) සැබැවින්ම රාජ්‍යයේ උපදෙස් හෝ එහි මග පෙන්වීම හෝ පාලනය යටතේ කටයුතු කරමින් තැනැත්තන් හෝ කණ්ඩායම් විසින් සිදු කරන ලද උල්ලංඝනයන් ; සහ

(ඈ) තම හැසිරීම් ලෙස රාජ්‍යය විසින් පිළිගන්නා සහ භාරගනු ලබන පෞද්ගලික තැනැත්තන් හෝ කණ්ඩායම් විසින් සිදු කරන ලද උල්ලංඝනයන් (අජායුගැ/අජානොයුගැ)

**150 වන රීතිය.** අන්තර්ජාතික මානුෂවාදී නීති උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍යයක් හටගත් හානි හෝ පීඩා සම්බන්ධයෙන් පූර්ණ හානි පූර්ණයක් සිදුකිරීම අවශ්‍ය වේ. (අජායුගැ/අජානොයුගැ)

**තනි පුද්ගල වගකීම**

**151 වන රීතිය.** තනි පුද්ගලයෝ තමන් විසින් සිදු කරන ලද යුද අපරාධ සම්බන්ධයෙන් අපරාධනීය වගකීම දරති. (අජායුගැ/අජානොයුගැ)

**152 වන රීතිය.** ආඥාපතීහු සහ අනෙකුත් ප්‍රධානීහු තම ආඥාවන්ට අනුව සිදුකළ යුද අපරාධ සම්බන්ධයෙන් අපරාධනීය වගකීම දරති. (අජායුගැ/අජානොයුගැ)

**153 වන රීතිය.** තමන්ගේ යටත් නිලධාරීන් යුද අපරාධ සිදු කරමින් සිටි බව හෝ කිරීමට සූදානම් ව සිටි බව දැන සිටියේ නම් හෝ දැන ගැනීමට හේතු පැවතියේ නම් හෝ ආඥාපතීහූ සහ අනෙකුත් ප්‍රධානීහු තම යටත් නිලධාරීන් විසින් සිදු කළ යුද අපරාධ සම්බන්ධයෙන් සහ තම බලය අනුව එබඳු අපරාධ සිදුවීම වැළැක්වීම සඳහා හෝ එබඳු අපරාධ සිදුකර තිබුණේ නම් වගකිව යුතු තැනැත්තන්ට දඬුවම් පැමිණවීමට අත්‍යවශ්‍ය සියලු ම සාධාරණ පියවර නොගත්තේ නම් අපරාධ වගකීමෙන් බැඳෙති. (අජායුගැ/අජානොයුගැ)

**154 වන රීතිය.** පැහැදිළිව ම නීති විරෝධි ආඥාවකට අකීකරු වීමට සෑම යුද භටයෙකුටම යුතුකමක් පවතී. (අජායුගැ/අජානොයුගැ)

**155 වන රීතිය.** නියෝග කළ ක්‍රියාව නීති විරෝධි බව දන සිටියේ නම් සහ නියෝග කළ ක්‍රියාවේ පැහැදිලි නීති විරෝධි ස්වරූපය හේතුවෙන් ඒ බව දන සිටිය යුතුව තිබුණි නම් ප්‍රධානියා ගේ ආඥාවට අවනත වීම හේතුවෙන් යටත් නිලධාරියෙකුව අපරාධ වගකීමෙන් මුදවනු නොලබයි. (අජායුගැ/අජානොයුගැ)

## යුද අපරාධ

**156 වන රීතිය.** අන්තර්ජාතික මානුෂවාදී නීතියේ බරපතල උල්ලංඝනයන් යුද අපරාධ සංස්ථාපනය කරයි. (අජායුගැ/අජානොයුගැ)

**157 වන රීතිය.** තම දේශීය අධිකරණය තුළ දී යුද අපරාධ කෙරෙහි විශ්වමය අධිකරණ බලය පැවරීමට රාජ්‍යයන්ට අයිතිවාසිකම් පවතියි. (අජායුගැ/අජානොයුගැ)

**158 වන රීතිය.** රාජ්‍යයෝ තම දේශ භූමිය තුළ හෝ තම ජාතිකයන් හෝ සන්නද්ධ හමුදාවන් විසින් සිදුකළ බවට චෝදිත යුද අපරාධ විමර්ශනය කළ යුතු අතර, උචිත පරිදි සැකකරුවන්ට අභිචෝදනා කළ යුතුය. එසේම තමන් සතුව අධිකරණ බලය පවතින අනෙකුත් යුද අපරාධ ද ඔවුන් විසින් විමර්ශනය කළයුතු අතර උචිත පරිදි සැකකරුවන්ට නඩු පැවරිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

**159 වන රීතිය.** එදිරිවාදිකම් අවසානයේ දී යුද අපරාධ සඳහා දඬුවම් පමුණුවන ලද හෝ චෝදිත හෝ සැක කරනු ලැබූ තැනැත්තන් හැර අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමකට සහභාගි වූ තැනැත්තන් හෝ සන්නද්ධ ගැටුමට සම්බන්ධ හේතු මත නිදහස අහිමි කරනු ලැබූවන් වෙත හැකි පුළුල් ම පොදු සමාව පිරිනැමීමට බලයේ සිටින අධිකාරීහු පියවර ගත යුතුය. (අජානොයුගැ)

**160 වන රීතිය.** සීමාවන් සහිත ව්‍යවස්ථාවන් යුද අපරාධවලට යෙදිය නොහැකිය.(අජායුගැ/අජානොයුගැ)

**161 වන රීතිය.**යුද අපරාධ විමර්ශනය කිරීමට පහසුකම් සැලසීම සහ සැකකරුවන්ට නඩු පැවරීම සඳහා හැකිතාක් දුරට රාජ්‍යයන් එකිනෙකා සමග සහයෝගයෙන් කටයුතු කිරීමට සියලු ම පරිශ්‍රමයන් දැරිය යුතුය. (අජායුගැ/අජානොයුගැ)

ICRC- ජාත්‍යන්තර රතු කුරුස කමිටුව | 29, ලෙයාඩ්ස් පාර කොළඹ 5
ශ්‍රී ලංකාව || දු.ක. +94-11-2503346 | www.icrc.org